# රණවිරුවා

2025 ජූනි • 277 කලාපය






## භාරතයෙන් බුහුමන් ලැබූ වගයි

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.

# 08 වන ඉන්දු - ශ්‍රී ලංකා ආරක්ෂක සංවාදය කොළඹදී

ඉන්දු - ශ්‍රී ලංකා ආරක්ෂක සංවාදය ජුනි මස 05 වන දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේදී පැවැත්විණි. ශ්‍රී ලංකා දූත පිරිස ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය), එස්එන්ඩීයූ (චීනය), පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් එක්වූ මෙම සංවාදය සඳහා ඉන්දීය ආරක්ෂක ලේකම් Rajesh Kumar Singh ප්‍රමුඛ දූත පිරිසක් සහභාගි වූහ.



ද්විපාර්ශ්වික ආරක්ෂක සහයෝගීතාව ශක්තිමත් කිරීම, සමුද්‍රීය ආරක්ෂාව වැඩිදියුණු කිරීම සහ පුහුණුවීම් මෙන්ම උපායමාර්ගික කටයුතු යන ක්ෂේත්‍රවල සහයෝගීතාව ඉහළ නැංවීම වෙනුවෙන් නව මාර්ගයන් හඳුනාගැනීම වැනි අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි මෙම සංවාදයෙහි විශේෂ අවධානය යොමු විය. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පවතින දිගුකාලීන ආරක්ෂක හවුල්කාරිත්වය යළිත් තහවුරු කරමින් දෙපාර්ශ්වයේම ජ්‍යෙෂ්ඨ නිලධාරිහු මෙම ආරක්ෂක සංවාදය සඳහා සහභාගි වූහ. ඊට සමගාමීව ඉන්දීය ආරක්ෂක ලේකම්වරයා නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය මේජර් ජෙනරාල් අරුණ ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ද හමුවිය.



# ඉන්දු - ලංකා මිත්‍රත්ව පුස්තකාලය විවෘත කෙරේ





ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමේ සහ අධ්‍යයන හා සංස්කෘතික හුවමාරුව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී ඉන්දු-ලංකා මිත්‍රත්ව පුස්තකාලය 2025 ජුනි මස 06 වන දින විවෘත කෙරිණ. මෙම උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිතයින් ලෙස ඉන්දීය ආරක්ෂක ලේකම් Mr. Shri Rajesh Kumar Singh සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගි වූහ.

එහිදී, නවතමයෙන් ඉදිකරන ලද අශ්ව ප්‍රතිමාව නිල වශයෙන් නිරාවරණය කිරීම ද ඉන් අනතුරුව ඉන්දු-ලංකා මිත්‍රත්ව පුස්තකාලය විවෘත කිරීම ද ආරාධිතයින් විසින් සිදුකළහ. පසුව ඔවුන් කෙඩෙට් නිලධාරීන්ගේ අධ්‍යයන කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් ආරම්භ කරනු ලැබූ පුස්තකාල අංශයේ නිරීක්ෂණ චාරිකාවක ද නිරත වෙමින් කෙඩෙට් නිලධාරින් සමඟින් සුහදව අදහස් හුවමාරු කරගැනීමට ද අමතක නොකළහ. මෙම අවස්ථාව සනිටුහන් කිරීම සඳහා යුද්ධ හමුදාධිපති සහ සහභාගී වූ සම්භාවනීය අමුත්තන් අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදුවිය.



# නාවික හමුදාධිපති යුද්ධ හමුදා මූලස්ථානයේ නිල සංචාරයක

ශ්‍රී ලංකා නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් බීජ්කේඑස්පී බානගොඩ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ජුනි මස 25 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී හමුවිය. එහිදී, යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී හමුදා භටපිරිස් වෙතින් හිමිවූයේ ගෞරවනීය පිළිගැනුමකි.



පසුව, යුද්ධ හමුදාධිපති සමඟ පැවති සුහද පිළිසඳරේදී අන්‍යොන්‍ය වශයෙන් වැදගත්වන කරුණු රැසක් පිළිබඳව සාකච්ඡා කෙරිණ. ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීමේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ නාවික හමුදාව වෙතින් ඉටුකරන වැදගත් කාර්යභාරයන් පිළිබඳව එහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමුකෙරිණි. හමුදාවන් අතර පවතින සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම, ඒකාබද්ධ මෙහෙයුම් සූදානම වැඩිදියුණු කිරීම, උපායමාර්ගික සම්පත් බෙදාගැනීම සහ සමුද්‍රීය හා ගොඩබිම් ආරක්ෂක මෙහෙයුම්වල සහයෝගීතාව පුළුල් කිරීම පිළිබඳව ද ඔවුහු අදහස් හුවමාරු කරගත්හ.

# ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේ දස්කම් දැක්වූවන් ඇගයේ







දකුණු කොරියාවේ ගුමි හි පැවති 26 වන ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේදී මෙරට නියෝජනය කරමින් කැපී පෙනෙන දක්ෂතා දැක්වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් ඉකුත් ජුනි මස 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපතිගේ පැසසුමට ලක්විය.

ක්‍රීඩිකාවන් පස් දෙනෙක් සහ ක්‍රීඩකයින් හය දෙනෙක්ගෙන් සමන්විත ශ්‍රී ලංකා යුද්ධ හමුදා මලල ක්‍රීඩා කණ්ඩායම එම ජයග්‍රහණවලට හිමිකම් කියූහ. එහිදී, 2 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ මාණ්ඩලික සැරයන් නදීෂා ආර් සහ කාන්තා සෙබළ උත්තරා එම්එච්ජේ කාන්තා මීටර් 4x400 සහය දිවීමේ ඉසව්වෙන් ලෝකඩ පදක්කම් දිනාගැනීම, 2 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ලාන්ස් කෝප්‍රල් විජේසූරිය ඩබ්ලිව්ජ්එම්ආර් මීටර් 10,000 ධාවන ඉසව්වෙන් 6 වන ස්ථානයට පත්වෙමින් නව ජාතික වාර්තාවක් පිහිටුවීම, 2 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ බලලත් නිලධාරී II කුමාරගේ එච්කේකේ මීටර් 400 ඉසව්වෙන් සහ මීටර් 4x400 මිශ්‍ර සහය දිවීමේ ඉසව්වෙන් ලෝකඩ පදක්කම් දෙකක් දිනාගැනීම වැනි ජයග්‍රහණ මඟින් ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලංකාවට මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ද කීර්තියක් හිමිකරදීමට සමත්වූහ. එහිදී, යුද්ධ හමුදාධිපති එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කැපී පෙනෙන ජයග්‍රහණ අගයමින් විශේෂ සමරු තිළිණ සහ මූල්‍ය පරිත්‍යාග ප්‍රදානය කරමින් ජාත්‍යන්තර තලයේ තවදුරටත් මෙවැනි ජයග්‍රහණ ලබාගැනීමට ඔවුන් දිරිමත් කළේය.

# ලෝක පරිසර දිනයට

## සමගාමීව

## විශේෂ වැඩසටහනක්






ලෝක පරිසර දිනය යෙදුනු ජූනි මස 05 වන දින "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනට සහය වෙමින් "ප්ලාස්ටික් භාවිතය නවතමු" යන තේමාව ඔස්සේ යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී විශේෂ වැඩසටහනක් පැවැත්විණ. ඊට සමගාමීව, පරිසර හිතකාමී සහ තිරසාර සමාජයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2025 මැයි මස 30 වන දින සිට ජූනි මස 05 වන දින දක්වා වූ සතිය, පරිසර සතිය ලෙස ද නම්කෙරිණ.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගි විය. එහිදී, පාරිසරික සංරක්ෂණය සඳහා වූ කැපවීම සනිටුහන් කරමින් යුද්ධ හමුදාධිපති විසින් යුද්ධ හමුදා මූලස්ථාන රථවාහන අංගන පරිශ්‍රයේ "මී" පැළයක් ද රෝපණය කරන ලදී. මෙම වැඩසටහන යටතේ යුද්ධ හමුදා මූලස්ථානය අවට ද ජලපෝෂක ප්‍රදේශ ආරක්ෂා කරගැනීමේ අරමුණින් මෙම "මී" පැළ රෝපණය කෙරිණ.

Alliance Finance පුද්ගලික සමාගම විසින් මෙම වැඩසටහන සඳහා පොල් සහ අඹ පැළ 20,000ක් පරිත්‍යාග කළ අතර, එයින් පැළ 500ක් උත්සවය අතරතුරදී සංකේතාත්මකව භාරදෙන ලදී. මෙම පැළ යුද්ධ හමුදාධිපති විසින් රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත භාරදුන් අතර එම රෙජිමේන්තු මධ්‍යස්ථාන ඔස්සේ යුද්ධ හමුදා කඳවුරු වෙත භාරදෙනු ලබයි.





# අභාවප්‍රාප්ත හිටපු යුද්ධ හමුදාධිපතිගේ අවසන් කටයුතු යුද්ධ හමුදා ගෞරවාචාර මධ්‍යයේ





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 11 වන යුද්ධ හමුදාධිපති ලෙස දිවංගත ජෙනරාල් හැමිල්ටන් වනසිංහ (විශ්‍රාමික) වීඑස්වී යූඑස්පී එන්ඩීසී අප රටෙහි ත්‍රස්තවාදය හා සම්බන්ධ තීරණාත්මක අවධියක එම තනතුරෙහි කටයුතු කරමින් අනභිභවනීය මෙහෙවරක් ඉටුකරනු ලැබීය. යුද්ධ හමුදාවේ උන්නතිය උදෙසා එතුමන් එදවස සිදුකළ ආයෝජන අදට ද ප්‍රතිඵල ගෙන දෙමින් තිබේ. එම ඓතිහාසික මෙහෙවර සේම එතුමන්ගේ නාමය ද යුද්ධ හමුදා තුළ සන්ධිස්ථානයක් සේ සැළකිය හැකිය.

අභාවප්‍රාප්ත හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් හැමිල්ටන් වනසිංහ (විශ්‍රාමික) වීඑස්වී යූඑස්පී එන්ඩීසී ගේ දේහය පිළිබඳ අවසන් කටයුතු පූර්ණ හමුදා ගෞරවාචාර මධ්‍යයේ ඉකුත් ජුනි මස 15 වන දින සන්ධ්‍යාවේ බොරැල්ල, පොදු සුසාන භූමියේ පිහිටි නව ආදාහනාගාර පරිශ්‍රයේදී සිදුකෙරිණි. එතුමන්ගේ දේහය වෙත අවසන් ගෞරව දැක්වීම සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී ද සහභාගි විය. එහිදී, හමුදා සම්ප්‍රදායානුකූලව ජාතික කොඩියෙන් ආවරණය කරන ලද එම ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ දේහය කාතුගැල මත අභිමානවත් අයුරින් තැන්පත් කර හටපිරිස් පෙරටුකොට ගත් අවමංගල්‍ය පෙරහැරකින් සුසාන භූමිය වෙත රැගෙන යනු ලැබූහ.

යුද්ධ හමුදා විධායක ජෙනරාල් විසින් නිකුත් කරන ලද විශේෂ නියෝග I, අවමංගල්‍ය උත්සව අවස්ථාවේදී පැමිණි පිරිස ඉදිරියේ ප්‍රකාශ කරන ලද අතර, හමුදා නිලධාරියකුට ලැබිය හැකි ඉහළම ගෞරව උපහාරය ලබාදෙමින් කාලතුවක්කු වෙඩි මුර හඬ ගුවන් ගැබ සිසාරා පැතිර යන මොහොතේ එම හිටපු යුද්ධ හමුදාධිපති වෙත යුද්ධ හමුදා සාමාජිකයින් විසින් අභිමානවත් ලෙස සිය අවසන් ගෞරවාචාරය පුදකර සිටියහ.



පසුව, යුද්ධ හමුදාධිපති විසින් අභාවප්‍රාප්ත එම ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් සිය කීර්තිමත් යුද්ධ හමුදා දිවිය තුළ හිමිකරගත් පදක්කම් එතුමන්ගේ පුත්‍රයකු වූ මේජර් ජෙනරාල් සංජය වනසිංහ (විශ්‍රාමික) ආර්එස්පී වීඑස්වී යූඑස්පී වීඑස්පී සහ පවුලේ සාමාජිකයින් වෙත පිළිගන්වන ලදී.

### අභිමන් මැදින් බුහුමන් ලැබූ

# ඉන්දියානු නිල සංචාරය



ඉන්දියානු යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන General Upendra Dwivedi ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී පසුගිය ජූනි මස 14 වන දින ඉන්දියාවේ නිල සංචාරයක නිරත විය. එම සංචාරයේදී, යුද්ධ හමුදාධිපතිතුමන් ඉන්දියානු ආරක්ෂක ලේකම් රාජේෂ් සිං, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන General Upendra Dwivedi, නාවික හමුදා මාණ්ඩලික ප්‍රධාන Admiral Dinesh K. Tripathi, Air Chief Marshal Amar Preet Sing, යුද්ධ හමුදා මාණ්ඩලික උප ප්‍රධාන Lieutenant General Raja Subramaniam සහ නිරිතදිග ප්‍රදේශ අණදෙන ප්‍රධානී Lieutenant General Manjinder Singh ඇතුළු ඉන්දීය ආරක්ෂක ප්‍රධානීන් හමුවෙමින් ද්විපාර්ශ්වීය සහ කලාපීය ආරක්ෂක සහයෝගීතාව, උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ දෙරටෙහි සන්නද්ධ හමුදාවන් අතර අන්තර් ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම කෙරෙහි සාකච්ඡා කරන ලදී.









මෙම සංචාරය අතරතුරදී, යුද්ධ හමුදාධිපති ඩෙහ්රාඩුන්හි පිහිටි ඉන්දියානු යුද්ධ හමුදා විද්‍යාපීඨයේ 2025 ජූනි මස 14 වන දින පැවති කෙඩෙට් නිලධාරින්ගේ විසිරයාමේ පෙළපාලියේ ප්‍රධාන ආරාධිතයා ලෙස ද සහභාගි වීම විශේෂය. 1990 වසරේදී ඉන්දියානු යුද්ධ හමුදා විද්‍යාපීඨයේ මූලික පුහුණුව හදාරා අධිකාරියට පත් වූ ආදි ශිෂ්‍යයකු වන යුද්ධ හමුදාධිපතිට මෙම උත්සවය විශේෂ වැදගත් අවස්ථාවක් විය. ඉන්දියානු යුද්ධ හමුදා විද්‍යාපීඨයේ වත්මන් සේනාවිධායක Lieutenant General Nagendra Singh ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපති මෙම සංචාරයේදී, දෙරට අතර යුද්ධ හමුදා පුහුණු පාඨමාලාවන් පැවැත්වීම සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ඉන්දීය යුද්ධ හමුදා පුහුණු අණසක ආඥාපති Lieutenant General Devendra Sharma සමඟින් සාකච්ඡා පැවැත්වූහ.




එහිදී, දෙරට අතර පවතින හමුදා සම්ප්‍රදායන් සහ අන්‍යෝන්‍ය ගෞරවය පිළිබිඹු කරමින්, නවදිල්ලි නුවර පිහිටි ජාතික යුද ස්මාරකය අභියසදී දිවංගත වීරෝදාර ඉන්දීය රණවිරුවන් වෙත පුෂ්පෝපහාර පුදකරන්නට ද යුද්ධ හමුදාධිපති අමතක නොකළේය. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පවතින දිගුකාලීන ආරක්ෂක සබඳතා වැඩිදියුණු කිරීමට සහ කලාපීය සාමය සහ ස්ථාවරත්වය පවත්වාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම පිළිබිඹු කරමින් මෙම නිල සංචාරය සිදුකෙරිණි.



# උසස්වීම් ලද නිලධාරීන් වෙත යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්



මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් වෙත නිල ලාංඡන පැළඳවීම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී විසින් යුද්ධ හමුදා මූලස්ථානයේදී ඉකුත් ජූනි මස 16 දින සිදුකරන ලදී. මෙම අවස්ථාවට නවතමයෙන් උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල් කේඑම්වී කොඩිතුවක්කු, මේජර් ජෙනරාල් එච්ජ්එම් ප්‍රේමරත්න පීඑස්සී එල්එස්සී, මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්එස් මිල්ලගල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එච්ඩීඑම්සී, මේජර් ජෙනරාල් ජීසීවී ප්‍රනාන්දු එන්ඩීසී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගි වූහ.

# ඉන්දීය යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික, යුද්ධ හමුදාධිපති හමුවෙයි



2025 ඉන්දු - ශ්‍රී ලංකා ආරක්ෂක සංවාදයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණ සිටින ඉන්දීය යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික Lieutenant General M.P. Singh ඉකුත් ජූනි මස 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති හමුවිය.

# ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා තුර්කි ජනරජයේ තානාපති, යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා තුර්කි ජනරජයේ තානාපති අතිගරු Semih Lütfü Turgut මහතා ඉකුත් ජූනි මස 17 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 67 වන මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී ඉකුත් ජුනි මස 26 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී රාජකාරී භාරගනු ලැබීය. ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ බලකාධිපති වන එතුමන් මෙම ධූරයේ රාජකාරී භාරගැනීමට පෙර යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ලෙස රාජකාරී හෙබවීය.



මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඉකුත් ජුනි මස 26 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 47 වන නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ලෙස රාජකාරි භාරගනු ලැබීය. ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති වන එතුමන් මෙම ධූරයේ රාජකාරී භාරගැනීමට පෙර යාපනය ආරක්ෂක සේනා ආඥාපති ලෙස කටයුතු කළේය.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ 61 වන සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී ඉකුත් ජුනි මස 26 වන දින කොස්ගම පිහිටි එම මූලස්ථානයේ දී රාජකාරි භාරගනු ලැබීය. ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ වත්මන් කර්නල් සේනාවිධායක වන එතුමන් මෙම ධූරයේ රාජකාරී භාරගැනීමට පෙර යුද්ධ හමුදා විධායක ජෙනරාල් ලෙස ද රාජකාරී කරනු ලැබීය.



# නික්ම ගිය ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත බුහුමන්



විශ්‍රාම දිවියට එළැඹි යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහ යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී වෙත හමුදා ගෞරවාචාර පුදකිරීමේ උත්සවයන් පසුගිය ජුනි මස 20 සහ 23 වන දිනයන්හිදී යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ.

දශක තුනහමාරක් ඉක්මවූ සිය යුද්ධ හමුදා දිවිය තුළ එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යුදමය කාලසීමාවේ ද පශ්චාත් යුද කාලසීමාවේදීද ඉටුකරන ලද්දේ ගෞරවනීය මෙහෙවරකි. සෑම මට්ටමකම තනතුරු දරමින් ආදර්ශමත් මෙහෙවරක නිරතවූ ඔවුහු යුද්ධ හමුදාවේ යහපැවැත්ම හා ප්‍රගමනය වෙනුවෙන් කැපවීමෙන් රාජකාරී ඉටුකරනු ලැබූහ. බොහෝ මතක සැමරුම් ඉතිරිකොට සමුගන්නා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන සහ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන වෙත "රණවිරුවා" ද මෙලෙස සිය ආචාරය පුදකරයි.







# යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාඨමාලා




2025 වසරේ පළමු අධ්‍යයන වාරය සඳහා පනාගොඩ, යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල මඟින් පවත්වනු ලැබූ ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා සාර්ථකව හදාරනු ලැබූ නිලධාරින් සහ සෙසුනිලයන් වෙත නිල ලාංඡන පැළඳවීමේ උත්සවය ඉකුත් ජුනි මස 19 වන දින එම පුහුණු පාසල් ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් පුහුණු මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එන්කේඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.

එහිදී, නිලධාරි උසස් ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක - 19 හි නිලධාරි උපදේශකවරු 11 දෙනෙක්, උසස් ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක - 49 හි සෙසුනිල උපදේශකවරු 10 දෙනෙක් සහ සහකාර ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක - 134 හි සෙසුනිල උපදේශකවරු 100 දෙනෙක් උත්සවයේදී තම නිල ලාංඡන පැළඳ විසිර ගියහ.

# විගණන නිරීක්ෂණ අවම කරගැනීම පිළිබඳව වැඩමුළුවක්





22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩීඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ අදහසකට අනුව විගණන හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් විගණන නිරීක්ෂණ අවම කර ගැනීම පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩමුළුවක් පසුගිය ජුනි මස 26 සිට 29 වන දින දක්වා 22 වන පාබල සේනාංකයේදී පැවැත්විණ. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදේශකත්වය මත සිදුකළ මෙම වැඩමුළුව සඳහා එම සේනාංකය යටතේ ඇති පාබල බලසේනා හා ඒකකයන්හි රාජකාරි ඉටුකරනු ලබන නිලධාරීන් 11ක් සහ සෙසුනිලයන් 64ක් සහභාගී වූහ.

# ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරුවන්ගේ පාඨමාලාව





ත්‍රිවිධ හමුදාව නියෝජනය කරමින් නිලධාරින් 06 දෙනකු සහ සෙසු නිලයන් 28 දෙනකුගේ සහභාගිත්වයෙන් පැවති ඒකක වෙඩිකරුවන් පුහුණු කරවන්නන්ගේ පාඨමාලා අංක - 51 ඉකුත් ජුනි මස 18 වන දින ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසලේදී සාර්ථකව අවසන් වූහ. පාඨමාලාවේ සමාප්තිය එම පුහුණු පාසලේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් එස්ජේජීඒඑම් සුබසිංහ ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, එහිදී ප්‍රථම ස්ථානය ඉංජිනේරු සේවා බලකායේ කපිතාන් එල්ආර් වීරමන්ත්‍රී හිමි කරගත්තේය.

# මානව හිමිකම් සහ අන්තර් ජාතික මානුෂවාදී නීති පාඨමාලාව සාර්ථකව අවසන්



නීති සේවා මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද මානව හිමිකම් සහ අන්තර් ජාතික මානුෂවාදී නීති පාඨමාලා (සෙසුනිල) - අංක 30, ඉකුත් මැයි මස 05 වන දින සිට ජුනි මස 04 වන දින දක්වා කුකුළේගඟ, ශ්‍රී ලංකා සාමසාධක මෙහෙයුම් පුහුණු ආයතනයේදී පැවැත්විණ.

මෙම පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් සෙසුනිලයන් 29 දෙනෙක්, ශ්‍රී ලංකා නාවික හමුදාව නියෝජනය කරමින් සෙසුනිලයන් 4 දෙනෙක් සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කරමින් සෙසුනිලයන් 4 දෙනෙකු සහභාගි වූහ. මානව හිමිකම් සහ මානුෂීය නීතිය හා එහි ප්‍රායෝගික බව පිළිබඳව ඇති දැනුම වැඩි දියුණු කිරීම මෙම පාඨමාලාව පැවැත්වීමේ මූලික අරමුණ විය. උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකා සාමසාධක මෙහෙයුම් පුහුණු ආයතනයේ සේනාවිධායක බ්‍රිගේඩියර් වයිඑම්එස්සීබී ජයතිලක ආර්එස්පී යූඑස්පී සහභාගි විය. පාඨමාලාවේ පළමු ස්ථානය කමාන්ඩෝ රෙජිමේන්තුවේ කෝප්‍රල් ගමගේ එන්එස් විසින් හිමිකරගත් අතර, පාඨමාලාවේ සමාප්ති දේශනය නීති සේවා මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ කර්නල් කේජ්පී කුරුප්පු ආර්එස්පී විසින් සිදුකරන ලදී.



# මූලික ජීවිතාරක්ෂක පාඨමාලා







වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ, මූලික ජීවිතාරක්ෂක පාඨමාලා අංක 24, පසුගිය ජුනි මස 11 වන දින 21 වන පාබල සේනාංක පිහිනුම් තටාකයේදී පැවැත්විණ. මෙම පාඨමාලාව සඳහා වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ පාලනය වන ඒකකයන්හි සෙසුනිලයින් 25 දෙනකු සහභාගි වූහ. උත්සවයේ සහතික ප්‍රදානෝත්සවයට 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පීඩබ්ලිව්බීආර් පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී විය. 2 (ස්වේච්ඡා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ සාමාන්‍ය සෙබළ/එච්102764 ගුණසේකර ජේඑම්යූවයිඑම් එම පාඨමාලාවෙහි හොඳම ශිෂ්‍යාට හිමි සම්මාන හිමිකරගත්තේය. තවද, සියලුම සහභාගීවූවන්ට ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය විසින් නිල වශයෙන් පිළිගත් ජල ආරක්ෂාව සහ හෘද පෙණහලු නැවත පණ ගැන්වීමේ (CPR) සහතික ද පිරිනැමිණ.



# රසායනික කාන්දුවක් පාලනයට යුද්ධ හමුදා සහාය



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ක්ෂුද්‍රජීව විද්‍යාත්මක රසායනාගාරයේ ඉකුත් ජුනි මස 16 වන දින ඇති වූ රසායනික කාන්දුවක් ආරක්ෂිතව ඉවත්කර ප්‍රදේශය අවදානම් රහිත බවට පත්කිරීම සඳහා 14 රසායනික ජීව විද්‍යාත්මක විකිරණශීලී සහ න්‍යෂ්ටික ප්‍රතිචාර රෙජිමේන්තුවේ විශේෂිත ප්‍රතිචාර කණ්ඩායමක් සහ කොළඹ ගිනි නිවන හමුදාව ඒකාබද්ධව කටයුතු කරනු ලැබූහ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙතින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත සිදුකරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ තාක්ෂණික සහයෝගය ඇතිව මෙම කටයුත්ත සිදුවිය.

එහිදී, එම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතුවලට සිදුවන බාධා අවම කරමින් එම ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා යුද්ධ හමුදා නිලධාරින් සහ සෙසුනිලයන් සමන්විත කණ්ඩායමක් එම ස්ථානය වෙත යොමුකරනු ලැබීය.







අධික සුළං හේතුවෙන් බලන්ගොඩ රජවක මධ්‍ය මහා විද්‍යාලයේ ගොඩනැගිලි මතට කඩාවැටුණු ගස් ඉවත් කර පාසල් පරිශ්‍රය පිරිසිදු කිරීම ඉකුත් ජූනි මස 12 වන දින 18 බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ හටපිරිස් විසින් සිදුකරනු ලැබූහ.





පිළියන්දල, බෝකුන්දර හන්දිය අසල දෙව්මිණි දැව ගබඩාවේ ඉකුත් ජූනි මස 04 වන දින ඇතිවූ හදිසි ගින්නක් කඩිනමින් මැඩපැවැත්වීම සඳහා 5 කාරක රෙජිමේන්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ සහ 1 ශ්‍රී ලංකා යුධෝපකරණ බලකායේ හටපිරිස් සිය දායකත්වය ලබාදුන්හ.



හදිසි අවස්ථාවකට කඩිනමින් ප්‍රතිචාර දක්වමින්, 2 (ස්වේච්ඡා) බලඇණියේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ඉකුත් ජූනි මස 29 වන දින අලුයම හන්තාන කඳුවැටියේ අතරමං වූ පුද්ගලයන් පිරිසක් බේරා ගැනීමට සමත්වූහ.







# ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි සඳහා භටපිරිස් දිවයිනෙන් පිටත්ව යති

ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ, 16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම 2025 ජූලි මස 02 වන දින සුභ පැතුම් මධ්‍යයේ ලෙබනනය බලා පිටත් විය. 16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම නිලධාරීන් 07 දෙනෙකු සහ සෙසු නිලයන් 114 දෙනෙකු ඇතුළුව හමුදා සාමාජිකයින් 121 දෙනකුගෙන් සමන්විතය. එම කණ්ඩායමේ අණදෙන නිලධාරි ලෙස ගජබා රෙජිමේන්තුවේ ලුතිනන් කර්නල් වයිඑස්එච්එන්පී සිල්වා යූඑස්පී පීඑස්සී සහ දෙවන අණදෙන නිලධාරි ලෙස යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ ලුතිනන් කර්නල් බීඑම්ජ්අයියූ ඔබයසේන යූඑස්පී පීඑස්සී  කටයුතු කරනු ලබයි.

සාමසාධක රාජකාරී සඳහා දිවයිනෙන් පිටත්ව ගිය එම භට කණ්ඩායමට සුභ පැතුම් එක් කිරීම සඳහා යුද්ධ හමුදාධිපති වෙනුවෙන් ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, යුද්ධ හමුදා ගමන් පාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් සීඩී වික්‍රමනායක ඩබ්ලිව්වී ආර්එස්පී එන්ඩීසී, යුද්ධ හමුදා විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් එම්කේඩීපී මාපලගම පීඑස්සී ඇතුළු පිරිසක් ගුවන් තොටුපළ වෙත පැමිණියහ.







මීට සමගාමීව ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ, 15 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම 2025 ජූලි මස 02 වන දින එම රාජකාරින් නිම කිරීමෙන් පසු නැවත දිවයිනට පැමිණීම ද සිදුවිය. විජයබාහු පාබල රෙජිමේන්තුවේ ලුතිනන් කර්නල් ඩීකේඩී විතානගේ ආර්එස්පී විසින් අණදෙන ලද 15 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම නිලධාරින් 11 දෙනකු සහ සෙසු නිලයන් 114 දෙනකුගෙන් සමන්විත වූහ.











# ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථාන ජාත්‍යන්තර සංස්කෘතික උළෙල







15 වන මූලස්ථාන ආරක්ෂක භට කණ්ඩායමේ සාමාජිකයන් විසින් ඉකුත් මැයි මස 28 වන දින Naquora ප්‍රදේශයේ ස්ථාපිත ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ දී "ජාත්‍යන්තර සංස්කෘතික උළෙල 2025" පැවැත්විය. එම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා මූලස්ථාන ආරක්ෂක භට කණ්ඩායමේ සාමාජිකයන් විසින් සකස් කරන ලද දේශීය ආහාර පාන වර්ග ඉදිරිපත් කළ අතර මෙහිදී, ශ්‍රී ලාංකික සාම්ප්‍රදායික නර්තනයන්ගෙන් යුත් සංගීත සංදර්ශනයක් ද සංස්කෘතික හා කැලිප්සෝ කණ්ඩායම වෙතින් සිදුකරන ලදී. ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ බලකාධිපති සහ අණදෙන නිලධාරි ලුතිනන් ජෙනරාල් Aroldo Lázaro Sáenz ගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සවය පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා 15 වන මූලස්ථාන ආරක්ෂක භට කණ්ඩායමේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඩීකේඩී විතානගේ ආර්එස්පී ඇතුළු එහි සාමාජිකයන් ද සහභාගි වූහ.







# වියළි සලාක පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්

24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ අධීක්ෂණය මත 11 (සෙව්) සිංහ රෙජිමේන්තුව වෙතින් ගැබිනි මව්වරුන් වෙත වියළි සලාක සහ දිවා ආහාර පාර්සල් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගිය ජූනි මස 23 වන දින කොක්කඩිචෝලෙ ප්‍රදේශයේදී පවත්වන ලදී. ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල ගැබිනි මව්වරුන්ට සහයවීමේ අරමුණින් පැවති මෙම වැඩසටහන සඳහා 243 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්යූපී කලුපහන යූඑස්පී පීඑස්සී, නිලධාරීන්, සෙසුනිලයන් සහ ප්‍රාදේශීය සිවිල් වැසියන් පිරිසක් සහභාගී වූහ.





# පාසල් උපකරණ සහ පොත් පරිත්‍යාගයක්

222 වන පාබල බලසේනාව යටතේ ස්ථාපිත 9 විජයබාහු පාබල රෙජිමේන්තුව වෙතින් පාසල් උපකරණ සහ පුස්තකාල පොත් බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ජූනි මස 24 වන දින සිරිමංගලපුර කන්තලේ ගාමිණී ප්‍රාථමික පාසලේදී පවත්වන ලදී. භාග්‍යා වීරසිංහ සහ රගුරන් ජයචන්ද්‍රන් යන මහත්ම මහත්මීන් ඒ සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය දැරූ අතර, මෙම අවස්ථාවට 222 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, නිලධාරීන්, සෙසු නිලයන්, පාසල් කාර්ය මණ්ඩලය සහ ප්‍රදේශයේ සිවිල් වැසියන් රැසක් සහභාගී වූහ.








# කළගුණ සිහිකරමින් පරිත්‍යාගයක්

තිස්වසක් පුරා පැවති ත්‍රස්තවාදය තුරන් කිරීම වස් මැයි මසට යෙදෙන රණවිරු උපහාර දිනය වෙනුවෙන් සංවිධානය කළ ප්‍රජාසත්කාරක වැඩසටහනක් ඉකුත් ජූනි මස 12 වන දින 6 ගැමුණු හේවා බළඇණියේ හටපිරිස් එකතුව සිදුකළහ. ඒ අනුව බලප්‍රදේශය තුළ ජීවත්වන අඩු ආදායම්ලාභී සිවිල් වැසියන් වෙනුවෙන් පොල් පැළ බෙදාදීමේ වැඩසටහනක් එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජීජීඑන් විජේසූරිය ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ සුගන්දිපුරම් ග්‍රාම නිලධාරී කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී, අඩු ආදායම්ලාභී පවුල් 15ක් වෙත පොල් පැළ 150ක ප්‍රමාණයක් බෙදාදීම සිදුවිය.

# කායදානය කැපකළවුවන් සිහිකරමින්





1 ශ්‍රී ලංකා රයිෆල් බලකාය ස්ථාපිත බලප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සහල් මලු ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පසුගිය ජූනි මස 10 වන දින එම ඒකක මූලස්ථානයේදී පැවැත්විණ. ප්‍රදේශවාසී ධානපතියන්ගේ අනුග්‍රාහකත්වයෙන් එම බලකායේ අණදෙන නිලධාරී ඇතුළු හටපිරිස් මේ සඳහා දායක වූහ. එහිදී, සහල් කිලෝ 2600ක ප්‍රමාණයක් ප්‍රදේශයේ පදිංචිකරුවන් 1075ක් වෙත බෙදාදෙනු ලැබීය.



# කෘතගුණ දත් විරුදරුවන්

මැයි මසට යෙදුණු රණවිරු සැමරුම් දිනය නිමිත්තෙන් 6 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු හටපිරිස් එකතුව ඉකුත් ජූනි මස 13 වන දින ප්‍රජාසත්කාරයක් සිදුකළහ. ඒ අනුව ආනන්දපුරම් හා තේව්පුරම් යන ග්‍රාමයන්හි පදිංචි අඩු ආදායම්ලාභී සිවිල් වැසියන් සඳහා වියළි සලාක මලු බෙදාදීමට කටයුතු කළ අතර, එම ඒකක අණදෙන නිලධාරී මේජර් කේඑන්සී ද සිල්වා ගේ ප්‍රධානත්වයෙන් මෙම කර්තව්‍යය සිදුකෙරිණ.





# නිවහනක සිහින සැබෑ කරමින්

1 වන විමර්ශණ රෙජිමේන්තුව - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ හටපිරිස් එකතුව අංක 181/සී/4, පහළ හංවැල්ල ප්‍රදේශයේ නිවාස අවශ්‍යතා ඇති අඩු ආදායම්ලාභී පවුලක් සඳහා  නව නිවසක් ඉදිකරදෙනු ලැබූහ. මේජර් ජෙනරාල් පීඒඑම් පීරිස් (විශ්‍රාමික) ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ සම්බන්ධීකරණයෙන් යුතුව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ සේනාවිධායක මේජර් ජෙනරාල් එම් එස් දේවප්‍රිය යූඑස්පී එන්ඩීසී ගේ සුරතින් හඳපාන්ගොඩ මුදලිගේ දොන් දුලීප් ප්‍රියන්ත යන අය වෙත මෙම නිවස ප්‍රදානය කරනු ලැබීය.



පූනානි ප්‍රදේශයේ පදිංචි ගාමිණී අමරසිංහ යන අය සහ එතුමන්ගේ පවුලේ සාමාජිකයන් වෙනුවෙන් ඉදිකෙරුණු නව නිවසක් පසුගිය ජූනි මස 29 වන දින පරිත්‍යාග කෙරිණ. මෙම සත්කාරය සඳහා නිලූකා ඇල්කඩුව, ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත බණ්ඩාර, සංජය එදිරිසිංහ සහ අනුරාදා නානායක්කාර යන මහත්ම මහත්මීන් මූල්‍ය අනුග්‍රහය ලබාදුන් අතර, ඊට 7 ගැමුණුහේවා බළඇණිය හටපිරිස් ශ්‍රම දායකත්වය සැපයූහ.

නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 233 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, එම අනුග්‍රාහකයින් ඇතුළු පිරිසක් සහභාගී වූහ.







11 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙතින් අක්කරපත්තු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ආලිම් නගර් ග්‍රාම නිලධාරි වසමෙහි 14/සි, අම්පාර පාර, ඉලුච්චේන, අක්කරපත්තු ලිපිනයේ පදිංචි එම්. ඉර්ෆානා මහත්මිය හා ඔවුනගේ පවුලේ අයවලුන් සඳහා ඉදිකරනු ලබන නිවසක් වෙනුවෙන් මුල්ගල තැබීමේ උත්සවයක් පසුගිය ජුනි මස 24 වන දින සිදුකෙරිණ. සිවිල් සමාජය හා යුද්ධ හමුදාව අතර සංහිඳියාව වර්ධනය කිරීමේ අරමුණින් සිදුකළ මෙම සත්ක්‍රියාව සඳහා 241 වන බලසේනාවේ බලසේනාධිපති, අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් හා ආලිම්නගර් ග්‍රාම නිලධාරි ඇතුළු නිලධාරි සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

## බැතිමතුන් හට සත්කාර රැසක්





වාර්ෂිකව සංවිධානය කරනු ලබන වට්ටප්පලෙයි කණ්නගි අම්මාන් කෝවිල් උත්සවය මෙවරත් හාර ලක්ෂයකට අධික බැතිමතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් යුතුව ඉකුත් ජුනි මස 06 වන දින සිට 10 වන දින දක්වා පැවැත්විණ. 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම යටතේ එම සේනාංක භටපිරිස් එකතුව ඉකුත් ජුනි 09 වන දින දවස පුරා එහි පැමිණි බැතිමතුන් උදෙසා කොත්තමල්ලි සහ බනිස් දන්සැලක් පවත්වනු ලැබූහ. තවද, ඔවුන් හට වෛද්‍ය පහසුකම් ලබාදීම සඳහා ප්‍රථමාධාර කඳවුරක් ද උත්සවය දින කිහිපයම ආවරණය වන පරිදි පැවැත්වීම විශේෂත්වයකි.

## ජගත් පරිසර දිනයට අත්වැලක්ව





561 වන පාබල බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති කර්නල් එම්එස්පී බංඩාර යූඑස්පී ගේ මගපෙන්වීම මත 10 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩීඑන්ටී ද සොයිසා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් ජගත් පරිසර දිනය වෙනුවෙන් රුක් රෝපණ වැඩසටහනක් පාලිනගර් ජාතික පාසල කේන්ද්‍ර කර ගනිමින් ඉකුත් ජුනි මස 06 වන දින පැවැත්විණ. එම ඒකක භටපිරිස් හි දායකත්වය සමගින් මේ සඳහා පාසල් ගුරුභවතුන් හා දරු දැරියන් පිරිසක් සහභාගී වූහ.

# ලේ බිඳක් දන්දෙමින්







12 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි රාජකාරි නියුතු නිලධාරි, සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් ලේ දන්දිමේ වැඩසටහනක් ඉකුත් ජුනි මස 09 වන දින එම ඒකක මුලස්ථානය පෙරියවඩ්ඩුවාන් කඳවුරේදී සිදුකෙරිණ. මඩකලපුව ප්‍රාදේශිය රුධිර පාරවිලනය මධ්‍යස්ථානය සමඟ සම්බන්ධතාවයෙන් ඒකක අණදෙන නිලධාරි මේජර් එච්එම්වීපී හේරත් සහ එම ඒකක භටපිරිස් මෙම සත්කාරය සංවිධානය කරනු ලැබූහ.





ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 11(ස්වේච්ඡා) බළඇණියේ අණදෙන නිලධාරී ඇතුළු එහි සාමාජිකයින් එකතුව සංවිධනය කළ රුධිර පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගිය ජුනි මස 19 වන දින මඩකලපුවේදී පැවැත්විණ. යුද්ධ හමුදාව සහ සිවිල් ජනතාව අතර සබඳතා ශක්තිමත් කිරීම අරමුණින් පැවති මෙම වැඩසටහන සඳහා හමුදා සාමාජිකයින් සහ සිවිල් වැසියන් රැසක් සහභාගී වූහ.





ජාත්‍යන්තර රුධිර පරිත්‍යාගශීලීන්ගේ දිනයට සමගාමීව 543 වන පාබල බලසේනාව මඟින් සංවිධානය කළ ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ජුනි මස 14 වන දින මන්නාරම් දිස්ත්‍රික් මහ රෝහලේදී පැවැත්විණ. 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්සීපී විජේරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්පීඑස් පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනට මන්නාරම් ප්‍රාදේශීය ලේකම් එම් ප්‍රදීපන් මහතා ද සහභාගී විය.



එහිදී, මන්නාරම රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය එම්එච්එම් අශාන් මහතා විසින් රුධිරය පරිත්‍යාග කිරීමේ අවශ්‍යතාවය සහ වැදගත්කම පිළිබඳ දැනුම්වත් කිරීමේ දේශනයක් ද පවත්වන ලදී. 543 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එච්එස්ඩබ්ලිව්කේ ගල්හේනගේ ආර්ඩබ්ලිව්පි ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ පැවති මෙම වැඩසටහන සඳහා එලායන්ස් ෆිනෑන්ස් පුද්ගලික සමාගමේ අනුග්‍රාහක දායකත්වයෙන් එම ශාඛා කළමනාකරු ඒඑන්ජේ රෝයී මහතා ද එක්විය. මෙම අවස්ථාව සඳහා 54 වන පාබල සේනාංකයෙහි රාජකාරී නියුතු නිලධාරීන් හා සෙසුනිලයින් 125කට ආසන්න පිරිසක් සහභාගී වූහ.



211 වන පාබල බලසේනාව, 9 ගජබා රෙජිමේන්තුව සහ 5(ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුව යටතේ රාජකාරී නියුතු නිලධාරී සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් යුතුව රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පදවිය මූලික රෝහලේදී ඉකුත් ජුනි මස 07 වන දින පැවැත්විණ. 211 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටීඩීපී සිරිවර්ධන පීඑස්සී ගේ අධීක්ෂණය මත පැවැත්වුණු මෙම වැඩසටහන සඳහා පදවිය මූලික රෝහල් කාර්ය මණ්ඩලය ඇතුළු වෛද්‍ය කණ්ඩායම් සහය ලබාදුන්හ. මෙය කොළඹ රාජකීය විද්‍යාලයීය රතුකුරුස සමාජයේ 46 වන රුධිර පරිත්‍යාග වැඩසටහනට සමගාමීව පැවැත්විණ.





5 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව විසින් සංවිධානය කරන ලද රුධිර පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජුනි මස 17 වන දින තන්තිරිමලේ විහාරස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී, හමුදා සාමාජිකයෝ සහ ප්‍රදේශයේ සිවිල් වැසියන් විශාල පිරිසක් ඊට උද්යෝගිමත්ව සහභාගී වූහ.






52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්එන් ප්‍රනාන්දු ආර්එස්පී සහ 522 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ජේජ්සී කරුණාතිලක ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ ඉකුත් ජුනි මස 15 වන දින මරදන්කේනි රෝහලේදී රුධිර පරිත්‍යාග වැඩසටහනක් පැවැත්විණ. උතුරු පළාත් රෝහල්වල පවතින රුධිර සංචිතයන්හි අවශ්‍යතා සම්පූර්ණ කිරීම මෙම වැඩසටහන සංවිධානය කිරීමේ අරමුණයි. මෙම සමාජ සත්කාරකය 10 (ස්වේච්ඡා) බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ වැඩබලන අණදෙන නිලධාරිගේ මෙහෙයවීමෙන් සංවිධානය කරන ලද අතර, එහිදී රුධිරය පරිත්‍යාග කිරීම සඳහා යුද්ධ හමුදා සෙබළු, සිවිල් වැසියන් සහ පොලිස් නිලධාරීන් රැසක් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූහ.



මව්බිම වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිපත් කිරීමේ අරමුණින් 10 බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ භටපිරිස් එකතුව කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ රුධිර බැංකුව සමඟ එක්ව පාලිනගර් කඳවුරු පරිශ්‍රයේදී රුධිර පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජුනි මස 16 වන දින පවත්වනු ලැබූහ. 561 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එම්එස්පී බණ්ඩාර යූඑස්පී පීඑස්සී ගේ මඟපෙන්වීමෙන් එම ඒකකයේ අණදෙන නිලධාරිගේ අධීක්ෂණය යටතේ මෙම සමාජ සත්කාරක වැඩසටහන පැවැත්විණි.



"306 සී සිංහ සමාජය" සමඟ රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය එක්ව රණක්ෂිතයට පත් සහ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් සංවිධානය කරන ලද වෛද්‍ය කඳවුරක් ඉකුත් මැයි මස 27 වන දින මහනුවර, යුද්ධ හමුදා මූලික රෝහලේදී පැවැත්විණ. මධ්‍යම පළාතේ වෙසෙන යුද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීම මෙම වැඩසටහනේ අරමුණයි.

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී සමඟින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනී දිසානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනේදී රෝද පුටු 27ක් සහ කිහිලිකරු යුගල් 240ක් සංකේතාත්මකව බෙදාදීම ද සිදුකෙරිණ.

මෙම අවස්ථාවට රණක්ෂිතයට පත් රණවිරුවන්, විශ්‍රාමික රණවිරුවන්, දිවිපිදූ රණවිරුවන්ගේ පවුලේ සාමාජිකයන් සහ දැනට වෛද්‍ය ප්‍රතිකාර ලබන රණවිරුවන් ඇතුළු ප්‍රතිලාභීන් 2,500කට අධික සංඛ්‍යාවක් සහභාගි වූහ. මෙම වෛද්‍ය කඳවුරට වෛද්‍ය උපදේශන, කෘත්‍රිම අවයව නඩත්තු කිරීම, චර්ම රෝග සහ දන්ත සායන, මානසික සෞඛ්‍ය උපදේශන සහ පෝෂණ මාර්ගෝපදේශ ඇතුළත් විය.




# රණක්ෂිතයට පත් ප්‍රවීණයන් සඳහා වෛද්‍ය කඳවුරක්





# මධ්‍යම පළාතේ රණවිරුවන් සඳහා වෛද්‍ය කඳවුරක්







මහනුවර, යුද්ධ හමුදා මූලික රෝහලේදී විශ්‍රාමික සහ සේවයේ නියුතු යුද්ධ හමුදා රණවිරුවන් 2,000කට ආසන්න සංඛ්‍යාවකට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා සංවිධානය කෙරුණු වෛද්‍ය කඳවුරක් ඉකුත් ජූනි මස 27 වන දින පැවැත්විණ. මධ්‍යම පළාතේ වෙසෙන යුද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සෞඛ්‍ය සේවා සපුරාලීමේ අරමුණින් යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයකට අනුව දියත්කළ මෙම වැඩසටහන රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂක මණ්ඩලයේ සම්බන්ධීකරණය මත සිදුවිය.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී සමඟින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රනී දිසානායක මහත්මිය ද එක්වූහ.

මෙම උත්සවයට සමගාමීව, සේවා වනිතා ඒකකය විසින් රෝද පුටු 20ක් සහ "රොටරි සංවිධානය" මඟින් රෝද පුටු 02ක් පරිත්‍යාග කරන ලදී. තවද, සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ මඟපෙන්වීම මත සිංහ සමාජයේ සම්බන්ධීකරණයෙන් ජංගම දන්ත හා අක්ෂි සායනයක් සහ සියලු සහභාගිවන්නන් සඳහා දිවා ආහාරය ද සැපයිණ.





# සුභසාධන වැඩසටහන් පිළිබඳ දේශන මාලාවක්

යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුභසාධනය උදෙසා යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් වැඩසටහන් රාශියක් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබයි. එහෙත් බොහෝ යුද්ධ හමුදා සාමාජිකයින් එම කටයුතු පිළිබඳව අවබෝධයක් නොමැති බවක් පෙනේ. එබැවින් යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත එම අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයවීමෙන් රණවිරුවන් දැනුම්වත් කිරීමේ දේශන මාලාවක් අදියර I සහ II ලෙස පැවැත්විණ.



ඒ අනුව, එහි පළවන අදියර යටතේ වූ දේශන 1 බලකාය, යාපනය හා වන්නි ආරක්ෂක සේනා මූලස්ථාන, 21, 51, 52, 55 සහ 56 වන පාබල සේනාංක හා ඊට අයත් අංශ, ආයතනවල ඉකුත් අප්‍රේල් මස 29 වන දින සිට මැයි මස 02 වන දින දක්වා පැවැත්විණ.

එම දේශනයන්හි දෙවන අදියර 1 සන්නද්ධ බුද්ධි බලකාය, ආධුනික පුහුණු පාසල - වෙඩිතලතිව්, ගුවන් සංක්‍රමික පුහුණු පාසල - නිකවැව, 21 සහ 53 වන පාබල සේනාංක ඇතුළු ඊට අයත් රෙජිමේන්තු, පුහුණු පාසල් හා ඒකක ආවරණය වන පරිදි 2025 මැයි මස 20 සිට 23 වන දින දක්වා පැවැත්විණ. මේ සඳහා නිලධාරීහු 151ක් හා සෙසු නිලයින් 3259ක් මෙන්ම Zoom තාක්ෂණය ඔස්සේ නිලධාරින් 28ක් හා සෙසුනිලයින් 821කට අධික පිරිසක් සහභාගි වූහ. මාණ්ඩලික නිලධාරි I (මෙහෙයුම්) ලුතිනන් කර්නල් ඩීපීකේ ද සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, මාණ්ඩලික නිලධාරි II (සුවසහන විශ්‍රාමික) මේජර් යූඑම් හේරත් සහ මාණ්ඩලික නිලධාරි II (වන්දි) මේජර් එම්කේඑස් මොරවක යන නිලධාරීහු මෙම දේශන පවත්වනු ලැබූහ.



# රණක්ෂිතයට පත් විරුවන් සංචාරයක





වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ අදහසකට අනුව 59 වන පාබල සේනාංකාධිපතිගේ මගපෙන්වීම යටතේ අනුරාධපුරය අභිමංසල 1 හි නේවාසිකව ප්‍රතිකාර ලබන ආබාධිත රණවිරුවන් සහ ඔවුන්ගේ උපස්ථායක රාජකාරි සිදුකරනු ලබන නිලධාරීන් 05 දෙනෙක් සහ සෙසුනිලයින් 38 දෙනෙක් ඉකුත් ජූනි මස 28 වන දින 59 වන පාබල සේනාංකයේ සංචාරයක නිරත වූහ. එහිදී, 6 ගැමුණු හේවා බලකා ඒකක බලප්‍රදේශයෙහි පිහිටා ඇති එල්ටිටිඊ ත්‍රස්තවාදී නායකයා රැඳී සිටි චේනාවිල් රහසිගත බංකරය නැරඹීමටත්, මුහුදු කොටි ත්‍රස්තවාදීන් පුහුණුවීම් සිදුකරනු ලැබූ කොම්බාවිල් පිහිටි පිහිනුම් තටාකය නැරඹීමටත් ඔවුනට අවස්ථාව සලසනු ලැබීය. අනතුරුව 593 වන පාබල බලසේනා මූලස්ථානය මඟින් එම පිරිසට තේ පැන් සංග්‍රහයක් ද පිරිනමන ලදී. එසේම, වෙල්ලමුල්ලිවයික්කාල් විජයග්‍රාහී රණවිරු ස්මාරකය සහ එල්ටිටිඊ ත්‍රස්තවාදී නායකයා මියගිය වෙල්ලමුල්ලවෛයික්කාල් කඩොලාන කලපුව නැරඹීමට ද සංචාරයේ නිරත පිරිස එක්වූහ.

# ආසියානු ශූරතා මුෂ්ඨි ප්‍රහාර තරඟාවලිය - 2025








අවුරුදු 22න් පහළ ආසියානු ශූරතා මුෂ්ඨි ප්‍රහාර තරඟාවලිය ඉකුත් මැයි මස 12 දින සිට 2025 මැයි මස 23 වන දින දක්වා කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්විණ. මේ සඳහා රටවල් 24ක් නියෝජනය කරමින් ක්‍රීඩක, ක්‍රීඩිකාවන් 243ක් සහභාගී වූ අතර, ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කරමින් යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර සංචිතය තරඟ වැදුනහ. එහිදී, 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සෙ/ආර්102791 ලා/කෝ පෙරේරා එච්කේඑන් ලෝකඩ පදක්කමක්, 3 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ සෙ/583828 සාසෙ දසුන්ප්‍රිය කේඩබ්එස්එම්ජ් ලෝකඩ පදක්කමක් සහ 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සෙ/2133882 ආකාසෙ නරසිංහ එන්එම්එම් රිදී පදක්කමක් ද දිනාගත්හ. යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර කමිටුවෙහි සභාපති මේජර් ජෙනරාල් පීකේඩබ්ලිව්ඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර කණ්ඩායම මෙම තරඟාවලියට එක්විය.

# සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක්




243 වන පාබල බලසේනාව යටතේ ඇති ඒකක හටපිරිස් අතර සහයෝගීතාව ඇතිකිරීමේ අරමුණින් සංවිධානය කෙරුණු සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් ඉකුත් ජූනි මස 05 වන දින එම පාබල බලසේනා මූලස්ථානයේදී පැවැත්විණ. බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්යූපී කළුපහන යූඑස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ පැවති එම තරඟාවලියේ පාබල බලසේනා මූලස්ථාන කන්ඩායම පරදා 16 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව ශූරතාව හිමිකරගත්තේය. එම තරඟාවලියේ හොඳම පිතිකරුවා මෙන්ම තරඟාවලියේ වීරයාට හිමි සම්මානය වර්ණ සැරයන් සිල්වා ඒඩීසී ආර්එස්පී විසින් ද දක්ෂතම උඩ පන්දු රකින්නා ලෙස ලාන්ස් කෝප්‍රල් ගුණසේකර එච්ජ්අයිපී ද හොඳම පන්දු යවන්නා ලෙස බලලත් නිලධාරී II ප්‍රියදර්ශන ඩබ්ලිව්ජ්එන් ද සම්මාන හිමිකරගනු ලැබූහ.

# ජාතික සෙපැක්ටැක්රෝ ශූරතාවලිය




ශ්‍රී ලංකා ජාතික සෙපැක්ටැක්රෝ සම්මේලනය විසින් සංවිධානය කරන ලද ජාතික සෙපැක්ටැක්රෝ ශූරතාවලියේ අවසන් මහා තරඟය ඉකුත් ජූනි මස 15 වන දින පුත්තලම නගර සභා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. යුද්ධ හමුදා පාපන්දු කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් කේජේඑන්එම්පීකේ නවරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මඟපෙන්වීම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි සහ කාන්තා සෙපැක්ටැක්රෝ කණ්ඩායම් මෙම තරඟාවලිය සඳහා සහභාගි වී ශූරතාවන් දිනාගත්හ.

# අභියෝගතා කුසලාන වොලිබෝල් තරඟාවලියක්





මන්නාරම දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සහ යුද්ධ හමුදා සාමාජිකයින් අතර ක්‍රීඩා කුසලතාවන් ඉහළ නැංවීමේ අරමුණින් සංවිධානය කෙරුණු "ආඥාපති (වන්නි) අභියෝගතා කුසලාන වොලිබෝල් තරඟාවලිය" ඉකුත් මැයි මස 20 වන දින මන්නාරම නගර සභා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. ඊට මන්නාරම් දිස්ත්‍රික්කයෙහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක් ආවරණය වන පරිදි ක්‍රීඩා කණ්ඩායමක් සහ යුද්ධ හමුදාව වෙතින් කණ්ඩායම් 5ක් එක්වූහ. එහි අවසන් වටයේ තරඟය සඳහා 54 වන පාබල සේනාංකයේ "ඒ" කණ්ඩායම සමඟ මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කණ්ඩායම තරඟ වැදුණහ. තවද, මන්නාරම දිස්ත්‍රික්කයේ තරුණ කාන්තාවන් අතර වොලිබෝල් ක්‍රීඩාව ජනප්‍රිය කිරීමේ අරමුණ ඇතිව මන්නාරම් දිස්ත්‍රික් කාන්තා කණ්ඩායම සහ යුද්ධ හමුදා කාන්තා වොලිබෝල් කණ්ඩායම අතර ප්‍රදර්ශනාත්මක තරඟයක් ද පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයන් ලෙස වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඑම්පීබී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහ මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති කේ. කනකේෂ්වරම් මහතා සහභාගී වූහ.

# තායිලන්ත මලල ක්‍රීඩා ශූරතාවලිය - 2025






තායිලන්ත මලල ක්‍රීඩා සංගමය වෙතින් සංවිධානය කරනු ලැබූ "තායිලන්ත විවෘත මලල ක්‍රීඩා ශූරතාවලිය - 2025" තරඟාවලිය ඉකුත් ජුනි මස 22 දින තායිලන්තයේ Pathumthani ප්‍රදේශයේදී පැවැත්විණි. එම තරඟාවලියේදී 6 බළඇණිය ගැමුණු හේවා බලකායේ කෝප්‍රල් චතුරංග ජීආර් රන් පදක්කම් දෙකක්, 2 (සේවා) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කෝප්‍රල් අහමඩ් එම්එන්එස් ලෝකඩ පදක්කමක්, 2 (සේවා) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ලාන්ස් කෝප්‍රල් වක්සන් වී රන් හා රිදී පදක්කම් සහ 2 (සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කාන්තා සෙබළ හපුආරච්චි එච්ඩබ්ලිව්කේ රිදී පදක්කමක් දිනාගනිමින් විශිෂ්ට දක්ෂතා දක්වමින් ශ්‍රී ලංකා මාතාවටත්, සමස්ථ යුද්ධ හමුදාවටත් කීර්තියක් අත්කරදීමට සමත්විය.

# ජාතික මුයිතායි ශූරතාවලිය - 2025



ඉකුත් ජුනි මස 05 වන දින කොළඹ, සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පැවති ජාතික මුයිතායි ශූරතාවලිය - 2025 දී ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුයිතායි ක්‍රීඩක ක්‍රීඩිකාවන් අඛණ්ඩව තුන්වන වරටත් එහි ජයග්‍රහණය හිමිකරගනිමින් රන් පදක්කම් 17ක්, රිදී පදක්කම් 16ක් සහ ලෝකඩ පදක්කම් 22ක් දිනාගත්හ. හොඳම පිරිමි බොක්සිං ක්‍රීඩිකයා ලෙස ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් කොඩිතුවක්කු කේජීසීඑස්ඩී දිනාගත් අතර, හොඳම කාන්තා බොක්සිං ක්‍රීඩිකාව ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සාමාන්‍ය සෙබළ තිලකරත්න ඩබ්ලිව්ජීසීජේ සම්මාන දිනා ගත්තාය. මෙම අවස්ථාවට රාජ්‍ය නිලධාරින්, රාජකීය තායි තානාපති කාර්යාලයේ නියෝජිතයන්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරින්, සෙසුනිලයන් සහ තරඟකරුවන් සහභාගි වූහ.

## වෛද්‍ය සායනයක්





5 (සෙව්) යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු එම ඒකක සාමාජිකයින් එකතුව සංවිධානය කළ වෛද්‍ය කඳවුරක් ඉකුත් ජූනි මස 07 වන දින වෙල්ලන්කුලම් රජයේ දමිළ මිශ්‍ර පාසලේදී පැවැත්විණ. එහිදී, මන්නාරම, මාන්තෛයි (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමසේවා වසම්හි සිවිල් වැසියන් සඳහා සර්වාංග රෝග සායනයක්, ඇස් පරීක්ෂාවක්, දන්ත සායනයක්, මානසික සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ සායනයක් සහ රුධිර පරීක්ෂා කිරීමේ සායනයක් සිදුකෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්සීපී විජේරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්පීඑස් පීඑස්සී, 541 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිව්පී, මාන්තෛයි (බටහිර) සහකාර දිස්ත්‍රික් ලේකම්, රජයේ නිලධාරීන්, සිවිල් වැසියන් ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

## අභිමානවත් 17 වන සංවත්සරය සමරමින්





61 වන පාබල සේනාංකය, ආරම්භ කර වසර 17ක් සපිරිම නිමිත්තෙන් ඉකුත් මැයි මස 27 හා 28 යන දෙදින තුළදී සුවිශේෂී වැඩසටහන් මාලාවක් සිදුකෙරිණ. එහි ප්‍රධාන අංගයක් ලෙස ගාල්ල සම්බෝධි ළමා/වැඩිහිටි නිවාසයේ නේවාසිකව සිටින විශේෂ අවශ්‍යතා සහිත 50 දෙනකු වෙනුවෙන් සත්කාරක වැඩසටහනක් දියත් කෙරිණ. එම සේනාංකයේ වත්මන් සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ එහි භටපිරිස් මේ සඳහා එකතු වූහ. එහිදී, දීර්ඝ කාලයක් පුරාවට ගොඩගැසී තිබූ කසල හා අනෙකුත් අපද්‍රව්‍ය ශ්‍රමදානයක් මඟින් ඉවත්කිරීම, නිවාසය අවට ප්‍රදේශය හා ගොඩනැඟිලි සියල්ල ශුද්ධ පවිත්‍ර කිරීම, අක්‍රමවත්ව පැවති විදුලි පද්ධතිය යථා තත්වයට පත් කිරීම, නේවාසිකව සිටින වැඩිහිටියන් හා දූ දරුවන් සියලුදෙනාගේ කොණ්ඩ කපා ස්නානය කරවීම, වෛද්‍ය ප්‍රතිකාර අවැසි නේවාසිකයන් හට ප්‍රතිකාර ලබාදීම සිදුකෙරිණ.

## ආතතිය කළමනාකරණය පිළිබඳ දේශනයක්





22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩීඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ මඟපෙන්වීම මත එම සේනාංකය යටතේ ඇති පාබල සේනාංක සහ ඒකකයන්හි රාජකාරි ඉටුකරනු ලබන භටපිරිස් 100ක් සඳහා ආතතිය කළමනාකරණය පිළිබඳ දේශනයක් පසුගිය ජූනි මස 26 වන දින පැවැත්විණ. එම සේනාංක මූලස්ථානයේදී පැවති මෙම දේශනය ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු නිලධාරි ඉරෝන් ජයසේකර මහතා විසින් පැවැත්වූ අතර, ඒ සඳහා නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.

# තැන තැන පොසොන් අසිරිය



## ස්වේච්ඡා බල සේනා මූලස්ථානය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී ගේ උපදෙස් පරිදි එම මූලස්ථාන හටපිරිස් සහ යුද්ධ හමුදා බෞද්ධ බලමණ්ඩලය එක්ව සංවිධානය කරන ලද සීල සමාධි වැඩසටහනක් පසුගිය ජුනි 10 වන දින පනාගොඩ ශ්‍රී බෝධිරාජාරාමයේදී පවත්වනු ලැබූහ.





## ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි)





වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ මඟපෙන්වීම මත එම මූලස්ථාන හටපිරිස් එකතුව පොසොන් සැමරුම් මාලාවක් පැවැත්විණ. එහිදී, රුවන්වැලි සෑය, අභයගිරිය, ලංකාරාමය සහ ථූපාරාමය ආදී ආගමික සිද්ධස්ථාන පිරිසිදු කිරීමත් සඳහිරු සෑය ස්ථූප පරිශ්‍රයේ දී බත් දන්සැලක් පැවැත්වීමත් සිදුකෙරිණ.

## ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර)





පොසොන් පොහොයට සමගාමීව නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේදී ද බෝධි පූජාවක් සහ ධර්ම දේශනාවක් පැවැත්විණ. එම ධර්ම දේශනය පූජ්‍ය දෙල්විට මෙත්තකංකර හිමියන් පැවැත්වූ අතර, එම අවස්ථාව සඳහා යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවකයින් රැසක් සහභාගී වූහ.

## ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර)





කැන්දලන්ද නිලධාරි විවාහක නිවාස සංකීර්ණයේ නේවාසික යුද්ධ හමුදා නිලධාරීන්ගේ පවුල්වල සාමාජිකයන් විසින් 2025 ජූනි මස 11 වන දින එම විවාහක නිවාස සංකීර්ණය ඉදිරිපිටදී අයිස්ක්‍රීම් සහ කිරි තේ දන්සැලක් පවත්වනු ලැබූහ. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා විධායක ජෙනරාල් සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී, බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු නිලධාරින්, සෙසුනිලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් රැසක් සහභාගි වූහ.

## ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම)





පොසොන් පොහොයට සමගාමීව මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ගේ මඟපෙන්වීම මත එම මූලස්ථාන නිලධාරීන් සහ සෙසුනිලයින් එක්ව සමහන් දන්සැලක් පසුගිය ජූනි මස 11 වන දින එම මූලස්ථාන ජන අවහන්හල ඉදිරිපිටදී පවත්වනු ලැබූහ.



23 වන පාබල සේනාංකය වෙතින් ද පොසොන් පොහොය නිමිත්තෙන් බෝධිපූජා පිංකමක්, සුමදුර ධර්ම දේශනයක්, බත් දැන්සැලක් සහ පහන් කුඩු ප්‍රදර්ශනයක් පැවැත්වීය.



59 වන පාබල සේනාංකය වෙතින් කණ්නගි අම්මාන් කෝවිලට පැමිණෙන බැතිමතුන් සඳහා පැවැත්වූ කොත්තමල්ලි සහ සීනි සම්බල් බනිස් දන්සැල.



21 වන පාබල සේනාංකය වෙතින් එම මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්වූ කොස් දන්සැල.



122 වන පාබල බලසේනාව වෙතින් වීරවිල ඇපරල් ඇඟලුම් කර්මාන්ත ශාලා පරිශ්‍රයේදී පැවැත්වූ මඤ්ඤොක්කා දන්සැල.



අභිමංසල 2 සුවසහන නිකේතනය වෙතින් ද ජංගම භක්ති ගීත වැඩසටහනක් පැවැත්විය.



වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව වෙතින් සුමදුර ධර්ම දේශනයක්, බත් දන්සැලක් සහ අයිස්ක්‍රීම් දන්සැලක් පවත්වන ලදී.



යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව දඹුල්ල වලගම්බා මහා පිරිවෙන් පරිශ්‍රයේදී පැවැත්වූ පහන්කුඩු ප්‍රදර්ශනය සහ මඤ්ඤොක්කා දන්සැල.



විශේෂ බලකාය සහ එම සේවා වනිතා ශාඛාව එක්ව සංවිධානය කරන ලද කඩල සහ කිරි තේ දන්සැල.



241 වන පාබල බලසේනාව වෙතින් සංවිධානය කෙරුණු අයිස්ක්‍රීම් දන්සැලක් එම මූලස්ථානය ඉදිරිපිට දී පැවැත්විණ.



221 වන පාබල බලසේනාව ගෝකණ්න රජමහා විහාරස්ථානය ඉදිරිපිට පැවැත්වූ කඩල දන්සැල.



56 වන පාබල සේනාංක මූලස්ථානයේ භටපිරිස් එකතුව වව්නියා බස් නැවතුම්පොළ පරිශ්‍රය ඉදිරිපිටදී පැවැත්වූ බෙලිමල්, කඩල, මඤ්ඤොක්කා සහ කොත්තමල්ලි දන්සැල.



යුද්ධ හමුදා පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව වෙතින් පනාගොඩ බෝධිරාජාරාම විහාරස්ථාන පරිශ්‍රයේදී පැවැත්වූ කඩල දන්සැල.



පාබල හමුදා සේවා වනිතා ශාඛාව මගින් එම රෙජිමේන්තු මූලස්ථාන සිල්වර් බියුගල් ආපන ශාලාව අසල දී පැවැත්වූ මඤ්ඤොක්කා දන්සැල.



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව වෙතින් අඹේපුස්ස දුම්රිය ස්ථානය අසල දී පැවැත්වූ සීනි සම්බල් බනිස් සහ කිරි කෝපි දන්සැල.



8 බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව වෙතින් ද සාගම මංසන්දියේදී සව් දන්සැලක් පවත්වන ලදී.



2(ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුව වෙතින් එම කඳවුරු පරිශ්‍රයේදී පැවැත්වූ සව් දන්සැල.

# සේවා වනිතාවෙන් පරිත්‍යාග රැසක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මියගේ මඟපෙන්වීම මත යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දුවා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින්, ඉකුත් ජුනි මස 04 වන දින පරිත්‍යාග වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ කාර්යාල පරිශ්‍රයේදී පැවති මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයු පීඑස්සී අයිජී සහභාගි විය. මෙම වැඩසටහන සඳහා අනුග්‍රාහක දායකත්වය සුභාෂිනී වීරසිංහ මහත්මිය විසින් ලබාදෙන ලදී. මෙම වැඩසටහනේ දී, 2024 වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ගණිතය හා විද්‍යා විෂය ධාරාවන්ගෙන් විශිෂ්ට දක්ෂතා දැක්වූ යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දරු දැරියන්ට ටැබ්ලට් යන්ත්‍ර හයක් පරිත්‍යාග කෙරිණි. එමෙන්ම, දැනට වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලබන රණඝිතයට පත් විශ්‍රාමික රණවිරුවකුගේ දියණියක් වෙත ලැප්ටොප් පරිගණකයක් ද පරිත්‍යාග කරනු ලැබීය.

තවද, ඉකුත් ජුනි මස 24 වන දින මෙවැනිම පරිත්‍යාග වැඩසටහනක් ක්‍රියාත්මක කෙරුණු අතර, එහිදී යුද්ධ හමුදාධිපති විසින් රුපියල් මිලියන 5ක් වටිනා Meridian චිකිත්සක යන්ත්‍රයක් රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත නිල වශයෙන් භාරදෙන ලදී. අභිමන්සල සුවතා නිකේතනවල නේවාසිකව ස්නායු ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම උපකරණය යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ සම්බන්ධීකරණයෙන් චීන ජාතික ඔන්ග් වී යීන් මහතා විසින් පරිත්‍යාග කරන ලදී.

තවද, ඕස්ට්‍රේලියාවේ පැවැත්වෙන 19න් පහළ නෙට්බෝල් තරගාවලියට සහභාගීවීමට නියමිත දිවංගත මේජර් එම්ජී විජේසේන නිලධාරීගේ දියණිය වෙත රුපියල් 100,000.00ක් ද රත්නපුර, කෙහෙල්ඔිවිට විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනය සඳහා පවතින අඩු පහසුකම් සපුරාලමින් එම විද්‍යාලය වෙත පරිගණකයක් ද පරිත්‍යාග කරන ලදී. එමෙන්ම, අභිමංසල I සුවතා නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවකු වෙත නිවසක් ඉදිකරගැනීම සඳහා මූලික වාරිකය වශයෙන් රුපියල් 400,000.00ක මූල්‍ය පරිත්‍යාගයක් ද අයවැය සහ මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සිවිල් සේවක මහතකු වෙත රුපියල් 200,000.00ක මූල්‍ය පරිත්‍යාගයක් ද යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දරු දැරියන් පස් දෙනකුගේ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා රුපියල් 100,000.00 බැගින් ප්‍රදානය කිරීම ද එහිදී සිදුවිය. තවද, 5 බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ කොමිෂන් නොලත් නිලධාරියකුගේ තුන් නිවුන් දරුවන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් කිරි පැකට් මිලදී ගැනීම සඳහා රුපියල් 144,000.00ක මූල්‍ය පරිත්‍යාගයක් ද නිවාස ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ යුද්ධ හමුදා සාමාජිකයින් වෙත ඉතිරි මුදල් පරිත්‍යාගයක් ද සිදුකරන ලදී.






2024 වර්ෂයේ අපොස උසස් පෙළ විද්‍යා, කලා විෂය ධාරාවන්ගෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශිෂ්ට සාමාර්ථ ලබාගත් දැනට සක්‍රීය සේවයේ නියුතු සහ මියගිය, රණඝිතයට පත් රණවිරුවන්ගේ දරු දැරියන් තිදෙනකු සඳහා ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 03ක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජුනි මස 09 වන දින අනුරාධපුර ජයශ්‍රී මහ බෝධි පූජා භූමි පරිශ්‍රයේදී පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් සංවිධානය කරනු ලැබූ මෙම සත්කාරය සඳහා පූජ්‍ය හාන්තේ කේ ගුණරතන ස්වාමීන් වහන්සේ පූර්ණ දායකත්වය ලබාදෙනු ලැබූහ. තවද, අභිමංසල 1 සුවසහන නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන රණඝිතයට පත් රණවිරුවන් සහ රාජකාරී නියුතු අනෙකුත් සියලුම රණවිරුවන්ගේ අධ්‍යාපනය හදාරනු ලබන දුවා දරුවන් සඳහා පාසල් උපකරණ ඇතුළත් ත්‍යාග පාර්සල් පරිත්‍යාග කිරීමක් ද එහිදී සිදුකෙරිණි. යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ස්වෙන්ද්‍රිනී දිසානායක මහත්මිය මෙම අවස්ථාවන්හි ප්‍රධානත්වය දැරුවාය.

# පල්ලෙකැලේ විරු කැකුළු පෙර පාසලේ නිරීක්ෂණ චාරිකාවක






යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනිය ඉකුත් ජූනි මස 27 වන දින පල්ලෙකැලේ විරු කැකුළු පෙර පාසලේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූහ. මෙම අවස්ථාව සඳහා මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරණායක යුඑස්පී 11 වන පාබල සේනාංකාධිපති, ඇතුළු පිරිසක් ද එක්වූහ. එහිදී, ඔවුහු පෙර පාසල නිරක්ෂණය කරමින් එහි ඉගෙනුම ලබන දුවා දරුවන් සමඟ සුහද කතාබහක ද නිරත වූහ. එසේම, පෙර පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් අවැසි උපදෙස් ලබාදෙමින් එම ආයතනයට භාණ්ඩ පරිත්‍යාගයක් ද සිදුකළහ.

# ඉන්දීය යුද්ධ හමුදා සේවා වනිතා ක්‍රියාකාරකම් දැකබලා ගනිමින්



ඉන්දීය යුද්ධ හමුදා මණ්ඩලික ප්‍රධාන ජෙනරාල් Upendra Dwivedi ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් එන්ඩීයූ පීඑස්සී අයිජී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ස්වේන්ද්‍රිනී දිසානායක මහත්මිය ඉකුත් ජූනි මස 10 සිට 15 වන දින දක්වා ඉන්දියාවේ නිල සංචාරයක නිරත වූහ.

එම සංචාරයේදී යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනිය ඉන්දියානු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ භාර්යාවන් සහ දූදරුවන්ගේ සුභසාධක සංගමය (AWWA Committee) වෙතින් සූදානම් කරන ලද විශේෂ වැඩසටහන් නැරඹීම සඳහා ද සහභාගී වූවාය. එහිදී, එම සංගමය යටතේ පාලනය වන විශේෂ අවශ්‍යතා සහිත දරුවන් රැකවරණය ලබන Asha School හි ද සංචාරය කරමින් එම දරුවන්ගේ විවිධ නිර්මාණ නැරඹීමට ද Ashwan Project යටතේ ඉන්දියානු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ භාර්යාවන් විසින් සිදුකරනු ලබන අත්කම් නිර්මාණ නැරඹීමට ද එක්වූවාය. තවද, Asha School යටතේ පවත්වාගෙන යනු ලබන Vishwas Skilling මධ්‍යස්ථානය නැරඹීමට ද සභාපතිනියට අවස්ථාව ලැබිණ. මෙම සංචාරය තුළින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය සහ ඉන්දියානු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ භාර්යාවන් සහ දූදරුවන්ගේ සුභසාධක සංගමය (AWWA Committee) අතර සුහදත්වය, මිත්‍රත්වය මෙන්ම නව අදහස් හුවමාරු කරගැනීමට ද ඉඩකඩ සැලසිණ.



# අභිමංසල I සුවතා නිකේතනයේ සංචාරයක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මිය ඉකුත් ජූනි මස 09 වන දින අනුරාධපුරයේ අභිමංසල-1 සුවතා නිකේතනයේ සංචාරයක නිරත වූවාය. මෙම සංචාරයේදී, වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීමේ දෙවන අදියර ලෙස එතුමිය විසින් නේවාසික රණවිරුවන්ගේ සංචලනය සහ සුවපහසුව වැඩි දියුණු කිරීම සඳහා රෝද පුටු 29ක් සහ කිහිලිකරු 05ක් පරිත්‍යාග කරන ලදී. තවද, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ සම්බන්ධීකරණයෙන් සිංගප්පූරුවේ සහ චීනයේ විශේෂඥ වෛද්‍යවරුන් විසින් ස්නායු රෝග සඳහා විශේෂිත තාක්ෂණයක් වන Meridian චිකිත්සක භාවිතා කරමින් රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම ද සිදුවිය.

තවද, මහනුවර රොටරි සමාජයේ අනුග්‍රාහකත්වය ඇතිව ඉකුත් ජූනි මස 18 වන දින පාන්ගොල්ල, අභිමංසල 3 සුවතා නිකේතනයේදී ඇස් කණ්ණාඩි පරිත්‍යාග වැඩසටහනක් පවත්වනු ලැබීය. එහිදී, සේවයේ නියුතු සහ විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයන් 256 දෙනෙකු වෙත ඇස් කණ්ණාඩි පරිත්‍යාග කරනු ලැබිණි. තවද, එම සුවතා නිකේතනයේ ප්‍රයෝජනය සඳහා පොල් පැළ 300ක් ද නේවාසික රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා විදුලි රෝද පුටුවක් ද පරිත්‍යාග කෙරිණ.

# රණවිරු සුබසාධන ගොඩනැගිල්ලක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ඉදිකිරීමට නියමිත රණවිරු සුබසාධන ගොඩනැගිල්ලක් සඳහා මුල්ගල තැබීම පසුගිය ජූනි මස 22 වන දින පොල්හේන්ගොඩ කඳවුරු පරිශ්‍රයේදී සිදුකෙරිණ. එම බලකා සේවා වනිතා සභාපතිනි ඉරේෂා පෙරේරා මහත්මිය ඇතුළු සාමාජිකාවන්ගේ ගෞරවනීය ආරාධනයෙන් එහි සපැමිණි යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනියගේ සුරතින් මුල්ගල තැබීම සිදුවිය. එහිදී, එම බලකා රණවිරුවන් දෙදෙනකුගේ ළඟම ඥාතීන් වෙනුවෙන් රෝදපුටු පරිත්‍යාග කිරීමක් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් 58 දෙනකු වෙනුවෙන් තෑගි වවුචර්පත් පිරිනැමීමක් ද එම අවස්ථාවට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනිය විසින් සිදුකළාය. තවද, එහිදී රෙජිමේන්තුව වෙත අත්‍යවශ්‍ය භාණ්ඩ පරිත්‍යාගයක් ද සිදුකෙරිණ.



මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද සේවා ලේකම් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්ඩියු පීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සේවා වනිතා සාමාජිකාවෝ පිරිසක් සහභාගි වූහ.





# රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් සුභසාධන වැඩසටහනක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ මඟපෙන්වීම මත ඉකුත් ජූනි මස 05 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ කාර්යාල පරිශ්‍රයේදී පරිත්‍යාග වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති සහභාගි විය. මෙම වැඩසටහනේ කොටසක් ලෙස, රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් Aptech Investments ආයතනයේ සභාපති කේඩීජීබීකේ ප්‍රනාන්දු මහතා විසින් රුපියල් මිලියනයක වටිනාකමකින් යුත් රෝද පුටු 20ක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත පරිත්‍යාග කරන ලදී. මීට අමතරව, ලෝක පරිසර දිනයට සමගාමීව Alliance Finance සමාගම වෙතින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත පැළ 2000ක් ද පරිත්‍යාග කෙරිණි.

# මූල්‍ය පරිත්‍යාගයන් රැසක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයෙහි මඟපෙන්වීම යටතේ සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවෙහි සභාපතිනි නිලන්ති විජේසූරිය මහත්මිය ඇතුළු සාමාජිකාවෝ පිරිසක් ඉකුත් ජූනි මස 14 වන දින මහරගම අපේක්ෂා රෝහලෙහි සංචාරයක් සිදුකරනු ලැබූහ. එහිදී, රෝගීන් සඳහා දෛනිකව අත්‍යවශ්‍ය වන රුපියල් 250,000.00ක් වටිනා බෙහෙත් ද්‍රව්‍ය ප්‍රදානය කිරීමට ද ඔවුහු කටයුතු කළහ.

---





විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛා සභාපතිනි අප්සරා පීරිස් මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි මස 03 වන දින වෛද්‍යාධාර මුදල් පිරිනැමීමක් හා රණවිරු දියණියකගේ ක්‍රීඩා දක්ෂතා ඇගයීමක් සිදුකෙරිණ. ඒ අනුව එම රෙජිමේන්තුවට අයත් 1 විදුලි හා යාන්ත්‍රික බලකාය යටතේ රාජකාරි කරනු ලබන සෙ/628634 මාණ්ඩලික සැරයන් පුෂ්ප කුමාර එම්ජීජේ යන ජ්‍යෙකොනොනිගේ අමයුරු පස්රුක පුතණුවන් හට කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහල වෙතින් ඇටමිදුළු බද්ධ කිරීමේ ශල්‍යකර්මයක් සිදුකිරීමට නියමිත බැවින්, ඒ සඳහා රුපියල් 165,000.00ක මුදලක් පරිත්‍යාග කෙරිණ.

එමෙන්ම, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා මූලික වැඩපළ (කොළඹ) යටතේ රාජකාරි කරනු ලබන සෙ/2එම්01620 කෝප්‍රල් පුෂ්ප කුමාර එම්ජී යන අයගේ දියණිය වන නෙතුමිනි උමාෂා රත්සරණි දියණිය ජපානයේ පැවති ටයිකොනේඩෝ තරඟාවලියක් ජයග්‍රහණය ලැබීම හේතුවෙන් ඇගේ ක්‍රීඩා දක්ෂතා අගයමින් ඇය හට තිළිණ ප්‍රදානයක් ද සිදුකෙරිණ.

## වැඩිහිටි නිවාසයට දානයක්



මියගිය/ආබාධිත රණවිරුවන් හට සෙත්පතා අංක 2/3, තල්ගස්ගොඩ පාර, පොල්වත්ත අම්බලන්ගොඩ යන ලිපිනයෙහි පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත දහවල් දානය ලබාදීමේ සත්කාරයක් පසුගියදා සන්නද්ධ බුද්ධි බලකා සේවාවනිතා ශාඛාවේ මැදිහත්වීමෙන් සිදුකෙරිණ.

## පාසල් උපකරණ බෙදාදීමක්



විශේෂ බලකා සේවා වනිතා ශාඛාව වෙතින් වවුනියාව, මඩුකන්ද, මහමයිකුලම්හි විරුමුතු පෙර පාසලේ දුවා දරුවන් වෙත පාසල් උපකරණ බෙදාදීමේ සත්කාරයක් ඉකුත් මැයි මස 31 වන දින සිදුකෙරිණ.

## ළදරු කිරිපිටි බෙදාදීමක්



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ එක්ව රණවිරුවන් දෙදෙනකුගේ තුන් නිවුන් දරුවන් සඳහා ළදරු කිරිපිටි ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 31 වන දින සිදුකළහ. ඒ අනුව කෝප්‍රල් සෝමතිලක එච්බීඑල් සහ ලා/කෝ ජයරත්න පීජීඅයිකේ යන කොනොනින්ගේ ළදරුවන්ට මාස 4ක කාලයක් සඳහා ළදරු කිරිපිටි පැකට් ලබාදෙනු ලැබීය.

## අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාගයක්




සේවා බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික වැඩසටහනට සමගාමීව තිසාවැව යුද හමුදා කඳවුරේදී එම බලකා පාසලෙහි සේවය කරන සිවිල් සේවකයින් 68 දෙනකුට සහ ඔවුන්ගේ පවුල් වෙත අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට ද සියලුම සහභාගීවූවන් සඳහා විශේෂිත දිවා ආහාර වේලක් ද පිරිනැමීමට කටයුතු කෙරිණ.

## අනුස්මරණ වැඩසටහනක්



ක්‍රියාන්විතයේදී මියගිය සහ අතුරුදහන් වූ ගැමුණු හේවා බලකායට අයත් කුරුණෑගල, අනුරාධපුර ප්‍රදේශයන්හි වෙසෙන අවිවාහක රණවිරුවන් අනුස්මරණය කිරීමේ වැඩසටහනක් අනුරාධපුර රුවන්වැලි සෑය සහ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස දී ඉකුත් ජුනි මස 14 සහ 15 යන දෙදින තුළ පැවැත්විණ. මෙම වැඩසටහනට ගැමුණු හේවා බලකා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ද එක්විය.

## අනුස්මරණ වැඩසටහනක්



යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම ඉකුත් ජුනි මස 22 වන දින රෙජිමේන්තු නිලධාරි නිවස්නයේ දී පවත්වනු ලැබූහ. එහිදී, එම රෙජිමේන්තුව යටතේ රාජකාරි කරනු ලබන කොනොනින් දෙදෙනකු හට රෝද පුටු පරිත්‍යාගයක් ද තවත් කොනොනින් දෙදෙනකු හට වෛද්‍යාධාර මුදල් ද සිවිල් සේවක මහත්ම මහත්මීන් 58 දෙනකු හට වච්චර්පත් ප්‍රදානයක් ද සිදුකෙරිණ.

# රෙජිමේන්තු සේවා වනිතා නව සභාපතිනියන්



ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස උදාරි අනුපමා ගමගේ මහත්මිය පසුගිය ජුනි මස 26 වන දින පත්ව ඇත. එතුමිය එම තනතුරේ වැඩ භාරගැනීමට සමගාමීව ආබාධිත රණවිරුවකුට ඔහුගේ සනීපාරක්ෂාව වෙනුවෙන් ඉදිවන නාන කාමරයේ ඉදිරි කටයුතු සිදුකර ගැනීම වෙනුවෙන් මුල්‍ය පරිත්‍යාගයක් ද සිදුකෙරිණ.



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස කුමාරි පල්ලෙකුඹුර මහත්මිය ඉකුත් ජුනි මස 30 වන දින පත්ව ඇත. එම තනතුරේ වැඩ භාරගැනීමට සමගාමීව පිළිකා රෝගයට ප්‍රතිකාර ලබන කොමිෂන් නොලත් නිලධාරියකුගේ භාර්යාවක් වෙත රෝද පුටුවක් ද පරිත්‍යාග කෙරිණි.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස නිරෝෂිකා කරුණාපාල මහත්මිය ඉකුත් ජුනි මස 26 වන දින සිට පත්ව ඇත.



ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය වශයෙන් සුමංගලී පතිරවිතාන මහත්මිය ඉකුත් ජුනි මස 20 වන දින සිට පත්ව ඇත.

## ඖෂධ මිලදී ගැනීමට මූල්‍යාධාර




ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාව වෙතින් ඉකුත් ජුනි මාසය තුළ ප්‍රජාසත්කාරක වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කෙරිණ. එහිදී, මහරගම අපේක්ෂා රෝහල වෙත රුපියල් 70,000ක් වටිනා අත්‍යවශ්‍ය ඖෂධ පරිත්‍යාග කිරීමත් එහි නේවාසික රෝගීන් දෙදෙනකු සඳහා ඖෂධ මිලදී ගැනීම වෙනුවෙන් මූල්‍යාධාර ලබාදීමත් සිදුකෙරිණ.

## පියයුරු පිළිකා සබැඳි දේශනයක්



ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාව විසින් පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ඉකුත් ජුනි මස 25 වන දින පනාගොඩ එම රෙජිමේන්තු මූලස්ථානයේදී පැවැත්විණ. මෙම දේශනය මහරගම ඉන්දිරා පිළිකා භාරයේ වෛද්‍ය ලංකා දිසානායක සහ ඇයගේ කණ්ඩායම විසින් මෙහෙයවන ලදී.



අමාරුම අවස්ථාවලදි පවා පරිස්සමින් වචන පාවිච්චි කිරීම තුළින් සබඳතාවය නිරෝගීව වර්ධනය වනු ඇත. ගෞරවනීය සන්නිවේදනයේදී අපහාස, නින්දා කිරීම් හෝ පුද්ගලික ප්‍රහාර එල්ල කරන්නේ නැහැ. ගෞරවය තියෙන තැන හැමෝටම තමන්ව වැදගත්. එය අවබෝධ කරගෙන සංවාදයේ යෙදීම තුළින් ශක්තිමත් සබඳතාවකට ඉඩකඩ ලබාදේ.

## ස්වයං විනය තුළින්

# යහපත් නිරෝගී සබඳතා ගොඩ නඟමු

මිනිසා යනු ස්වභාවයෙන්ම සමාජීය සත්ත්වයෙක්. එසේ හෙයින් ඔවුන් හුදෙකලාවම ජීවත් වීමට ප්‍රිය නොකරයි. සමාජයේ ජීවත් වනවිට බොහෝ දෙනකුට යහළු මිත්‍රයෝ ඉන්නවා කියලා හිතනවා. ඒත් ඇත්තටම අපේ ජීවිතේට තේරුමක් දෙන්නෙ හදවතට සමීප අපිට ශක්තියක් වෙන බැඳීම් පමණයි. මේ බැඳීම් බොහෝ වෙලාවට තාවකාලිකව ඇතිවන බැඳීම් නම් නොවෙයි. ගෞරවය, විශ්වාසය, සංවේදනය යන මුල් ගල් තුනේ එකතුවෙන් මෙම බැඳීම් නිර්මාණය වේ. ඉතින් නිරෝගී සබඳතා යනු මොනවාද? එම සබඳතා නිවැරදිව ගොඩනඟා ගන්නේ කෙසේද යන්නත් පිළිබඳව ටිකක් ගැඹුරින් සිතා බලමු.

ඕනෑම ආකාරයක නිරෝගී බැඳීමක මූලිකම පදනම වන්නේ ගෞරවයයි. එනම් අනෙකාගේ වටිනාකම ගැඹුරින් අවබෝධ කර ගැනීමට ඇති හැකියාවයි. එම හැකියාවේ පවතින ස්වභාවය මත සබඳතාවයේ ගුණාත්මකභාවය තීරණය කරනු ලබයි. අනෙක් පාර්ශවයෙහි වටිනාකම සහ ගෞරවය හඳුනා ගැනීම එතරම් පහසු නොවෙන්න පුළුවන්. මේ සඳහා අනුගමනය කළ හැකි ඉතාම සරල නමුත් වැඩි වටිනාකමක් සහිත ක්‍රියාකාරකම් පිළිබඳව අවධානය යොමු කරමු.

## ක්‍රියාශීලීව ඇහුම්කන් දීම

කෙනෙක් කතා කරනකොට එයාට සම්පූර්ණ අවධානය දෙන්න. එයාට බාධා නොකර ඔබේ පිළිතුර හදා ගැනීමට කලබල නොවී අහන් ඉන්න. එයාගේ අදහස් හෝ තීරණ සමඟ ඔබ එකඟ නොවෙන්න පුළුවන්. ඒත් ඒ කෙනාට ගෞරවයෙන් ඇහුම්කන් දෙන්න.

## සීමා මායිම්වලට ගරු කිරීම

අනිත් කෙනාගේ පෞද්ගලික ඉඩකඩට, අවකාශයට, නිදහසට, හැඟීම්වලට මෙන්ම කාලයට ගරු කරමින් සබඳතාවය පවත්වාගෙන යාමට උත්සාහ කරන්න.

## වෙනස්කම් පිළිගැනීම

හැම කෙනාම එකිනෙකාගෙන් වෙනස් බව තේරුම් අරගෙන ඒ වෙනස්කම් පිළිගන්න එක ඉතාම වැදගත්. නිරෝගී සම්බන්ධතා කියන්නේ හැමෝම තමන් සිතන පතන ආකාරයටම හැසිරිය යුතු බව නම් නොවෙයි. සමහර වෙලාවට අදහස් වෙනස් වෙන එකත් හොඳ වටපිටාවක් නිර්මාණය කරනු ලබයි.

## කාරුණිකව කතා කිරීම

අමාරුම අවස්ථාවලදී පවා පරිස්සමින් වචන පාවිච්චි කිරීම තුළින් සබඳතාවය නිරෝගීව වර්ධනය වනු ඇත. ගෞරවනීය සන්නිවේදනයේ දී අපහාස, නින්දා කිරීම් හෝ පුද්ගලික ප්‍රහාර එල්ල කරන්නේ නැහැ. ගෞරවය තියෙන තැන හැමෝටම තමන්ව වැදගත්. එය අවබෝධ කරගෙන සංවාදයේ යෙදීම තුළින් ශක්තිමත් සබඳතාවකට ඉඩකඩ ලබාදේ.

## විශ්වාසවන්තකම සහ ස්ථාවරත්වය

විශ්වාසය කියන්නේ සම්බන්ධතා එකට ගොතන ඉක්මනින් බිඳෙන සුළු ඒත් ශක්තිමත් නූලක්. ඒ කියන්නේ අනිත් කෙනා අවංකව, විශ්වාසවන්තව අපේ හොඳම දේ ගැන හිතලා වැඩ කරයි කියලා හිතන එක. විශ්වාසය ගොඩනගන්න කාලය සහ උත්සාහය යන දෙකම අවශ්‍ය වෙනවා. ලොකු පොරොන්දුවක් වුණත් පොඩි පොරොන්දුවක් වුණත් පොරොන්දු ඉටුකිරීම තුළින් බැඳීම් ස්ථාවරවීම සිදුවේ.

## අවංකකම සහ විවෘතභාවය

අමාරුම මොහොතක වුණත් ඇත්ත කියන එක යහපත් බැඳීමක හොඳම පදනමයි. හැම දෙයක්ම හැම තිස්සෙම විවෘතව කියන්න ඕනෙ නැති වුණත්, දෙදෙනාටම වැදගත් දේවල් සම්බන්ධයෙන් විවෘත වෙන එක හොඳයි. අනිත් අයගේ පෞද්ගලිකත්වයට ගරු කරන ගමන් තමන්ගේ පෞද්ගලිකත්වය උපරිමයෙන් විඳින්න.

## සමාව දීම සහ වගකීම භාරගැනීම

විශ්වාසය කඩ වූ මොහොතක වුණු වැරැද්ද පිළිඅරගෙන වගකීම භාරගෙන වැරැද්ද හදාගන්න ඇත්තටම මහන්සි වෙන එක හරිම වැදගත්. අනිත් පැත්තෙන් පුළුවන් නම් සමාව දෙන්න පුරුදු වෙන එකත් සම්බන්ධතා ශක්තිමත් කිරීමට උදව් වෙනවා. විශ්වාසය නැතිනම් සම්බන්ධතා හරිම දුර්වල වනවා පමණක් නොව බියෙන් සහ අවිනිශ්චිතභාවයෙන් පිරී තිබීමත් සාමාන්‍ය තත්ත්වයකි.

## සංවේදනය

අනිත් කෙනාගේ හැඟීම් තේරුම් අරන් ඒවා බෙදාගන්න පුළුවන් නම් එය මනා සංවේදනය ලෙස හැඳින්විය හැක. ඒ කියන්නේ අනෙක් කෙනා කරන කරන දේට ඔබ එකඟ වෙන එක නම් නෙවෙයි. එයාගේ හැඟීම් තේරුම් ගන්න එක. මනා සංවේදනයෙන් ගැඹුරු බැඳීම් ඇති වෙනවා.

## විනිශ්චය නොකර සවන් දීම

උපදෙස් දෙන්න හරි විනිශ්චය කරන්න හරි නෙවෙයි, තේරුම් ගන්න එක වගේම අහගෙන ඉන්න එකත් දිව්‍යමය ඔසුවක් වෙන්න පුළුවන්. සමහර වෙලාවට කෙනකුට ඕනේ ඇහුම්කන් දෙන කෙනෙක් විතරක් වෙන්න පුළුවන්.

අනිත් කෙනාගේ හැඟීම් එලෙසම තේරුම් ගන්න බැරි වුණත්, එයාට එහෙම දැනෙනවා කියලා පිළිගන්න එක හරිම වැදගත්. "ඔයාට එහෙම දැනෙන එක සාධාරණයි" වගේ වාක්‍යයක් හරිම බලවත් වෙන්න පුළුවන්. අනිත් කෙනාට අමාරු වෙලාවට එයා ළඟින් ඉඳලා අවශ්‍ය උපකාරය දෙන එකට වැඩි වටිනාකමක් එකතු වෙනවා. සංවේදනයෙන් අනුකම්පාව වැඩි වෙනවා. පුද්ගලයන් අතර චිත්තවේගීය බැඳීම ශක්තිමත් කරනවා. ඒකෙන් නියම අවබෝධයක් සහ සහයෝග යක් ඇති වෙනවා. නිරෝගී සම්බන්ධතා ගොඩනඟන එක එකපාරටම කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. ඒක දිගටම සිද්ධ වෙන ක්‍රියාවලියක්. ඒකට අවධානය, තමන් ගැන අවබෝධය සහ අනිත් අය එක්ක ගැඹුරින් සම්බන්ධ වෙන්න අවංක ආශාවක් ඕනේ. ඔබේ ජීවිතයේ තියෙන සම්බන්ධතා ගැන මොහොතක් හිතලා බලන්න. ඒවා ගෞරවය, විශ්වාසය සහ සංවේදනය මත පදනම් වෙලාද තියෙන්නේ? එහෙම නැතිනම් ඒ පදනම් ශක්තිමත් කරන්න පුළුවන් කොහොමද?

මේ ගල් කුලුනු තුන පුරුදු කරන එකෙන් ඔබේ ජීවිතය වටිනවා විතරක් නෙවෙයි, වඩාත් සම්බන්ධ වූ කරුණාවන්ත ලෝකයක් ඇති කරන්නත් ඔබ දායක වෙනවා.

"ඔබ වැඩිපුරම කාලය ගත කරන පුද්ගලයින් පස් දෙනාගේ සාමාන්‍යය තමයි ඔබ" මෙහි ලොකු ඇත්තක් තියෙනවා. අපි ඇසුරු කරන අය අපේ මනසට, ශක්තියට, අපේ සාර්ථකත්වයට සහ සතුටට ගොඩාක් බලපානවා. ඔයාගේ ජීවිතය වෙනුවෙන් ඔයාට ගන්න පුළුවන් ප්‍රබලම පියවරක් තමයි ධනාත්මක පුද්ගලයින් සමඟ ඇසුරු කිරීම. එතුළින් නිරෝගීමත් යහපත් සබඳතා ගොඩනඟා ගැනීමට පහසුවක් වනු ඇත.




**දිල්මී ශානුකී**

**වාණිජවේදී (විශේෂ) උපාධිධාරි)**
**පේරාදෙණිය විශ්ව විද්‍යාලය.**



# සොඳුරු මිනිසෙක් වීමට

මේ ලෝකයේ ජීවත්වන සියලු සත්වයෝ සැප විඳින්නට කැමතිය. සියලු සත්වයෝ සතුටින් ජීවත්වන්නට කැමතිය. හඬමින් දුක්බර ජීවිතයක් ගත කරන්නට කිසිවකු කැමැති වන්නේ නැත. වචනයකින් හෝ සීරීමකින්වත් තමන් පීඩාවට පත්වන්නට කිසිවකු කැමති වන්නේ නැත.

## සොභාදහමේ අනිර්වචනීය නීතිය

අප ජීවත්වන මෙම ලොව පවතින ස්වභාව ධර්මයාගේ අනිර්වචනීය නීති මාලාවක් ඇත. අප යමක් දෙන්නෙමුද? යමක් පවසන්නෙමුද? යමක් සිතන්නෙමුද? එයම අපට කිහිප ගුණයකින් ලැබීම ඉන් සුවිශේෂී එක් නීතියකි. කර්ම විපාක වශයෙන් අප හඳුන්වන්නේ මෙම සොඳුරු නීතියයි. මෙම කරුණ මනාව අදහාගත් කළ මහත් ආශ්චර්යමත්වූ සුවිශාල විප්ලවයක් ඔබ තුළ සිදුවේවි. ඔබ යමක් ලබාගැනීමට කැමති වන්නේ නම් එයම දීමට හුරුවනු ඇත. එයයි මෙහි අසිරිය.

## තමා උපමා කරන්

අප හා කවරකු හෝ ප්‍රසන්නව සිනාසී කතාබහ කරනවනම් අප කැමැතියි අප පීඩාවට පත්නොවී සිටින්නට, අපට ප්‍රශංසා ලැබෙනවට අපි කැමතියි. කිසිවකු හෝ අපට අවමන් කරනවනම් ඔච්චම් කරනවනම් සමච්චලයට ලක්කරනවානම්, බනිනවානම්, අතින් පයින් ආයුධවලින් ගහනවානම්, අපහට ලැබියයුතු කීර්ති, ප්‍රශංසා, ලාභ, වරප්‍රසාද, වලක්වනවානම් අප එයට කැමතිද? කොහෙත්ම නැහැ. මේ කරුණ හොඳින් සිතෙහි රඳවාගන්න. දැන් ඔබ අන් අයව තමා ලෙස උපමා කරගන්න. හරි දැන් කියන්න. ඔබට තවත් කෙනකුට ඔරවන්න පුළුවන්ද?, බනින්න පුළුවන්ද? ගහන්න පුළුවන්ද? අවමන් කරන්න පුළුවන්ද? පීඩාවට පත්කරන්න පුළුවන්ද? බැහැ. හේතුව මොකක්ද? "මට මේ ආකාරයෙන් අන් අය සලකනවානම් මට කොච්චර දුක හිතෙනවාද? ඒ වගේ නේද එයාලටත් දුක හිතෙන්නේ ඒ වගේ දුකක් පීඩාවක් මම එයාලට දෙන්නේ නැහැ. මගේ ක්‍රියාවක් නිසා හෝ මගේ වචනයක් නිසා හෝ තවත් කෙනෙක්ව මම පීඩාවට පත්කරන්නේ නෑ" කියලා හිතන්නට පෙලඹීමය. මේ ආකාරයෙන් සිතීමට හේතුව ඔබතුළ අතිශයින්ම උතුම් මානුෂීය ගුණාංගයක් ඔබ තුළ තිබීමය.

මේ ලොකයේ ජීවත්වන සියලුදෙනා කුමන හෝ ආකාරයකින් මානසිකව නැතිනම් කායිකව  පීඩාවකට පත්වී සිටින්නෝය. ලෝකයේ මොන මුල්ලකවක් පූර්ණව ජීවත්වන මිනිසකු සොයා ගැනීම අසීරු කරුණකි. මේ ලෝකයා ආදරය "කරුණාව, මෘදු වචන ආදිය නොලැබීමෙන් මහත් මානසික වෙහෙසකට සහ දොම්නසකට පත්වී සිටිති. ඔවුන් මානසිකව බොහෝ පීඩාවට පත්ව කායිකවද රෝගී වෙත්. තවත් බොහෝ පිරිස් මේ හේතුවෙන් තම වටිනා ජීවිතද නසා ගනිති. සියල්ලෝම මොනයම් හෝ ආකාරයකින් පීවන අරගලයක යෙදී සිටිති. එදිනෙදා අප මුනගැසෙන්නවුන්ගේ චරිතාපදාන, ඔවුන්ගේ කටුක අත්දැකීම්, දුක්ඛිත අතීත සංසිද්ධි අප නොදන්නෙමු. එබැවින් හමුවන සියලුදෙනා වෙත කරුණාව නම් සිහිල් දිය දහරින් සංග්‍රහ කිරීමට අමතක නොකරන්න. ඔබට ඔවුනට වචනයකින් හෝ ඉරියව්වකින් හෝ අස්වැසිල්ලක් වියහැකි නම් සිතන්න. ඔබ කෙතරම් සොඳුරු මිනිසකුද කියා.

## සිනහවෙන්න

කෝටි ප්‍රකෝටි ගණන් සත්වයන් අතරින් මිනිසාටම අවේණික ඉතා වටිනා එක් හැකියාවක් ඇත. ඒ නම් සිනාසීමේ හැකියාවයි. ඔබ ඉදිරියට එන හඳුනන නොහඳුනන කවරකුට වුවද සතයක් හෝ වියදම් නොකොට එක් සිනහවකින් ඔවුන්ගේ මනස පුබුදුවාලන සංග්‍රහයක් කිරීමේ හැකියාව ඔබතුළ ඇත. එයට ශතයක් හෝ වියදමක් වන්නේ නැත. උගත් නූගත්, ධනවත්, දුප්පත්, ලස්සන, අවලස්සන උසස්, පහත් යන භේදයන්ට එම සිනහව බිලිදෙන්න එපා. ඔබ ඉදිරියෙහි එන කෙනකු හට මුළු හදවතින්ම සුභ උදෑසනක්, සුභ දවසක් පතන්න. එය ඔබට උපමාකර බලන්න. කිසිවකු ඔබට පලමුව ප්‍රසන්නව සිනාසී මුළු හදින්ම සුභ දවසක් පතනවානම් ඔබ කෙතරම් සතුටු වේවිද කියා. එම සතුට එම තෘප්තිය ඔබ අන් අයට දන්දෙන විට

ඉහත සඳහන් කළ ස්වභාව නීතිය ඔබටද එයම දායාද කරයි පුදුමයි නේද?

## සමගිව වාසය කිරීමට උපකාරීවන කරුණු

මිනිසා යනු සමාජ ජීවියකු යැයි ග්‍රීක පඬිවරයකු වූ ඇරිස්ටෝටල් පවසා ඇත. තනි පුද්ගල එකතුවක් වූ සමාජයේ ජීවත්වන අපි විවිධාකාර මතිමතාන්තර, අදහස් සහිත පුද්ගලයින් සමඟ ජීවත්විය යුතුය. මෙය සමාජයේ කුඩාම එමෙන්ම ප්‍රබලම ඒකකය වන පවුලටද අදාළ වේ. එක කුසේ ඉපදුනු සහෝදරයින් අතර මෙන්ම දෙමාපියන් දූදරුවන් අතර වුවද බොහෝවිට විවිධාකාර මතයන්, විවිධාකාර රුචිකත්වයන්, විවිධාකාර ඉලක්කයන් ආදින් තිබිය හැක. සමූහයක් වශයෙන් ජීවත් වන කල්හි, අප පුද්ගලයින් වශයෙන් එකිනෙකා පිළිබඳ මනා අවබෝධයකින් සිටීම මෙන්ම අප අතර ජීවත්වන අන් ජාතීන්ගේ ද සිතුම් පැතුම්, ආගමික සංස්කෘතිකාංග පිළිබඳව මනා අවබෝධයකින් ගෞරවාන්විතව වාසය කිරීම සමගිව ජීවත්වීමට මනා පිටුවහලක් වේ.

### 1. ඇති නැති තැන් වල සමසිතින්

ඔබ යමෙක් ඔබ ඉදිරියේ සිටිද්දී පමණක් ඔහුට හොඳින් සලකනවාද? යමෙක් ලඟ සිටිද්දී පමණක් යහපත් වචනවලින් කතා කරනවාද? අදාළ පුද්ගලයා ලඟ සිටියදී පමණක් ඔහු පිළිබඳ යහපත් ලෙස සිතනවාද? ඔබ සමගියට කැමති කෙනෙක්නම්, තමාගේත් අන් අයගේත් යහපත කැමති නම් තවදුරටත් එසේ කරන්න එපා. ලඟ සිටියද, නොසිටියද යමෙක් කෙරෙහි සමසිතින් කටයුතු කරන්න. ළඟ සිටියද, නොසිටියද ඔබට ඔහු පිළිබඳව යහපත් වචන, යහපත් සිතුවිලි සිතන්නට හැකිනම් ඔබ මිනිසුන් අතර විරල මිනිසෙකි.

### 2. සුළු දෙයක් වුවද බෙදාහදාගෙන කන්න

මෙය බැලූබැල්මට එතරම් වැදගත් නොවූ කරුණක් ලෙස පෙනෙන්නට පුලුවනි. නමුත්, මේ කුඩා කරුණ සමගිය වර්ධනය වීම පිණිස බලපාන ප්‍රබල කරුණකි. ඔබ සිතා බලන්න ඔබත් සමඟ එකට සිටින යමෙක් තමන්ට ලැබුණු ප්‍රනීත ආහාරයක් තනිවම අනුභව කරනවානම් එය ඔබතුළ යම්කිසි අප්‍රසන්න හැඟීමක් ඇති කිරීමට හේතුවෙන්න පුලුවනි. එම අප්‍රසන්න හැඟීම "අසමගිය ඇතිවීමට මුල්වේ" යන්න ඔබට සිතාගත හැකිද? එමෙන්ම, යමෙක් තමන්ට ලැබුණ පොඩි වෙරළු ගෙඩියක්, කුඩා චොකලට් කැල්ලක් වැනි සුළු දෙයක් පවා ඔබ වෙනුවෙන්ම ඉතිරිකර ඔබ පැමිණිවිට එය දෙනවානම් ඔබට ඔහු කෙරෙහි කෙතරම් සෙනෙහසක් දැනෙනවා ඇද්ද? සෙනෙහස මුසු ඒ හැඟීම නූපන් සමගිය ඇතිවීම පිණිසද උපන් සමගිය තවදුරටත් වර්ධනයවීම පිණිසද, අතිශයින්ම උපකාරී වේ.


### 3. සමාන ආකල්ප

පිරිසක් වාසය කිරීමට බෙහෙවින්ම උපකාරී වන ප්‍රබල කරුණ නම් මෙයයි. එනම්, යම් පිරිසක් එකට වාසය කරයිද? එම පිරිස ආකල්පවලින් සමාන වීමය. යහපත්ව පින් දහම් කරගෙන ජීවත් වන පිරිසකට පාපීව ජීවත් වන පිරිසක් සමඟ වාසය කිරීම අපහසුය. එහි සමගියක් නැත්තේය. කාර්යාලයකදී "වෙහෙස මහන්සි වී එක් ඉලක්කයක් කරා වැඩ කිරීමට සියල්ලෝ එකා මෙන් උත්සහ කළ යුතුයි". යන ආකල්පයෙන් සියල්ලෝ සමානවෙද්දී එහි සමගියද ඵලදායීතාවයද වර්ධනය වේ. එහි යම් කෙනකු හෝ යම් පිරිසක් මින් ප්‍රතිවිරුද්ධ අදහස් හා අරමුණු දරයි නම් එතැන සමගියක් කෙසේනම් ඇති වේවිද? යම් පිරිසක් සමගිව වාසය කරයි නම් එතැන ආකල්ප සාමානත්වයක් අනිවාර්‍යයෙන්ම දැකිය හැකි වේ. මෙම කරුණ පවුල් පාසල් ආදි සියලු ක්ෂේත්‍රයන්ට පොදුවේ.

"අප සියලුදෙනා මනසින් උසස් බැවින් මනුෂ්‍යයෝ වන්නෙමු" තවත් මිනිසකුගේ තරාතිරම් නොබලා ඔහු/ඇය කෙරෙහි කාරුණික වීම මිනිසුන් වන අපගේ පරම යුතුකමකි. මේ අයුරින් කටයුතු කිරීම තුළින් තමාගේ මානසික පීඩා මෙන්ම අන් අයගේ මානසික පීඩාවන් ද ඔබට දුරු කළ හැකිය.

*මෙම ලිපිය ත්‍රිපිටකයේ කෝසම්බිය සූත්‍රය ඇසුරු කරගෙන ලියනලද්දකි.*

ඔබට හැකිනම් යමකුගේ
කඳුලු බිඳුවකට හේතුව නොවී සිටින්න
මුවඟට සතුටු සිනහවක් ගෙන වීමට
කුස ගින්නක් ඔබ බත්පතෙන් නිවාලන්නට
නුඹ... මිනිසුන් අතර ජීවත් වන මනුෂ්‍යයෙකි!




▪ රාධිකා සීඑල්
*Ambassodor of Education*
*(Spelizes in Translation)*
*Sworn Translator,*
*language Facilitator,*
*Justice of Peare (WI)*



CLEAN SRI LANKA

SOCIALLY . ENVIRONMENTALLY . ETHICALLY

# පොහොසත් රටක් ලස්සන ජීවිතයක්

අද වේගවත්ව ඉදිරිය බලා හැල්මේ දුවන ලෝකයේ අපි නිරන්තරයෙන් අපගේ නිවෙස් හා වටපිටාවේ පිරිසිදුභාවය, ශාරීරික සනීපාරක්‍ෂාව, ඇඳුම් පැළඳුම් සෝදාගැනීම ආදිය කෙරෙහි දැඩි ලෙස අවධානය යොමු කරන්නෙමු. නමුත්, අපගේ හදවතේ පිරිසිදුකම ගැන සිතීමට අපි කොපමණ වාරයක් නතරවී සිතනවාද? පිරිසිදු හදවතක් යනු පිරිසිදු නිවසක්. පිරිසිදු සමාජයක් සහ පිරිසිදු ලෝකයක් සඳහා පදනමයි.

හදවත යනු ඉන්ද්‍රියන් පමණක්ම නොව. එය අපගේ හැඟීම්වල, අපගේ වටිනාකම්වල ආදරයේ සහ වේදනාවේ කේන්ද්‍රස්ථානයයි. කාලයත් සමඟ ගෘහ භාණ්ඩ මත දූවිලි තැන්පත් වනවාක් මෙන් කෝපය, ඊර්ෂ්‍යාව, දුක සහ උඩඟුකම අපගේ හදවත් තුළ පැළපදියම් විය හැකිය. එය දිගු කලක් නොසලකා හැරියහොත් එය අපහට මෙන්ම සමස්ත සමාජයටම පිළිලයක් වන තරමට උත්සන්න වනු ඇත.

## හදවත පිරිසිදු කිරීමේ කලාව ඉගෙන ගනිමු

තරඟකාරීත්වයෙන් පිරුණු ලෝකයේ අපගේ වැදගත්ම මෘදුකාංගය වන හදවත අමතක කර යාන්ත්‍රිකකරණය වීමත් සමඟ සිතින් මියගිය මිනිසුන්ගේ කෲර ක්‍රියා පිළිබඳ අපට නිතර අසන්නට ද දකින්නට ද ලැබේ. පපුව තුළ ස්පන්දනය වන භෞතික හදවත මෙන් නොව ආදරය, කරුණාව, වේදනාව, සතුට සහ සමාව දීම යන චිත්තවේගීය හා අධ්‍යාත්මික හදවත පිරිසිදු කිරීම වෛද්‍ය විද්‍යාත්මකව ශල්‍යකර්මයකින් සිදුකළ නොහැක.

## හදවත පිරිසිදු කළ යුත්තේ ඇයි?

පිපෙන මල්වලින් පිරුණු ලස්සන උද්‍යානයක් ගැන සිතන්න. කිසිවකුත් එය රැකබලා නොගන්නේ නම් වල් පැලෑටි සෙමෙන් අය අත්පත් කරගනිමින් කෘමි සතුන් ඇදෙමින් එය විනාශකාරී සිදුවීම් සිදුවන කැලෑවක්. මූකලානක් බවට පත්විය හැකිය. ඒ හා සමානව අපගේ හදවත් ස්වාභාවිකව ආදරය, අනුකම්පාව සහ කරුණා දයාව ආදියෙන් ද පිරී පවතී. නමුත්, අපි ඒවා රැකබලා නොගන්නේ නම් හරිහැටි ප්‍රායෝගිකව භාවිතා නොකරමින් පුරුදු පුහුණු නොකරයි නම් වෛරය, ඊර්ෂ්‍යාව, පළිගැනීම, තරහව හෝ දුක වැනි නිෂේධාත්මක හැඟීම් වල් පැලෑටි මෙන් වර්ධනය වේ.

## පිරිසිදු හදවතක් තුළින්

- මනසේ සාමය
- වඩා හොඳ සබඳතා
- චිත්තවේගය සමතුලිතතාව
- අධ්‍යාත්මික වර්ධනය
- කෝපය, ඊර්ෂ්‍යාව, වෛරය, පසුතැවීම, වරදකාරීත්වය, උඩඟුකම, ආදී නිෂේධාත්මක හැඟීම් නිතිපතා සිතුවිලි තුළින් ඉවත් කිරීම

## හදවත පිරිසිදු කිරීමට ක්‍රමයක්

1. සමාව දීම පුරුදු වන්න

එය ඉතා දුෂ්කර වූ විට දී පවා සමාවදීම පහසු නැත. නමුත්, එය එසේ සිදුකිරීමට අවශ්‍ය වේ. අපි සමාව දෙන විට සිදුවූ දේ නිවැරදි යැයි අදහස් නොවේ. තවදුරටත් වේදනාවන් දරාගැනීමට කැමති නැති බව එයින් අදහස් වේ. නිහඬ බවෙන් වුවද ඊට පිළිතුරු සැපයිය හැකිය.

උදාහරණ - මිතුරකු ඔබේ විශ්වාසය පාවා දුන්නේය. එහිදී, සමාවදීම යන්නෙන් අදහස් කරන්නේ ඔබ ඔහු කළ දේ අමතක කරන බව හෝ ඊට අවධානය නොදුන්නා යැයි කියා නොව. නමුත්, එයින් අදහස් වන්නේ ඔබ පිළිබඳ එයින් අවබෝධයක් ගෙන ඉදිරියට කටයුතු කරනා බවය. අමනාපකම් අල්ලාගෙන සිටීම යනු බර මල්ලක් රැගෙන යාමක් වැනිය. යන අයට එම ගමන යාමටදී ඔබ අන් අයට සමාව දී ඔබගේ මනසේ සන්සුන්තාවය රැකගැනීමට හැකි සෑම විටම උත්සාහ කරන්න. එහිදී, මුල් පියවර කිහිපය තුළදී ඔබට යම්තාක් දුරට අපහසුතාවයක් දැනුනද

පසුකාලීනව ඉන් ලැබෙන සැහැල්ලුව තුළින් ඔබවම මවිත වනු ඇත.

2. නිහතමානීව සමාව ඉල්ලන්න

සමහර විට අපගේ ඊගෝව මට සමාවෙන්න යැයි පැවසීමෙන් අපව වළක්වයි. නමුත්, හෘදයාංගම සමාව ඉල්ලීමකින් සබඳතා නිවැරදි කර ඔබේ හදවත වරදකාරී හැඟීමෙන් ඉවත්කළ හැකිය.

උදාහරණ - ඔබ නොදැනුවත්වම කෙනකුගේ හිතට රිදුමක් ඇතිවූ විටෙක සරලවම අවංකවම ඒ අය හට "මට සමාවෙන්න, මම ඔබව රිදවීමට අදහස් කළේ නැහැ" යන්නෙන් හදවත් දෙකටම සුවයක්, පහසුවක් ගෙන දිය හැකිය.

3. කෘතඥතාවයෙන් ඊර්ෂ්‍යාව ඉවත් කරන්න

ඔබේ ජීවිතය අන් අය සමඟ සංසන්දනය කරනවා වෙනුවට ඔබ සතුව ඇති දෙයට ස්තුතිවන්න. අවසානයේ එහි ප්‍රතිඵලය ලෙස ඊර්ෂ්‍යාව නැතිකර සිතේ සතුට ඇති කරනු ලබයි.

4. කරුණාවන්ත වන්න

ආගන්තුකයකුට හෝ ඔබ දන්නා අයකුට හෝ කරුණාවන්ත වචනයක්, උපායශීලී සිතුවිල්ලක් හෝ හදවතින්ම පැනනගින සිනහවකින් වුවද අපගේ හදවතෙහි ඇති කෙලෙස් මල ඉවත්කළ හැකිය. කරුණාවන්ත බව යනු ආත්මාර්ථකාමීත්වයේ දුහුවිලි ඉවත්කළ හැකි පිස්නාවක් වැනිය. ඔබත් එම පිස්නාව භාවිත කරමින් ඔබගේ හදවත ඔපදමා ගැනීමට කටයුතු කරන්න උත්සාහ කර බලන්න. ඒ දැනෙන සැහැල්ලුව, ඒ ලැබෙන ධනාත්මක ප්‍රතිචාර අත්විඳ බලන්න.

5. ඕපාදූප සහ විනිශ්චය කිරීමෙන් වලකින්න

ඕපාදූප, පැමිණිලි කිරීම් සහ පූර්ව විනිශ්චිය කිරීම් යනු හදවත දූෂණය වන කාරණා වේ. කරුණාවෙන් හා සත්‍යාවබෝධයෙන් කතා කිරීමටත් නැතහොත් නිහඬව සිටීමටත් කටයුතු කරන්න. අන් අය විනිශ්චය කරනවා වෙනුවට ඔවුනගේ ඉදිරි දැක්ම සහ ඔවුන්ගෙන් ඔබගේ ජීවිතයට ගතහැකි ධනාත්මක දේ එකතු කරගැනීමට උත්සාහ කරන්න.

උදාහරණ : ඔබගේ අදහසක් යම් අයෙකුට ප්‍රකාශ කිරීමට ප්‍රථම,



"ඒක ඇත්ත ද?"

"ඒක ඇසීමට අවශ්‍යද ?"

"ඒක කාරුණිකයිද ?"

යන්න සිතා එසේ ඇසීම සාධාරණයි නම් පමණක්ම ඇසීමට වගබලා ගතයුතුය. එය ඔබටත් එම පාර්ශ්වයටත් වැදගත්කමක් ඇති කරුණක් වීමට වගබලා ගතයුතුය.

6. නිශ්ශබ්දතාවයට ඉඩ දෙන්න. සිත භාවනාවෙහි යොදවා සුවපත් කරවන්න.

මෙය ඔබට ඕනෑම ස්ථානයක ඕනෑම අවස්ථාවක කෙටි කාලයක් තුළ සිදුකළ හැකි ක්‍රමවේදයකි. එනම්, හැකි අවස්ථාවක මිනිත්තු කිහිපයක් නිශ්ශබ්දතාවයෙන් ගත කරන්න. නිවැරදි ඉරියව්වකට පැමිණ දෑස් පියා ගැනීමට හැකිනම් වඩාත් ප්‍රතිඵලදායක වියහැක. ඔබ අවට ඇති ශබ්දයන්ට හෝ ගන්ධයන්ට අවධානය දෙන්න. ගැඹුරින් හුස්ම ගෙන මඳක් රඳවා සාමකාමීව එය වාතලයට මුදා හරින්න. එකම දෙයක් කෙරෙහි ඔබගේ අවධානය රඳවා ගැනීම නිසාවෙන් ඔබගේ අභ්‍යන්තරය සන්සුන් වනු ඇත. එය ඔබගේ ආත්මය ඔබට දැනෙන මොහොත වනු ඇත.

7. වේදනාකාරී අතීතය අත්හරින්න

අතීත මෙනෙහි කිරීමක් යනු ඔබගේ ශක්තීන් අවදි කිරීමක් වැනිය. සෑම අයකුටම අන්‍යොන්‍ය වූ අමතක කළ යුතු අමිහිරි අතීතයක් ඇත. වඩා වැදගත්වන්නේ වේදනාවෙන් අල්ලාගෙන සිටිනා මේ සෘණාත්මක ශක්තීන් ධනාත්මක මතක හා ශක්තීන් තුළින් බැහැර කිරීමයි හැකි සෑම විටම ඔබගේ මනස ඔබට සුවදෙන කරුණු කරුණා සහ මතකයන්ගෙන් පුරවා ගන්න.

ඉහත සියලු කාරණා තුළින් පිරිසිදු හදවතක් පවත්වාගෙන නඩත්තු කර ගැනීමට ඔබට උපකාර වනු ඇත.

- ප්‍රීතිමත් මනසක්
- ධනාත්මක පරිසරය.
- සෞඛ්‍ය සම්පන්න සබඳතා ගොඩනගා ගැනීමට
- ශක්තිමත් සදාචාරාත්මක වටිනාකම්
- වඩාත් ආදරණීය වටපිටාවක් ඔබ වටා ඇතිවීම.

පිරිසිදු හදවතක් ශක්තිමත් සමාජයක් නිර්මාණය කරයි. සෑම අයකුම තමන්ගේ හදවත පිරිසිදු කිරීමට කටයුතු කරන්නේ නම් අපට වඩාත් සාමකාමී කාරුණික සහ ආදරණීය ලෝකයක තරඟකාරීත්වයෙන් තොරව වුවද ජීවත්විය විය හැකිය. ඔබේ හදවත පිරිසිදු වූ විට ඔබේ මුහුණ දිළිසෙනු ඇත. එවිට ඔබේ වචන සිත සුවපත් කරවන අතර, ඔබේ ක්‍රියාවට ද එය රුකුලක් වනු ඇත. හදවත් පිරිසිදු කිරීම දිනපතා කළ යුතුය. සෑම දිනකම අපි දැන හෝ නොදැන අපිරිසිදුකමක් එනම් කෝපයක්, අමනාපකමක් අවශ්‍යතාවක් ඊර්ෂියාවක් අප හදවතට ඇතුල්වීමට හැකිය. නමුත්, නිහඬ වීම, සමාව, ආදරය, ඉවසීම සහ කෘතඥතාවයක් එය නිෂේධ කළ හැකිය.




▪ කපිතාන්
එච්පීජේ හවන්ති
1 ශ්‍රීලයුකාබ

# මව්පිය දූදරු සබඳතා

## පරිපූර්ණ දිවියකට මඟ කියයි

දෙමව්පියන් හා දරුවන් අතර ඇති සම්බන්ධය යනු මානුෂීය සබඳතා අතර අතිශයින්ම තීරණාත්මක සහ වටිනා සම්බන්ධයකි. මිනිසාගේ පවුල් ජීවිතය, සදාචාරය, සංස්කෘතිය, ආදරය, සහයෝගය හා ආරක්ෂාව මත පවත්නා අතර, ඒ සියල්ලටම මූලික වන්නේ දෙමව්පියන් හා දරුවන් අතර ඇති ආත්මීය සම්බන්ධයයි. ජීවිතයේ මුල් අවධියේ දරුවා සම්පූර්ණයෙන්ම තම දෙමව්පියන්ගේ ආරක්ෂාවට, සෙනෙහසට සහ ආදරයට යටත්ව පවතියි. මෙය මව හා දරුවා අතර ඇති සරලම සම්බන්ධයකි. මවගේ බිඳුමෙන් ආරම්භ වූ එම සබඳතාවය, පිය සම්බන්ධයත් සමඟ එක්වෙමින්, දරුවාගේ ව්‍යාප්ත චරිත ගොඩනැගීම සිදුවේ.

දරුවෙකුගේ වර්ධනයට හැඩය දෙන්නේ ඔහුට ලැබෙන ආදරය, අවධානය, සහ තේරුම් ගැනීම මඟිනි. දෙමාපියෝ දරුවකුට සමාජය, සංස්කෘතිය සහ සදාචාරය පිළිබඳ මුල්ම පාඩම් ඉගැනීමට උපකාරී වන අය වෙති. මේ සම්බන්ධය පදනම් වන්නේ විශ්වාසය, ගෞරවය සහ සන්නිවේදනය මතය. මව්පියන් දරුවන්ගේ දුක, වේදනා, සතුට සහ ජයග්‍රහණය සමඟ ඒකාබද්ධ විය යුතුය. ඔබව පිනවන්නන් සමඟ ඇති සම්බන්ධය සතුටින් පිරුණු එකමුතුවක් බවට පත් වන්නේ, එකිනෙකාට ඇගයීම හා තේරුම් ගැනීමක් පවතින විටයි. කෙසේ වෙතත්, විශේෂයෙන්ම නූතන යුගයේදී, තාක්ෂණය, කාර්යබහුලත්වය හා සමාජීය මාදිලිවල වෙනස්කම් නිසා මව්පියන් හා දරුවන් අතර ඇති ආත්මීය සම්බන්ධය කිසිදු උත්සාහයකින් තොරව අවදානමකට ලක් විය හැකිය.

දරුවන්ට අවශ්‍ය වන්නේ විලාසිතා සහ දේපළවලින් පිරුණු ජීවිතයක් නොව, ඒ වෙනුවට ආදරය, සෙනෙහස සහ විශ්වාසය යි. සමහර විට මව්පියන් වෘත්තියමය වශයෙන් කාර්යබහුලව සිටියත්, දරුවකුට අවශ්‍ය වන්නේ කෙටි කාලයක් නමුත් ගුණාත්මක කාලයක්ය. දරුවකු සමඟ ගත කළ විනාඩි කිහිපයකින් පවා මනා සම්බන්ධයක් ගොඩනඟා ගැනිමට හැකිවීම අප කවුරුත් දන්නා කරුණකි. මව්පියන් වශයෙන්, දරුවකුගේ හැඟීම්, සිතුම්, බිය සහ සිහිනයන් සඳහා සවන් දීම, ඒවාට පිළිතුරු දීම, සහ ඔවුන්ගේ පුද්ගලිකත්වයට



ගෞරව කිරීම මගින් විශ්වාසයෙන් පිරුණු සබඳතාවයක් බිහි කරනු ඇත. දරුවාට උපදෙස් දෙන විට, ඔහුගේ වයස, තේරුම් ගැනීම, සහ හැකියාවන් අනුව එය සිදුකළ යුතුය.

අනික් අතට, දරුවෝද තම දෙමව්පියන් සම්බන්ධයෙන් ගෞරවය, ආදරය, සහ කෘතඥතාව පවත්වන අයුරෙන් ක්‍රියා කළ යුතුය. මව්පියන් යනු එක දිගටම සදාකාලිකව දරුවන්ට ආදරය කරන පුද්ගලයන් වන අතර, ඔවුන්ගේ ජීවිතය අහවර වන්නේ දරුවන් වෙනුවෙනි. එවන් පුද්ගලයින්ට ගෞරව දැක්වීම,සෙනෙහසින් ඉදිරිපත් වීම යනු සදාචාරමත් අයුරින් ජීවත් වීමේ මූලික කොටසකි. දරුවන්ගේ පවුල් ජීවිතය අරභයාම ඔවුන්ගේ චරිත ගොඩනගීම, සමාජීය හැසිරීම්, අධ්‍යාපනික වර්ධනය සහ මනුෂ්‍යත්වය සම්බන්ධව ගැඹුරු බලපෑම් ඇති කරනු ලබනවා. මෙම සම්බන්ධය ගොඩනගන ආකාරය අනුව ඔහුගේ අනාගත ජීවිතයේ ගුණාත්මකභාවයද තීරණය වේ.

අද වනවිට සමාජයේ පවතින සමාජීය හා මානසික ගැටලු වලට බොහෝවිට හේතු වන්නේ පවුල් සබඳතා වල අසමතුලිතභාවයයි. තවද, ලිහිල් වූ සන්නිවේදනය, අධික විවේක රහිත ජීවිත රටාව, හා තාක්ෂණික උපාංගවලට නැඹුරු වීම ආදී හේතුවෙන්, දෙමව්පියන් හා දරුවන් අතර සැබෑ සම්බන්ධතා බිඳී යාමේ තත්ත්වයකට පත්ව ඇත. එබැවින්, සෙනෙහසින් පිරුණු පවුලක් ගොඩනගා ගැනීම සඳහා අපි හැමෝම කැපවිය යුතුය. දෙමව්පියන් පමණක් නොව, දරුවන් ද මෙය සරල වශයෙන් නොව සැලකිලිමත් වශයෙන් අවබෝධයත් සමඟ කළ යුතු කාර්යයකි. ආදරයෙන්, විශ්වාසයෙන්, ගෞරවයෙන් හා මනා සන්නිවේදනයකින් පිරි සබඳතාවය, සමාජයක්ම එකමුතු කිරීමේ මූලික අංගයක් බවට පත්වේ. නිවන්සැරියකට පවා මඟ පෙන්වන්නට හැකි වන්නේ ආදරය, ගෞරවය සහ විශ්වාසයෙන් පිරුණු පවුල් ජීවිතයකිනි. මෙම සබඳතාවය නිවැරදිව පවත්වාගෙන යාම සාර්ථක පවුල් ජීවිතයක මූලික ගුණාංගයකි. මෙවැනි වටිනා සම්බන්ධයන් ආරක්ෂා කර ගැනීමට දෙපාර්ශවයේම වගකීම් ඇත. එනම්

## දෙමව්පියන් වශයෙන්:

- දරුවාට සවන් දීම
- ඔහුගේ හැඟීම් පිළිගැනීම
- දඬුවම් කිරීම වෙනුවට අවබෝධය සහ උපදෙස් ලබාදීම
- ඔහුගේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම
- තාක්ෂණය සහ මූල්‍යමය සම්පත් මගින් පමණක්ම නොව, සත්‍ය ආදරය මත සම්බන්ධ වීම

## දරුවන් වශයෙන්:

- දෙමව්පියන්ට ගෞරවය දැක්වීම
- ඔවුන්ගේ කැපවීම වටහා ගැනීම
- කුඩා වියේ සිටම වගකීම සහ බාරකාරභාවය ඉගෙනීම
- ආදරය සහ කෘතඥතාව පවත්වන ආකාරය වර්ධනය කිරීම

දෙමව්පියන් හා දරුවන් අතර බැඳීම යනු සරල වූ සබඳතාවයකට වඩා වඩාත්ම ගැඹුරු, සෙනෙහසින් පිරුණු හා ජීවිතයම බෙදාගන්නා මනෝභාවයකි. එය ගෞරවයෙන්, විශ්වාසයෙන්, උණුසුමකින් පිරුණු දෙපාර්ශ්වීය ගිවිසුමක් විය යුතුය. පරම්පරාවෙන් පරම්පරාවට උරුම විය යුතු පවුල හෙවත් කුටුම්භය, සමාජය තුළ සන්සුන් බවක් උදා කරන මූලිකම ජීව මූලධර්මයකි.

අවසන් වශයෙන් දෙමව්පියන් හා දරුවන් අතර ඇති සබඳතාවය යනු ජීවිතයේ අගනාම සන්සුන් සම්බන්ධයකි. එය රැක ගැනීම, වර්ධනය කිරීම සහ අනාගත පරපුරට උරුම කිරීම අපගේ වගකීමකි.

අම්මාගේ හිත් මත නදිය,
තාත්තගේ කඳුළු සන්සුන්ය,
දරුවකුගේ ලොව පුරා,
මෙයයි සෙනෙහෙබර ජීවිතය

ළෙලෙන හදවතක් අම්මා වෙයි,
තාත්තා දුන්න දරු සෙනෙහෙ වෙයි,
මතක තුනින් ගලා එන,
ආදරයේ නමින් ලියැවෙයි



**කෝප්‍රල්**
**දුස්මන්ත එස්ඒඩීපී**
**6 ගැමුණු හේවා බලකාය**



# කේක් කලාවේ ඉතිහාසය




## ආරම්භය

කේක් "cake" යන නාමය අද වනවිට විවිධ රූපවලින්, විවිධ රසවලින් යුක්ත, විවිධත්වයෙන් යුතුව සකස් කරනු ලබන ආහාරවලින් එකකි. එහෙත්, කේක්වල ආරම්භය සෙවීමේදී අපට අතීතයට යාමට සිදුවන්නේ පැරණි ග්‍රීක, රෝමානු සහ ඊජිප්තු (Egypt) සමාජ සංස්කෘතීන් වෙතටයි.

පැරණි ග්‍රීකයන් "plakous" යනුවෙන් හැඳින්වූ මෙම කේක් වර්ගය සෑදීමේදී ධාන්‍ය, පළතුරු වර්ග හා කැරට් වැනි ආදේශක භාවිතා කරමින් සකස් කල බවට ඉතිහාසයේ සඳහන්ව තිබෙනවා. එසේම පිසින ලද තෙල්, පැණි වැනි දේවල් ද මේ සඳහා යොදාගත් බවත් තට්ටු තට්ටු වශයෙන් සකස් කරන ලද එම කේක් වර්ගය කේක් නිර්මාණයේ මූලික අඩිතාලමක් ලෙසත් සලකන ලදි. එකල අතීතයේ කේක් සංකල්පය සීමා වූයේ ආගමික උත්සව හා රාජකීය උත්සව සඳහා පමණි. වර්තමානය හා සැසඳීමේදී එකල සමාජයේ ජීවත් වූ සාමාන්‍ය ජනතාවට කේක් වැනි වාසනාවන්ත ආහාර ලබා ගැනීම ඉතා දුෂ්කර විය. කෙමෙන් කෙමෙන් දියුණු වන ලෝකයත් සමග කේක් නිශ්පාදනයේද විවිධ වෙනස්කම් සමඟින් නවෝත්පාදන වෙළඳපලට එකතු වන්නට විය. කේක් නිශ්පාදන නවීකරණය කරන ලද විවිධ උපකරණ වැනි දෑ වෙළඳපොළ තුළ අණසක පතුරනවාත් සමග ඉතා සීඝ්‍රයෙන් කේක් කලාව විවිධ පැතිකඩයන් ඔස්සේ නව නිර්මාණ ලෙස බිහිවන්නට විය.

එසේම, කේක් කලාව 19 වන සහ 20 වන ශතවර්ෂවලදී පාරිභෝගික අභිරුචි හා කාර්මික ව්‍යාප්තිය හමුවේ දැඩි ලෙස වෙනස් විය. විශේෂයෙන්ම බේකරි කර්මාන්තයේ ව්‍යාප්තිය, වෙළඳපොළ තුළ බෙදාහැරීමේ පහසුකම්, හා රසවත් ආහාර නිෂ්පාදනවලට ඇති ඉල්ලුම යන කරුණු මත කේක් සඳහා තරඟකාරී වෙළඳපොළක් ඇතිවීම කේක් නිර්මාණයේ නවෝත්පාදන බිහිවීමට තවත් ප්‍රධානතම හේතු සාධකයක් විය. මෙම පරිණාමය තුළින් කේක් සකස්කිරීම "වෘත්තීය කලාවක්" බවට පත්වීමට වැඩි කලක් නොගියේය.

## නවීන යුගයේ කේක් කලාව

වර්තමානයේ ගෝලීය වශයෙන් ගත් කල කේක් කලාව මිනිසා සමඟ දැඩිව සම්බන්ධ වී ඇති බවට පැවසීමට අටුවා ටීකා අවශ්‍ය වන්නේ නැත. මන්ද යත් කුඩා දරුවෙක් ඉපදීමේ සිට මහලු විය එළැඹෙන තෙක්ම ඔහුගේ ජීවිතයේ නොයෙක් ... කුමන හෝ කේක් නිර්මාණයකි. එමෙන්ම , විශේෂ අවස්ථා සඳහා වැඩි නිර්මාණශීලීත්වයක් ලබා දීමේ මෙවලමක් බවට වර්තමානයේ කේක් යන ආහාරය පත්ව ඇත.

එම කේක් නිර්මාණයන්හිදී මිනිසාගේ විවිධ අවශ්‍යතාවයන් මත එනම් උපන්දින සැමරුම්,විවාහ මංගල්‍ය, සංවත්සර දිනයන්,ජයග්‍රහණ සැමරුම් අවස්ථා වැනි විවිධ අවස්ථාවන් සඳහා විවිධ තේමා යටතේ කේක් වර්ග නිර්මාණ ව්‍යාප්ත වී ඇත. මෙලෙස ව්‍යාප්ත වී ඇති කේක් කලාවේ පහත සඳහන් නවෝත්පාදන සමඟ නවීන යුගයේ කේක් ව්‍යාප්තිය බහුල වශයෙන් සිදුව ඇත.

- Fondant & Sugarcraft : ඇමරිකාව, බ්‍රිතාන්‍යය වැනි රටවල ෆොන්ඩන්ට් හා මල් නිර්මාණ කලාව නව ශිල්පයක් ලෙස වර්ධනය වීම.
- 3D සහ Hyper-realistic Cakes: කේක්වල පෙනුම සත්‍ය ජීවිත වස්තු මෙන් පෙනෙන පරිදි නිර්මාණය කිරීම.
- Vegan සහ Gluten-free Cake Culture: පෝෂණය හා සෞඛ්‍යය පිළිබඳ අවධානය වැඩිවීමත් සමග සෞඛ්‍යයමය ක්‍රම භාවිතය වැඩි









- Cake Shows & Reality TV : Cake Boss, The Great British Bake Off, Nailed It! වැනි වැඩසටහන් හරහා කේක් කලාව ජනප්‍රියත්වයට පත් වීම.

ලෝකයේ කේක් කලාව මේ වනවිට ශ්‍රමය සහ නවෝත්පාදන බහුල වූ වෘත්තීය ක්ෂේත්‍රයක් බවට පත්ව හමාරය. තාක්ෂණයේ දියුණුවත් සමඟ රසින් රසට වෙනස් වන හැඩයෙන් හා ප්‍රමාණයෙන් වෙනස් වූ විවිධ කේක් වර්ග වෙළඳපොළ තුළ පවතින අතර ඒ අතුරින් ශ්‍රී ලංකාව තුළ බහුල වශයෙන් ආහාරයට ගන්නා කේක් වර්ග කිහිපයක් පහත වේ.


බටර් කේක් / ගැටෝ කේක් / චොකලට් කේක් / උපන්දින කේක් / පොල් කේක් / කොෆී කේක් / රිබන් කේක් / චීස් කේක් / විවාහ සංවත්සර කේක් / පලතුරු කේක් / රටඉඳි කේක් රෙඩ්වෙල්වට් කේක් / වෙඩින් කේක්

වර්තමාන ලෝකයේ තාක්ෂණයේ දියුණුවත් සමඟ කේක් කලාව නම් වූ දෙය සැකසීම ආරම්භයේ සිටම නිමාව දක්වාම වූ ක්‍රියාවලිය යන්ත්‍රානුසාරයෙන් කිරීමට තරම් දියුණු වී ඇත. මේ වන විට ශ්‍රී ලංකාව තුළද කේක් සඳහා පවතින වෙළඳපොළ ඉතා විශාලය. තරඟකාරී වෙළඳපළක් තුළ බිහිවී ඇති කේක් නිෂ්පාදකයින් සංඛ්‍යාව බොහෝය. ඔවුන් අතුරිනුත් බොහෝ අය විදෙස් වෙළඳපොළ තුළද තම ව්‍යාපාරයේ අණසක පතුරමින් සිටී. වර්තමානයේ අප සමාජයේ ජීවත්වන බොහෝ කාන්තාවන්ගේ මෙන්ම පිරිමි අයවළුන්ගේද ප්‍රධානතම ජීවනෝපාය වී ඇත්තේ තමන්ගේම කියන්නාවූ කේක් ව්‍යාපාරයකි.

බොහෝ බැරෑරුම් කාර්යයක් ලෙස පෙනුනද කේක් කලාව වූ කල මනා සේ උගත්තේ නම් බොහෝ දේවල් ඉගෙනුමට හැකි ඉදිරියට යන ගෝලීය නව්‍යකරණයත් සමඟ සම සමව තම හැකියාවන් දියුණු කර ගනිමින් ස්ථාවර ආදායම් මාර්ගයක් සකසා ගත හැකි ප්‍රධාන ආදායම් මාර්ගයකි. කේක් කලාව යන්න ඉගෙනුම තුළින් රැකියා විරහිත අයවළුන්ටත්, තමන්ගේම ස්වයං ව්‍යාපාරයක් ආරම්භ කිරීමටත් බලාපොරොත්තු වන අයෙටත් විශේෂයෙන් දරුවන් බලා ගනිමින් නිවසට වී තම තරුණ කාලය ගත කරන ගෘහණියන් හට ඉතා පහසුවෙන් ව්‍යාපාර ලෝකයට පිවිස තම නිවසේ ආදායම් ඉපයීමේ මාර්ගයන්ට යම් රුකුලක් වන්නට හැකි වන අත්වැලකි. අද වන විට එක් ඇමතුමකින් හෝ එක් කෙටි පණිවුඩ දැනුම් දීමකින් තමන්ට අවශ්‍ය කරන කේක් ඇණවුම තම නිවසේ දොර අබියසට ගෙන ඒමට තරම් කේක් කලාව හා බැඳුණු ව්‍යාපාර දියුණු වී ඇත.

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ කේක් නිර්මාණ පාඨමාලා (කාලය මාස 1, මාස 3, මාස 6 හා අවු.1 වශයෙන්) පවත්වන ආයතන බොහෝ ප්‍රමාණයක් තිබෙන අතර මූලික දැනුම ලබා ගැනීමෙන් අනතුරුව එය වැඩි දියුණු කර ගනිමින් ව්‍යාපාර ලෝකයට පිවිසීමට අපට ඇති ඉඩකඩ ඉතා ඉහලය. එසේම ස්මාර්ට් ජංගම දුරකථනය උපයෝගී කර ගනිමින් ඕනෑම රටක සකස් කරන කේක් වර්ගයක වට්ටෝරුව සමඟ එය සකස් කරන ආකාරය දක්වා වූ විස්තර වීඩියෝ සහිතව විනාඩි කිහිපයකින් ලබාගත හැක. මෙවැනි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට වයස් භේදයක් නොමැති අතර තම හැකියාව හා කැපවීම මත ක්ෂේත්‍රය තුළ දිගු ගමනක් යන්නට ඕනෑම අයෙකුට ඉඩප්‍රස්ථාවද ලැබෙනු ඇත.

කේක් කලාව යනු, ආරම්භයේදී සරල ආහාරයකි. නමුත්, එය පරිණාම විය යුත්තේ ශිල්පයක් බවටය. කලාත්මකත්වය, විද්‍යාත්මක ගණනය, සෞන්දර්යය සහ සංස්කෘතික වටිනාකම් එක්වුණු මේ කලාව, සෑම කාලයකදීම නවෝත්පාදන සමඟ ඉදිරියට ගමන් කරයි. අද අපට හැකිවෙන්නේ කේක් ලෙස සැලකූ ඒ ආහාරය තුළ, මිනිස් සමාජයේ පරිවර්තනයන්, අවශ්‍යතාවන් සහ සිතිවිලි හඳුනා ගැනීමකි. මෙම ලිපිය තුළින් කේක් නිර්මාණය හා ඉතිහාසය පිළිබඳ විස්තර ගෙන ආවද හුදෙක්ම මාගේ උත්සාහය වන්නේ මෙවැනි අංශයක් යටතේ ස්ථිර ආදායම් මාර්ග යක් සකස් කර ගැනීමට මෙය කියවන පාඨක ඔබටද රුකුලක් වන්නටයි. ඒ වෙනුවෙන් මීළඟ කලාපයෙන් කේක් සැකසීම වෙනුවෙන් යොදා ගන්නා උපකරණ සබැඳිව විස්තර ගෙන එන්නට මා සූදානම්. ඔබත් උත්සහ කරන්න මා වගේම ඒ අපූර්වත්වයෙන් පිරුණු කේක් කලාව නම් වූ ශිල්පය උගත් පිරිසක් තුළ දිදුලන අයකු වන්න...



- සැරයන්

**වර්ණකුලසූරිය ඩබ්ලිව්එම්බීඑම්**

1 ශ්‍රීලයුකාබ



## දෙවියන් දකිනුවස් සොබාදමේ හදවත මතින් ඇවිද යන

# සහෝදරත්වයේ පාදයාත්‍රාව

උතුරු කෙළවරේ යාපනයේ සෙල්ලසන්නිධි කෝවිලෙන් ගමන් අරඹා කතරගම දෙවියන් ගමන් කළ මඟ ඔස්සේ ඔකඳ දේවාල බිම හරහා රුහුණු කතරගම මහා දේවාලය වෙත පා ගමනින් යනු ලබන පාද යාත්‍රාව වාර්ෂිකව පවත්වති.

පානම ඔකඳ දේවාලයෙන් ගමන් අරඹා කුමන ජාතික වනෝද්‍යානය, යෝධ ලිප, බාගුරා කලපුව, කුරුළු පාරාදීසය, කුඩා කැබිලිත්ත, කුඹුක්කන් ඔය තරණය කර යාල ජාතික වනෝද්‍යානයට පිවිස ගජබා පිටිය, ලිං තුන, කටුපිල ආර, පරන තොටුපල (මැණික් ගඟ)/වරහන කඳවුර, කටගමුව හරහා කතරගම දක්වා පැමිණෙන පාද යාත්‍රාවේ ආරම්භය පිළිබඳව නිශ්චිත ඓතිහාසික වාර්තා හිඟ වුවද, එය ශතවර්ෂ ගණනාවක් පුරා පැවත එන පැරණි සම්ප්‍රදායක් බවට පොදු පිළිගැනීමක් පවතී. පුරාණයේ සිටම කතරගම දෙවියන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආරක්ෂක දෙවියන් ලෙස සැලකේ. සිංහල, දෙමළ, මුස්ලිම් සහ ආදිවාසී වැදි ජනතාව ඇතුළු විවිධ ප්‍රජාවන් කතරගම දෙවියන් කෙරෙහි ගැඹුරු භක්තියක් දක්වති. මෙම පාද යාත්‍රාව, විශේෂයෙන්ම හින්දු බැතිමතුන් අතර, "පරම්පරාගත පාද යාත්‍රාව" ලෙස හැඳින්වේ. ත්‍රස්තවාදී යුද්ධය පැවති සමයේදී වුවද, මෙම යාත්‍රාව සම්පූර්ණයෙන්ම නතර නොවී, යම් යම් සීමාවන් යටතේ හෝ පැවැත්විණි. එයින් පෙන්නුම් කරන්නේ මෙම සම්ප්‍රදායේ ඇති නොබිඳිය හැකි ශක්තියයි. බැතිමතුන් කණ්ඩායම් වශයෙන් එක්ව, කතරගම දෙවියන් කෙරෙහි වූ දැඩි විශ්වාසය මත පමණක් ගමන් ආරම්භ කරති. ගමන ආරම්භ කිරීමට පෙර, ඔවුන් බාරහාර වෙති. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කහ වස්ත්‍රවලින් සැරසී සිටිති. සමහර විට බෙර වාදන, නාද රටා සහ කෝලම් නැටුම්වලින් යුක්තව ගමන් කරති.

පාද යාත්‍රාව යනු අතිශය දුෂ්කර ගමනකි. එය දින 10ක් පමණ ගතවන අතර, කිලෝමීටර් සිය ගණනක් දුර පයින් ගමන් කිරීමට සිදුවේ. මෙම බැතිබර ගමන සඳහා දෙමළ මෙන්ම සිංහල බැතිමතුන් ද එක්වූහ. යාපනයේ සිට කතරගම දක්වා වූ මාර්ගය වනගත ප්‍රදේශ, ගංගා, සහ දුෂ්කර භූමි ප්‍රදේශ හරහා වැටී ඇත. බැතිමතුන්ට අධික වෙහෙස, කුසගින්න, පිපාසය, සහ අනෙකුත් ස්වභාවික අභියෝගවලට මුහුණ දීමට සිදුවේ. නමුත්, ඔවුන් මේ සියල්ල විඳ දරා ගන්නේ කතරගම දෙවියන් කෙරෙහි වූ නොසැලෙන භක්තිය සහ ආධ්‍යාත්මික බැඳීම නිසාය.

මෙම ගමන පුරාවටම, බැතිමතුන් අල්පේච්ඡ ජීවිතයක් ගත කරති. ඔවුහු සරල ආහාර අනුභව කරන අතර, විවේක ගන්නේ විහාරස්ථාන, ගම්මාන සහ ගස් යටය. ගමන අතරතුර, ඔවුන් භජන් ගායනා කිරීම, දෙවියන්ට යාඥා කිරීම, බෙර වාදනය, නාද රටා, කෝලම් නැටුම් සහ ආගමික කටයුතුවල නිරත වෙති. මෙම ගමන ඔවුන්ට ආත්ම අභිමානය, ඉවසීම, සහ ස්වයං විනය පුරුදු පුහුණු කරවයි.

ලිංතුන ප්‍රදේශයේ ක්‍රියාත්මක රෝහල නැගෙනහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සැලසුම්, ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය අලගෙයියා ලතාහරන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වෙයි.

"අපි යාල ලිංතුනේ දි තමයි වෛද්‍යවරු කණ්ඩායමක් එකතුවෙලා මේ සෞඛ්‍ය කඳවුර ක්‍රියාත්මක කරන්නේ. අපි මෙතනදි කරන්නේ හදිසි ප්‍රතිකාර විතරයි. මේ වෙනුවෙන් යුද හමුදාව අපිට විශාල සහයෝග යක් ලබා දෙනවා. අපි මුලින්ම 2014 දි මේ වෛද්‍ය කඳවුර ආරම්භ කළෙත් හමුදාවේ ස්වේච්ඡා සේවයක් විදියට. මේ ඉන්න දොස්තරලා තමන්ගේ පෞද්ගලික නිවාඩු දාලා තමයි මේ කඳවුරට සහභාගී වෙන්නේ. අපි මේ වැඩේ කරන්නේ අභියෝග රැසක් මැද්දේ. මොන අභියෝග ආවත් අපි මේ වැඩේ දිගටම කරනවා. අපිට හමුදාවේ සහයෝගය නිරතුරුවම ලැබෙනවා. මේ සැරේ වෙනදාව වඩා අව්ව සහ හුළඟ වැඩියි. ඒ නිසා විශේෂයෙන්ම විජලන තත්ත්වයන් වැඩිපුර දකින්න පුළුවන්. අනිත් කාරණය තමයි මේ සැරේ පාදයාත්‍රාවේ ඉන්න සෙනඟ ප්‍රමාණයත් වැඩියි" යැයි විශේෂඥ වෛද්‍ය අලගෙයියා ලතාහරන් පැවසීය.

කටගමුව පිවිසුමෙන් පිටවී කතරගම නගරයට ළඟා වීමත් සමඟ පාද යාත්‍රාවේ උච්චතම අවස්ථාව සනිටුහන් වේ. ඔවුන් මහා දේවාලය, කිරිවෙහෙර, සෙල්ල කතරගම සහ අනෙකුත් පූජනීය ස්ථාන වැඳපුදා ගනිති. එසමයෙහි කතරගම පුදබිම, විශේෂයෙන්ම ඇසළ පෙරහැර පැවැත්වෙන කාලයේදී, ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන්ගෙන් පිරී පවතී.

පාද යාත්‍රාව අවසන් වන්නේ කතරගම ඇසළ පෙරහැර පැවැත්වෙන කාලයට සමගාමීවය. පෙරහැර නැරඹීමෙන් අනතුරුව, බැතිමතුන් තමන් භාර වූ භාරයන් ඔප්පු කර, දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගෙන ආපසු තම නිවෙස් බලා පිටත් වෙති. මෙම ගමන තුළින් ලැබෙන ආධ්‍යාත්මික තෘප්තිය සහ සාමය ඔවුන්ගේ ඉදිරි ජීවිතයට විශාල ශක්තියක් ලබා දෙන බව ඔවුන් විශ්වාස කරති.

මෙම ගමන පිළිබඳ අත්දැකීම් බහුල පිරිස් දෙවියන් පිළිබඳ බොහෝ කතන්දර කියන්නේ රාත්‍රියේ ගිණිමැල සුව විඳින විටදීය. මෙම ගමන් මඟෙහි කතරගම දෙවියන් නිරතුරුවම වෙනස් වේශයකින් සැරිසරන බවට ඔවුහු

විශ්වාස කරති. සුදු වේට්ටියකින් සැරසී සුදු තලප්පාවක් ඉහ වටා බැඳගත් සැරයටියක් අතින් ගත් ශාන්ත සෘශිවරයකු ලෙස කතරගම දෙවියන් ජීවමානව හමුවූ පිරිස් පාදයාත්‍රාවට එක්වන්නෙකුට හමුවිය හැකිය.

මෙම ගමනේදී භයානක කුළුමීමුන් කල්ලි සුලභව මගදිග හමුවන අතර වන අලින්ද ඉඳහිට හමුවෙයි. රාත්‍රි නවාතැන්පොළ අවට වලසුන් සහ දිවියන් ඉඳහිට දැකිය හැකි අතර, කරවටක් ගිලී ගමන් කරනා ගංගාවල කිඹුලන් සිය ගණන් දැකිය හැකිය. නමුත් මෙම කිසිදු අයෙකු වන්දනාකරුවනට අනතුරක් සිදු නොකිරීම දෙවියන් දකින්නට යන බැතිමතුනට කරනු ලබන ගෞරවයක් බව සියලු දෙනාගේ විශ්වාසයයි. මෙම ලියුම්කරුද වරහනේ දී වන අලි සම්බන්ධ අත්දැකීමකට මුහුණ දුන් අතර, වනජීවී නිළධාරීන් සහ යුද හමුදාවේ භටපිරිස් මැදිහත් වී වන අලි පළවා හැර එම අවස්ථාවේ වරහනේ රැඳී සිටි පිරිසගේ ආරක්ෂාව තහවුරු කරන ලදී.

වයස මාසයේ බිළිඳාගේ සිට වයස අවුරුදු අනූව දක්වා බැතිමතුන් පාද යාත්‍රාවේ දී ලියුම්කරුට මුණගැසී ඇත. වන මං පසු කරමින් නාවල් අඩිය නම් තෙවන නැවතුමට පැමිණෙන බැතිමතුනට ඊළඟට හමුවන්නේ ජල දුර්ග සහිත මාර්ගයකි. කිඹුලන් බහුල මේ ජල තටාකයන්හි නේකවිධ සියොත්සිරින් පිරී තිබේ. කෙසේ වෙතත් මේ ජල තල හරහා ගමන් ගැනීම අන්තරාදායක වන්නේ කිසිඳු විටෙක මිනිස් සේයාවක් නොදකින දැවැන්ත කිඹුලන් විශාල වශයෙන් මෙම රාජධානියේ සිටිනා බැවිනි. නමුත්, කිසිඳු බැතිමතකු මේ ජලමං හරහා ගමන් කිරීමට බියක් නොදක්වති.


**වාලච්චේන සිට පාදයාත්‍රාවට එක් වූ දිනේෂන් අප සමඟ ළිංතුන ප්‍රදේශයේ දී දොඩමළු වූයේ මෙලෙසය.**



"මම වාලච්චේන ප්‍රදේශයේ ඉඳන් තමයි පාගමනට සහභාගී වුණේ. ඔකඳ දේවාලයේ ඉඳන් පාගමනේ එනවා. අපේ තව ගොඩක් ය ඉන්නවා. හමුදාවේ අය දන්සැල් දෙනවා, බෙහෙත් දෙනවා. ආමි මහත්තුරු කටගමුවේ කෑම උයලා දෙනවා. පළවෙනි දවස කිලෝ මීටර් 8 ක් ඇවිත් රාත්‍රියේ අපි නතරඋනා. එතැන වෙනදාට වඩා හොඳට පහසුකම් තිබුණා කියලා අපේ වැඩිහිටියෝ අපිට කිව්වා. ඒ වගේම දෙවැනි දවස අපි නතර උණේ කුඹුක්කන පත්තිනි දේවාලෙ ගාව. එතැනදිත් පහසුකම් සලසා තිබුණ විදිහ ඉතාම හොඳයි. ඊට පස්සේ අපි නතර උණේ මෙතන. මෙතනදිත් ඒ වගේමයි. අපි එන පාර දිගේ කිලෝමීටරෙන් මීටරේ වගේ වතුර ලබාදෙනවා. හමුදාවෙන් තමා ඒ දේවල් කරන්නෙත්. ඒ වැඩසටහන හරිම විශිෂ්ඨයි".

කතරගම පාද යාත්‍රාව ශ්‍රී ලංකාවේ සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍රයන්හි බහුවිධ වැදගත්කමක් දරයි. එය විවිධ ආගමික සහ ජාතික පසුබිම් සහිත ජනතාව එකට එකතු කරන පොදු වේදිකාවක් සපයයි. මෙමඟින් රටේ ජාතික සමගිය සහ සහජීවනය වර්ධනය වේ.

**පාගමනට පානදුර සිට එක්වූ සුගත් ධර්මපාල මහතා අප සමඟ කටගමු පිවිසුමේ දී මෙසේ අදහස් දැක්වීය.**



"අපි ඔකඳ ඉඳලාම එන්නේ. මේ සෙනඟට පහසුකම් දෙන එක ලේසි නෑ. ඒකට ලොකු මහන්සියක් වෙන්න ඕන. මග දිගට බවුසර් දාලා වතුර දෙනවා. මේවා කරන්න යුද හමුදාවට ඇර වෙන අයට බෑ. හමුදාවෙන් දෙන ඒ සර්විස් එක සෑහෙන්න වටිනවා. විශේෂයෙන්ම ආරක්ෂාව. කැලේ ඉන්න සත්තුත් එක්ක අපිව ආරක්ෂා කරන්න හමුදාව අපිව ගයිඩ් කළා. කුඩා කැබිලිත්තෙදි හමුදාව විශාල ආරක්ෂාවක් සැපයුවා.

අපි දමිළ සංස්කෘතිකාංග චාරිත්‍ර නොකෙරුවත් ඔවුන්ගේ ආගමික කටයුතුවල සම්බන්ධ වෙලා කටයුතුකිරීමට ලැබුණු අවස්ථාව භාග්‍යමත් අවස්ථාවක් ලෙස දකිනවා. ඇත්තටම මේ පාද යාත්‍රාව අතරතුරදී දැක්ක තවත් දෙයක් තමයි යුද්ධ හමුදාවේ දායකත්ව විශිෂ්ඨයි. යාලට පැමිණි වෙලාවේ අපි දැක්ක යුද්ධ හමුදාව දිවා රෑ නොබල අලි කොටි වලස්සුන්ගෙන් පිරිච්ච මේ භූමියේදී පාදයාත්‍රාවේ නිරත පිරිසට ආරක්ෂාව සපයනවා. පාද යාත්‍රාවට පානීය ජලය සපයල විශිෂ්ඨ සේවයක් ලබාදෙනවා. අපි සතුටු වෙනව යුද්ධ හමුදාවේ විශිෂ්ඨ සේවය ගැන" යැයි පැවසීය.

එසේම, පාද යාත්‍රාව යනු ශ්‍රී ලංකාවේ අද්විතීය සංස්කෘතික උරුමයක කොටසකි. එය පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වන පැරණි සම්ප්‍රදායකි. මෙම ගමන වනගත ප්‍රදේශ හරහා සිදු වන බැවින්, බැතිමතුන්ට සොබාදහම සමඟ සමීප සම්බන්ධතාවක් ඇති කර ගැනීමට අවස්ථාව ලැබේ. මෙය පාරිසරික සංරක්ෂණය පිළිබඳව වක්‍රාකාරව හෝ දැනුම්වත්භාවයක් ඇති කළ හැකිය.

පාද යාත්‍රාව කතරගම සහ ඒ අවට ප්‍රදේශවල ප්‍රාදේශීය ආර්ථිකයට ද සැලකිය යුතු දායකත්වයක් සපයයි. දේශීය වෙළඳුන්, ප්‍රවාහන සේවා සපයන්නන්, සහ විවිධ සේවා සපයන්නන් මෙයින් ප්‍රතිලාභ ලබති. මෙම දුෂ්කර ගමන මානසිකව හා ශාරීරිකව අභියෝගාත්මක වන අතර, එය බැතිමතුන්ගේ මානසික හා ශාරීරික ශක්තිය වර්ධනය කරයි. මෙම පාද යාත්‍රාව යනු හුදෙක් ආගමික වතාවතකට එහා ගිය, මානව බැඳීම්, ස්වභාවධර්මය සමග ඇති සම්බන්ධය සහ ආධ්‍යාත්මික පිබිදීමක් නියෝජනය කරන, සැබවින්ම අද්විතීය අත්දැකීමකි.



**දිලංක ගුණතිලක**
*පාදයාත්‍රාවෙන් අනතුරුව*



# රාත්‍රී බංකරයේ හොර ඩියුටිය

යුද පිටියේ නිදි වැරීම යනු වෙඩි සද්ද තරමටම සුලබ දෙයකි. අවදානම වැඩිවත්ම නිදිවැරීම ද වැඩිය. එසේ නොවන තැන්වල ගෙදරට වඩා හොඳින් නිදාගන්න අය ද නැතුවා නොවේ. දහවල, රාත්‍රිය, අව්ව වැස්ස, මීදුම, දුහුවිලි ක්‍රියාන්විතයේ නියැළි හමුදා සෙබළුන්ට වෙනසක් නොමැත. වෙනසක් දැණුන ද සිය අරමුණ යටපත් කර පාරිසරික සාධක ගැන තකන්නට ඔවුනට ඉස්පාසුවක් ද අවසරයක් ද නොවීය. කඳවුර තුළ හෝ ඉදිරි ආරක්ෂක වළල්ලේ රාජකාරී හා ඉන් ඔබ්බෙහි සිදුකරන රාජකාරී අතර තිබුණේ තදබල වෙනසකි. අවදානම අතින් මේ දෙයාකාරයේ රාජකාරී අවස්ථානුකූලව වෙනස් විය හැකි වුව ද වඩා දුෂ්කරතා අත්විඳීමට සිදුවූයේ කඳවුරෙන් හෝ ඉදිරි ආරක්ෂක වළල්ලෙන් පිටත රාජකාරී කළ හටපිරිස් වලටය. අව්, වැසි, පිණි වැනි පාරිසරික පීඩනයන්ට ද වනසතුරු බලපෑම්වලට ද ඉඳුරාම ලක්වූ පිරිස ඔවුන්ය. යුද බිම තුළ මේ කුමන තත්ත්වයක් යටතේ ක්‍රියාන්විත කටයුතුවල නියැලුන ද ඇතැම් සෙබළුන්ගේ හැසිරීම් පිටුපස තිබුණේ රසවත් තොරතුරුය.




90 දශකයේ මුල්භාගයේ පටන් මා රාජකාරී කළ මඩකලපුව ප්‍රදේශයේ උතුරේ මෙන් ඉදිරි ආරක්ෂක වළල්ලක් නොපැවති අතර, භූමියේ තැන තැන ඉදිකළ හමුදා කඳවුරු එහි විය. ප්‍රධාන මාර්ගයෙන් දුරස්ව තොප්පිගල, වාකරේ ආදී කැලෑබද ප්‍රදේශවල ද මඩකලපු පොළොන්නරු ප්‍රධාන මාර්ගයට යාබදව ද එවක කඳවුරු රාශියක් පැවතිණ. එම ක්‍රියාන්විත බිමෙහි විවිධ අද්දැකීම්වලට මුහුණ දෙමින් මා ගතකළ කාලය අදටත් බොහෝ මතකවලින් අනූනය. විශේෂයෙන්ම සෙබළුන්ගේ බංකර් රාජකාරී පිළිබඳවද කඳවුරු ජීවිතය පිළිබඳව ද ඇත්තේ රසවත් මතක එකතුවකි. (ඉන් බොහොමයක් මා විසින් 2023 වසරේ එළිදැක්වූ ''ආමරිය සීල්'' නමැති කෘතියෙහි ද ඇතුළත්ව ඇත)

එකල යුදබිමෙහි පැවති අවදානම හා දුෂ්කර බව නිසාම බංකර් තුළදී මෙන්ම ඉන් පිටත රාජකාරිවලදී ද වැඩි දෙනකු මොහොතකට හෝ ඇස්පියා ගත්තේ නැත. ක්‍රියාන්විත රාජකාරි යනු ජීවිත සමඟ කරන ගනුදෙනුවක් බැව් එහි සෙබළු හොඳින් දැනසිටියහ. මොහොතකට ඇස් පියවීම ජීවිතේම ඇස් පියවීමක් විය හැකි බැවින් ඔවුන් නිරන්තරව අවදියෙන් හා අවධානයෙන් සිටීමට ද වගබලා ගත්තේය. එනිසාම බංකර් තුළ රාජකාරිවලදී මෙන්ම ඉදිරි ආරක්ෂක වළල්ලේ හෝ ඉන් පිටත රාජකාරිවලදී ද රැය පුරා දෑස් දල්වා සිටීමට ඔවුහු වෙර දැරූහ.

යුදබිමේ සාමාන්‍ය බංකර් රාජකාරි යෙදෙනුයේ පැය දෙකෙන් දෙකටය. බංකරයක් සඳහා සෙබළු තිදෙනෙක් නම් කෙරෙන අතර සිටින හටපිරිස් සංඛ්‍යාව හෝ මතුවන අවදානම අනුව මෙම තත්ත්වයන් වෙනස් විය හැක. එහිදී, එක් අයකු පැය දෙකක සේවා

මුරයකින් පසු පැය හතරක් විවේක ගැනීම සාමාන්‍ය පිළිවෙතයි. බංකර් තුළ යකඩ ඇඳන් හෝ ලී වලින් තැනූ අට්ටාලයක් හෝ නොඑසේනම් බිමට එලන ලද සියෙස්ටා මෙට්ටයක් වැනි යමක් විවේක ගැනීම සඳහා භාවිතා කරයි. මෙය ද සෑම කඳවුරකම සෑම බංකරයකම එක හා සමාන නොවූ අතර ක්‍රියාන්විත ප්‍රදේශ අනුව ද සාමාන්‍ය, දුෂ්කර හා අතිදුෂ්කර යන තත්ත්වය යටතේ එම කටයුතු වෙනස් විය. කඳවුරක බංකර් ද දිවා රාත්‍රී ලෙස වෙන් කෙරේ. දිවා බංකර්වල පැය විසිහතර පුරාම මුර සෙබළු රැඳී සිටින අතර රාත්‍රී බංකර්වල රාජකාරි ඇරඹෙනුයේ සවස 6 හෝ ඊට ආසන්න වේලාවකය. එසේම, පසුදින උදෑසන හය පමණ වනවිට ඒවායේ රාජකාරි අවසන් වීම සිරිතය. දිවා බංකර් රාජකාරී Day Guard ලෙස ද රාත්‍රී බංකර් රාජකාරී Night Guard ලෙස ද නම් කෙරෙන අතර කඳවුරේ විශාලත්වය අනුව ඒ වටා ඉදිකෙරෙන බංකර් සංඛ්‍යාව ද තීරණය කෙරේ.

බංකරයක මූලික අරමුණ ආරක්ෂාව සලසා ගැනීමයි. ඒ අතරම ඒවා නිරන්තරව පිරිසිදුව, පිළිවෙළට තබා ගැනීමට ද සෙබළු වෙහෙස වූහ. කඳවුරක ඇති දිවා බංකර්වල විශේෂයෙන්ම එම තත්ත්වය දැකිය හැකිවිය. ක්‍රියාන්විත බිමෙහි වුවද එතරම් අවදානම් නොමැති කඳවුරුවල ඇතැම් බංකර් බොහෝ අලංකාරය. දිවා කල එම බංකර්වල නිරන්තරව හඳුන්කූරු පවා දැල්වුණු අතර, අවි ආයුධ පතුරම් හා බෝම්බ වර්ගවලට අමතරව ලියුම් ලියන්නට පොත් හා පෑන් ද හොඳින් එළිය විහිදෙන විදුලි පන්දමක් ද පිපාසයට වතුර බෝතලයක් හෝ කෑන් එකක් ද ඒවායේ වැරදුනේ නැත. එසේම, ඇතැම් බංකර්වල මුල්ලක බුදුරුවක් තබාගැනීමට කටයුතු කළ සෙබළු ද සිටියහ. ඒ සඳහා වැඩි දෙනකු යොදා ගත්තේ බුදුරුව සහිත කුඩා වෙසක් සුභ පැතුම් පතකි. එසේම, ඇතැම් අවස්ථාවල ආහාර ගන්නා පිඟන් කෝප්ප ද එහි කොහේ හෝ අස්සක සඟවා තිබිණ. යුද භූමියේ ආහාර පාන සැකසීම අද මෙන් ඒ සඳහා වෙන් වූ නිවස්නයක සුවපහසු ලෙස සිදුනොවූ අතර, එක් අයෙක් මුර රාජකාරියේ යෙදී සිටියදී සෙස්සෝ එහි සිටම ආහාරපාන ගත්හ. පසුදින නිවාඩු යාමේ අපේක්ෂාවෙන් ඒ සඳහා නියමිත වූ සෙබළු පෙරදා රාත්‍රී මුර රාජකාරීන්හි යෙදෙණුයේ අප්‍රමාණ ප්‍රබෝධයකිනි. එවන් අවස්ථාවල ඒ වනවිටත් ඔවුන් මනසින් තම නිවෙස් වෙත ගොස් හමාරය. ඒ තරමටම නිවාඩුව තරම් යුදබිමේ සිටි කෙනකුගේ හද පිනවන තවත් දෙයක් නොවූ තරමය. ඒ කෙසේ වෙතත් ''යුද බිමේ සෙබළකුට දිය හැකි ඉහළම සුබසාධනය පුහුණුවයි" යනුවෙන් සඳහන් පුවරු බොහෝ කඳවුරු තුළ සටහන් කොට තිබුණි.

එකල සටන්භූමියෙහි සෙබලුන් වැඩිපුර පරිහරණය කරන ලද්දේ කළු පැහැති ඉලෙක්ට්‍රොනික් අත් ඔරලෝසු ය. එහි පැත්තෙන් වූ කුඩා ස්විචය එබීමෙන් දැල්වෙන කොළ පැහැති බල්බය ආධාරයෙන් අඳුරේ වුව ද වේලාව බලාගත හැකි විය. එය කළු පැහැයෙන් යුක්ත නිසා අඳුරේදී පිටතට දර්ශණය නොවීම ද ක්‍රියාන්විත කටයුතුවලදී හමුදා සාමාජිකයින්ට ඉමහත් වාසියක් විය. එසේම. හමුදා කැලෑ ඇඳුමේ පැහැයෙන් (Cama) එවැනි ඉලෙක්ට්‍රොනික් අත් ඔරලෝසුවලට එකල රණවිරුවන් අතර පැවතියේ ඉහළ ඉල්ලුමකි. එසේම, යුද බිමේදී ඇතැම් බංකර්වල සෙබළු බැටරි බලයෙන් ක්‍රියා කරන කුඩා පොකට් රේඩියෝ පරිහරණය කළ අවස්ථා ද තිබිණ. බංකරයේ ඇතුළත කොහේ හෝ තැනක ඇහෙන නෑහෙන ගානට එය ක්‍රියාත්මක කළ ඔවුන් ඉන් විකාශය කෙරෙන ගීත ඔස්සේ මුර රාජකාරිවලින් බැහැර සෑම අවස්ථාවලම පවා මනසින් බොහෝ සුන්දර සිතුවිලි සමඟ ගත කරන බවක් පෙනිණ. එම සෑම කුඩා පොකට් රේඩියෝවකටම ඒරියල් එක ලෙස දිගු කම්බියක් හෝ වයරයක් බංකරයේ වහලයට උඩින් ඇද තිබූ අතර, එම ප්‍රදේශවල එකල සංඥා සබඳතා හිඟවීම හේතුවෙන් වැඩිපුර ඇසුනේ ගීතවලට වඩා ''සෝ" ශබ්දයයි. කෙසේ හෝ එහි එක නාලිකාවක් හෝ පැහැදිලිව ශ්‍රවණය කරගැනීමට සෙබළුන්ට සැලකියයුතු පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.



බංකරය යනු සෙබළුන්ගේ ස්ථාවර පුස්තකාලය ද විය. බොහෝවිට ඒවායේ නැති පත්තරයක් නොමැති තරම්ය. දිණමින, සිළුමිණ, සමුදුර කුමරි, සදරේණු, සිත්තර, සතුට ආදී සෑම ආකාරයේ පුවත්පතක්ම ඒ අතර විය. බැලූ බැල්මට නොපෙනුන ද සෑම බංකරයකම පාහේ කොහේ හෝ තල්කොටයක් අස්සේ බිරිඳ, සීදේවී වැනි පුවත්පත් ද එකල වැරදුනේ නැත.

බංකර්වල ඉහත කුමන කටයුතු සිදුවුවද එමගින් කඳවුරේ ආරක්ෂාව වෙනුවෙන් කිසිදු හිඩැසක් අඩුපාඩුවක් වන්නට කිසිවකුත් ඉඩ නොදුන්නේය. විශේෂයෙන්ම ක්‍රියාන්විත බිමෙහි පැවති අවදානම අනුව ඒ වෙත එල්ල වියහැකි මෝටාර් කාලතුවක්කු හෝ RPG ප්‍රහාරවලට ඔරොත්තු දියහැකි ලෙස ඒවා ශක්තිමත්ව සාදන්නටත් නිරතුරු එහි අලුත්වැඩියා කටයුතු සිදුකරන්නටත් කඳවුරුභාර නිලධාරීන්ගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ සෙබළු වගබලාගත්හ.

එකල ක්‍රියාන්විත බිමෙහි කඳවුරක බංකර් රාජකාරී සම්බන්ධව ද විවිධ වූ රසවත් කතා ගොන්නක් ඇත. ඇතැම් ජ්‍යෙෂ්ඨ සෙබළු කනිෂ්ඨයින් හා රාත්‍රී මුර රාජකාරී කිරීමේදී තම පැය දෙකේ සේවා මුරය නියමිත පරිදි නිමනොකර අනෙකාට පවරන අවස්ථා ද තිබේ. බංකර් රාජකාරී සඳහා බොහෝවිට යොදවනුයේ ලාන්ස් කෝප්‍රල්වරුන් හා සාමාන්‍ය සෙබළුන්ය. ඔවුන්ගේ රාජකාරී වේලාව මුරහල වෙත ලිඛිත නියෝගයක් මඟින් නිලධාරියකුගේ අත්සනින් යුතුව නිකුත් කෙරේ. නමුත්, කලාතුරකින් තැනක ඇතැම් ජ්‍යෙෂ්ඨ සෙබළුන් තම බංකරයේ මුර කාලසීමාව ඔවුනොවුන් කතාබස් කොට බෙදාගන්නා අවස්ථා ද වේ. එය බොහෝවිට එම බංකරයේ සිටින ජ්‍යෙෂ්ඨයාගේ උපක්‍රමයක් ලෙස ද සිදුවේ. එහිදී, බංකරයේ නිදිවර්ජිතව සිටියයුතු කාලය අඩුකර ගැනීම සඳහා ඇතැම් සෙබළු එලෙස කපටි ආකාරයෙන් කටයුතු කරති.

එහිදී, ඔවුන් සිදුකරණුයේ බංකරයේ ඇති පොදුවේ පාවිච්චි කරන ඔරලෝසුවේ වෙලාව තමාට අවශ්‍ය පරිදි කිසිවකුට නොදැනෙන්නට විනාඩි කිහිපයක් වැඩිපුර සිටින සේ වෙනස්කර මීළඟ සෙබළාට මුරය භාරදීමය. උදහරණයක් ලෙස රාත්‍රී 12ට අරඹා අලුයම 2ට තම සේවා මුරය නිමකරන අයකු තම මුරය අවසන් වීමට ප්‍රථම ඔරලෝසුවේ වේලාව වැඩිපුර විනාඩි ගණනක් ඉදිරියට කරකවා මීළඟ සෙබළාට මුරය භාරදීමය. එනම්, සැබෑ වේලාව අලුයම 1.30 හෝ 1.45 වෙද්දී අදාළ ඔරලෝසුවේ වෙලාව 2 ලෙස වෙනස්කොට එතෙක් නින්දේ පසුවූ අනෙක් සෙබළා ඇහැරවා ඔහුට රාජකාරිය භාරදීමය. ඇතැම්විට ඔහුද මීළඟ සෙබළාට වඩා ජ්‍යෙෂ්ඨ නම් පෙර සෙබළා මෙන්ම ඔහු ද කපටි අයකුනම් අලුයම 4ට තම මුර කාලය නිමකිරීමට තියෙද්දී කාටත් හොරා අනෙකාට මුරය භාරදෙනුයේ පෙර ලෙස මෙන් හෝ ඊටත් වඩා කාලයක් වෙලාව වෙනස් කරමිණි. අවසානයේ මේ කිසිත් නොදත් කනිෂ්ඨ සෙබළා සිය රාත්‍රී මුරයේ අවසන් පැය දෙක (4-6) ඔරලෝසුවේ සඳහන් පරිදි උදෑසන 6ට නිමකළ ද තවදුරටත් ප්‍රදේශය පුරා අඳුර පැවතීම හේතුවෙන් ඔහුට රාජකාරියෙන් මිදීමට ඉඩක් නොලැබේ. සැබැවින්ම එහිදී සිදුවනුයේ බංකරයේ ඇති ඔරලෝසුවේ වේලාව උදෑසන 6 වුවද සැබෑ වේලාව තවමත් අලුයම 5 හෝ ඊට ආසන්න වීමය. කලාතුරකින් තැනක සිදුවන එවැනි සිදුවීම් පිළිබඳ කනිෂ්ඨ සෙබළුන් තම බලධාරීන් වෙත රපෝර්තු කොට එලෙස වංචනික ලෙස රාජකාරී සිදුකළ සෙබළුන් දඬුවමක් ලෙස දිගින් දිගටම කඳවුරෙන් එළියේ ක්‍රියාන්විත රාජකාරීන් සඳහා යෙදවූ අවස්ථා ද තිබිණි. ඉහත තත්ත්වය එසේ වුවද තම සේවා මුරය අවසන් ව තිබියදීත් තමන්ට නිදිමතක් නොමැති අවස්ථාවල තම සහෝදර සගයාගේ මුරකාලයෙනුත් සැළකියයුතු වේලාවක් ස්වේච්ඡාවෙන්ම ආවරණය කරන සෙබළු ද යුදබිමේ ඕනෑතරම් සිටියහ.

(තවත් කොටසක් ලබන සතියේ)



ලුතිනන් කර්නල්
**සුජිත් චමින්ද එදිරිසිංහ**

# සෙබළ සිතුවිලි

## අද වෙත...

**නීල වර්ණ තණබිම් පුරා
ඉදිව ඇත සුවිසල්
මහ ගොඩක් ගල් කණු
එයින් පිටවන දුම් කඳු වළාවන්
පැතිරෙයි
මුලු මහත් වා තලය සිසාරා...
තැන තැන දමන කැළිකසළ
නිමක් නැති
යන්නට බැරිය පා තබා
මිහිතලය මත
දවසක් ඒවි අප සැම විඩාබර
වන
එක්වෙමු අප සැම
පිරිසිදු රටක් සැදුමට**

**සෙ/726361
කාසෙ සමන්මලී එච්පීඑන්
මූලස්ථානය - 7 ශ්‍රීලයුකාබ
යුද හමුදා කඳවුර
වාසවිලාන්, පලාලි**

## ජීවිතය...

**හිස් දෑතින් පැමිණ
බොහෝ දේ රැස්කර
සියල්ල එහිම තබා
හිස් අතින්ම යන්නට යන
දිගු සසර මගේ
තාවකාලික ලැගුම්හල...**

**සෙ/385357
රසෙ බංඩාර එස්එන්එච්බී
21 ශ්‍රීලංසිරෙ**

## එය රටාවක්...

**හැම මලකටම
තියනවා කථාවක්
අහන් ඉන්නට
ඔබට තිබුණද වෙලාවක්
නෙලාගන්නට තිබුණ
හදිසිය නිසාවත්
මඟ හැරෙන්නට හොඳම
නෑ එය රටාවක්**

**සෙ/332956
ලා/කෝ ධර්මප්‍රිය පීජීඑස්
19 ශ්‍රීලපාහ**

## හිත් ළඳමට...

**සුමුදු ලෙස දැවටෙන්න
බැරිනම්
මුදු සුළඟ මට ළං වෙලා
පාට ඉහිරුණු මතක
මංපෙත
සුසුම් පොද තව සොයනවා
මල් සුවඳ තවරන්න
එහෙනම්
සෙනෙහෙ කෙත්බිම් සොයා
හිත් ළෑමට ගුලිවෙන්න
අවසර
නැතිද මට...
සසර හුරු පුරුදු ගති
නැති නිසා...**

**සෙ/326357
ලා/කෝ ඒකනායක
ඩබ්ලිව්එම්ඒපීකේ
19 ශ්‍රීලපාහ**





# අපි තාමත් එකම තැන...

ජෑන්ඩියට හැඳගත් මහත්වරු
මේකප් උලාගත් නෝනාවරු
බලමින් ඔරලෝසු නිරතුරු
දුවයි උදයේම කඩිමුඩියෙ කන්තෝරු

පාරේ එකම කළබලයකි
ඔෆිස් බස් අහසින් පියාඹති
මොකද මන්දා මේ හැටි බිසී
රට වෙනුවෙන් සේවයට යති

ටී ටයිම් එකට එක පැයයි
ලන්ච් ටයිම් එකම වරුවයි
නිවාඩු දින ගණිමින් හිඳියි
හතරට කිට්ටු නම් ගෙදර පනියි

දින තුන්සිය හැට පහම දුවන
ගියත් එල නැත ඔෆිස් ගමන
කොහිදැයි මෙහෙමත් රටක් හැදෙන
අනේ අපි තාමත් එකම තැන

සෙ/753797
කෝප්‍රල් කුමාරසිංහ එම්පීජීඑම්
11 ඉසෙරේ - ජනමාධ්‍ය හා මව්මෙඅම

# බලාපොරොත්තුව...

උදාවන හිරු නැගෙයි දස අත
හිරු රශ්මි බෙදමින්
පිපෙන මල් සුවඳ දැනෙයි දස අත
හද මඬල වෙලා ගනිමින්
සුළං රැල් ගලා යයි රහසේ
හෙමිහිට ගීත ගයමින්
නොඑන වස්සානය වියැකී යාවිද
සැබෑ නොවන හීන දකිමින්
දිග කතාවක් ඇත ලියා තබන්නට
කොතෙක් මග ඇරුනිද සිතෙනවා
පාසලේ බුදු මැදුර ළඟ මැයි ගසේ
තවම මල් පිපෙනවා
ගස ළඟට වී තනිව හිඳ මා
තවම මල් නෙලනවා
ඔබ ළඟ නැති බව දනී
මගේ හද අඬනවා
ඉතිරි කරගත් කඳුළු උල්පත
රහසේ හෙමිහිට හැලෙනවා
ඔබගේ දෙනුවන් දකිනු රිසියෙන්
සිහින මංපෙත් දකිනවා

සැරයන් විජේසිංහ ආර්එම්එස්ආර්
9 ශ්‍රීලකාහ



# පිය සෙනෙහස...

දුර එහා හැරී නිහතමානීව
තවමත් රැඳෙන පියාගේ සෙනෙහස
කඳුළු රැල් අතර හිනැහෙන මුහුණ
එහා පියවර සුරකින්නට හැකි

අතට අතට ගැටී තවර ලොව
නිහත අභිමානී පියබිමක් සේ
බරපතල සිහින සැබෑ කරවන
පිය සෙනෙහසෙහි ලොවටම දේ

නිහතමානී හිනාවෙන් ගඟක් වාගෙයි
නැගෙනුත් නොනැගෙනුත් හිස මත රැඳී
හීන පවුරට බෝකරන සුසුමක්
ඉගිලී යන්න හදවතේ තනියෙන් දැනී

නොපෙනෙන යුධෙකින් සෙවණ සලසයි
නීල අහසේ බර හෙලන වැලි කඳුළු
මිටින් පෙනේ ඔහුගේ ආදරේ
පිය සෙනෙහස
කටු මත පෙතිවල හැඬුව

සෙ/ඊ101652
රසෙ කොඩිතුවක්කු කේවීඑස්අයි
2(සෙව්) ශ්‍රීලංසිරෙ

# ඇය...

සුලලිත රේඛා මවමින
ලාලිත ගමනකි හැඩවුණ
කාටත් හොරැහින් ගිලිහුණ
ලෝහිත කඳුලකි දෙනයන

ල/කෝ සම්පත් ජීඩබ්ලිව්ජී
අවිඅම - යුහමු



සෙබළ සිතුවිලි

# ආදර අම්මා...

සිත කෙතරම් වෙනස් උනත්
අහස කෙතරම් වෙනස් උනත්
පරිසරය කෙතරම් වෙනස් උනත්
මේ ලොවේ වෙනස් වෙන්නේ
නැතිම එක දේ
අම්මාගේ ආදරයයි

හිරු එන්නට කලින් ඇය නැගිට
කෑම සාදා අප බඩ කට පිර වූ ඇය
කිසිදා ඔබේ සෙනෙහස
අඩුකර නොමැත

දස මසක් මා කුස තුළ දරා
රතු ලේ කිරි කරලා
හොඳ නරක අපට කියා දීලා
ඔබේ සෙනෙහස
කියා නිමකරන්න බෑ කිසිදා
මතු උපදින ආත්මයක් ආත්මයක් පාසා
මගේ අම්මා වී ඉපදේවා
මගේ සුදු අම්මා

තුසෙ පතිරණ පීපීඩීඑම්ආර්
4 ශ්‍රීලකාහ



# ඈ වෙත...

ඔබ දුටු මුල් දිනයේ
බැඳුනා සිත නොකැඩෙන ලෙස
එදවස මා ඔබ දුටුවේ කිරිල්ලියක් සේ
සිතින් ආලය කළා ඔය දෙනෙතට
ඔබටත් රහසේ
නමුත්,
මොකක්දෝ කරපු පවකට
ඔබ ලබන්නට පිං මදිවිද
පතන්නෙමි මතු බවයක
ඔය දෙනෙත් මානයේ
කොතැන හෝ තැනක ඉපිද
ඔය රුව යලි දකින්නට

සෙ/11කිපු02319
සැරයන් අබේසිංහ ආර්පීකේජීඑස්සී
11 ශ්‍රීලංජාආබමු
ජනමාධ්‍ය හා මව්මෙඅම
යුහමු



# කිරි අම්මාගේ සිහිනය

– කෙටි කතාව

ඈ ළමයො... අපිට බැරිද දන්ත ධාතූන් වහන්සේ බලන්න යන්න...?

රූපවාහිනිය අසළ දහවල් පුවත් නරඹමින් සිටි කිරි අම්මාගේ හඬ අවදි වූයේ නිතැතින්මය.

අම්ම කොහොමද ලෙඩ තියාගෙන ඔය පෝළිම් ගානෙ ඉන්නේ... පේන්නෙ නැද්ද මිනිස්සු මරාගන්න හැටි... කුස්සියේ උයමින් සිටි අම්මාගෙන් කිරි අම්මාගේ පැනයට පිළිතුරු ලැබුණේ එලෙසය.

මට තියෙන්නෙ එක කරුම ලෙඩයිනෙ බං... පේන්නෙ නැද්ද මටත් වඩා වාරු නැති, ඇවිද ගන්නවත් බැරි වයසක උන්දල රෝද පුටුවලිනුයි, කිහිලි කරුවලිනුයි ඇවිත් හිටියෙ. හිතුණොත් මං තනියෙන් හරි දළදා වඳින්න යනව... උඹල කවුරුත් මගෙ තනියට නාවට කාරි නෑ.

පියසීලි මැණිකේ යනු මගේ කථාවේ කථානායිකාව යැයි කීවොත් නිවැරදිය. ඇය මගේ මවගේ ආදරණීය මෑණියන් වන අතර, සීයාගේ අභාවයෙන් පසු ඇය නිතරම ආගම දහම වෙනුවෙන් තම කාලය වැය කිරීමට පුරුදුව සිටියේය. හැම පොහෝ දිනයකට පන්සල වෙත ගොස් සිල් ගැනීමට, වන්දනා ගමන් යැමට ඇය බොහෝ ආශා කළාය. නමුත්, නොසිතූ මොහොතක පිළිකා මාරයා ඇගේ මුළු සිරුරම වසාගත්තේ ඒ නිදහස් ජීවිතය සහමුලින්ම පහතට ඇද දමමින්ය. වෙනදා පන්සල් යැමට සහ වන්දනා ගමන් යැමට දින වෙන්කරවාගත් කිරි අම්මා දැන් මහරගම පිළිකා රෝහල වෙත ප්‍රතිකාර ගැනීම සඳහා උදේ සවස ගාටන්නට සිදුවී ඇත. එහෙත් ඇය ගතින් දුර්වල වූවත් පෙර පුරුදු නම් අතහැරීමට කැමැත්තක් නැත. පොහෝ දිනයට සිල් ගන්නටත්, වන්දනා ගමන් යන්නටත් ඈ කෙතරම් උත්සාහ කළද මව එයට ඉඩ නොදුන්නේ කිරි අම්මාගේ අසනීප තත්ත්වය නිසාවෙනි. එයින් තරමක් කිරි අම්මාගේ සිත රිදුන තැන්ද නැතුවාම නොවේ.

කොල්ලො... උඹටවත් බැරිද මාව නුවර එක්කන් යන්න. උඹලගෙ අඳුරන ආමි එකේ මහත්තුරු, යාළුවො එහෙම ඇති මයෙ හිතේ... ඒ උදවියට කියල පුළුන්නෙ මාව ඇතුළට එක්කන් යන්න...

ඉස්සර වගේ දැන් එහෙම බෑ කිරි අම්මෙ... මේ පාර ලොක්කන්ටත් පොඩ්ඩන්ටත් නීතිය එකයි... හැමෝම යන්නේ එකම පෝළිමේ... අනික කිරි අම්ම කොහොමද දවස් දෙක තුන පෝළිම්වල ඉන්නේ... ඔය ලෙඩත් එක්ක... අපි බලමුකො ඔය ලෙඩේ ඉක්මනට හොඳ කරගෙන ඊළඟ පාර දළදා බලන්න යන්න...

අනේ ළමයෝ... කවුද දන්නේ මං අද හෙට මැරෙයිද කියල... උඹලගෙ උදව් මට ඕනි නෑ... මට අර ඇසිලින් කිව්ව නිමල් ළමයගෙ බස් එකේ නඩයක් යනවා කියල දළදා වඳින්න. මං හිතුනොත් ඒ අයත් එක්ක යන්නං...

කිරි අම්මා සහ මා අතර කුඩා කල සිටම තිබුණේ අත්නොහැරීමට නොහැකි වූ බැඳීමකි. මා යුද්ධ හමුදාවේ රාජකාරී කිරීම පවා ඇයට ආඩම්බරයක් ගෙනදෙන කරුණක් විය. "මගෙ හමුදාවේ මුණුබුරා" යැයි පවුලේ අයත්, ගමේ උදවිය ඉදිරියේත් උදම් අනන්නට වූයේ ඇය මා කෙරේ ඇති දැඩි ස්නේහයත්, ගෞරවයත් නිසාවෙනි. මේ වනවිට මා රාජකාරී කරනු ලබන්නේ මහනුවර ප්‍රදේශයේ යුද්ධ හමුදා කඳවුරකය. දන්ත ධාතූන් වහන්සේ වන්දනාමාන කිරීමේ පුණ්‍ය කටයුත්ත උදෙසා අප කඳවුරේ මා ඇතුළු සහෝදර සෙබළුන් පිරිසක්

ද යොදවා තිබූ අතර, මාගේ නිවාඩු යෑමට නියමිත දින ගණන සපුරා තිබූ හෙයින් දින දහයක නිවාඩුවක් ලබා නිවසට පැමිණියෙමි. දළදා මාලිගාවේ රාජකාරී යෙදී සිටියදී වයෝවෘද්ධ වූ මව්වරුන් සහ පියවරුන් හට වාරුවක් වූ අවස්ථාවන්වල මට නිතරම කිරි අම්මා ගැන සිහිවිය. මටත් ඇයට දන්ත ධාතූන් වහන්සේ පෙන්වන්නට ඇත්නම් යැයි කරුණු සිහියට නැගුනත් ඇයගේ රෝගී තත්ත්වය නිසාවෙන් එම ආශාව සිතින් යටපත් කරගතිමි.

මුණුබුරා හමුදාවෙ ඉඳලත් මට දළදා බලන්න යන්න බැරි උනා... යැයි සිතුවිල්ල කිරි අම්මාගේ සිතෙහි ඇති වී ඇද්දැයි යන කරුණ ඇය මා වෙත කළ ඉල්ලීමෙන් පසු මගේ සිතේ තදින්ම කාවැදී තිබුණි...

කිරි අම්මේ අපි යන්ද නුවර දන්ත ධාතු වඳින්න...? බණ පොතක් කියවමින් කාමරයේ හාන්සි වී සිටි කිරි අම්මා ළඟට ගොස් මම හෙමින් අසුවෙමි...

උඹට පුළුවන්ද කොලුවෝ නාකි මාව අර සෙනඟ ගොඩ අස්සෙ එක්කන් යන්ඩ... කිරි අම්මා උපහාසාත්මක ස්වරයෙන් මගෙන් ඇසීය...

ඇයි බැරි කිරි අම්මේ... මං ගිය සතියෙ මාලිගාවෙ ඩියුටි දාල ඉද්දී කිරි අම්ම වගේ තවත් ආච්චිල ගොඩක් ඇතුළට එක්කන් ගියේ... මං අම්මව කොහොම හරි කැමති කර ගන්නම්... පොඩි කට්ටක් කන්න තියෙනවා... ඒත් කිරි අම්මට දළදා හාමුදුරුවො දකින්න ලැබෙන එක කොච්චර දෙයක්ද...

පුතාගෙ කැමැත්තක්... හැබැයි ඉතිං උඹලගෙ අම්මත් එක්ක මට දළදා වඳින්න වෙන්නෙ නෑ මේ කපේට...

හරි හරි මං අම්මගෙයි තාත්තගෙයි අවසරේ ගන්නම්... කිරි අම්ම ලෑස්ති වෙන්නකො නුවර යන්න...

කිරි අම්මාගේ මුහුණින් දිස්වූයේ බලාපොරොත්තු සහගත බැල්මකි. මගේ එකම අරමුණ වූයේ කිරි අම්මා හට දළදා වහන්සේ දැකබලා ගැනීමට අවස්ථාව සලසා දීමයි.

එදින සවස නිවසේ සියලුදෙනා රාත්‍රී ආහාරය ගන්නා අවස්ථාවේදී මගේ හිත තුළ කැකෑරෙමින් තිබූ අදහස ඉදිරිපත් කළෙමි.

අම්මේ... මං කිරි අම්මව නුවර එක්කන් යන්නද...?

පිස්සුද ළමයෝ... ඔයාට පුළුවන්ද කිරි අම්මව බලාගන්න...? ඒ සෙනඟ ගොඩ අස්සෙ කිරි අම්මට අමාරු වුණොත් ඔයා මොනව කරන්නද...? ඔයා හොඳටම දන්නවනෙ එයාගෙ තත්ත්වෙ ගැන...

මං තනියෙන් නෙමෙයිනෙ අම්මෙ එතන ඉන්නේ... අනික කිරි අම්ම වගේ ඔත්පල වෙච්ච මිනිස්සු කොච්චර ආවද දළදා වඳින්න... අපේ කොල්ලො කී දෙනෙක් ඒ වගේ අය ඇතුළට එක්කන් ගියාද...?

ඒක ඇත්ත පුතේ... ආච්චිගෙ ලෙඩේ වෙනම එකක්... එයා මිනිස්සු අස්සෙ තෙරපෙන්න ගිහින් අමාරු වුණොත් මොනව කරන්නද? ඒ මනුස්සට තව ටික කාලයක් හරි ජීවත් වෙන්න තියෙන ආයු කාලය අඩුවෙන වැඩක් ඕක... තාත්ත පැවසුවේ එලෙසය.

අම්මයි තාත්තයි මං ගැන විශ්වාසෙ තියන්නකො... මං කිරි අම්මව පරිස්සම් කරගෙන දළදා වැඳළා ගෙදර එන්නංකො...

කෙසේ හෝ දැඩි පෙරැත්ත මත මවගේ සහ පියාගේ අවසරය ලබාගත් මා පසුදින නුවර බලා පිටත්වීමට සැලසුම් කළෙමි. නුවර යාමේ අවසරයෙන් ලැබූ උද්යෝගයෙන් පිරී සිටි කිරි අම්මාට දළදා වහන්සේ දැකබලා ගන්නා තෙක් ඉවසුම් නොමැති විය.

පසුදින උදෑසන මමත් කිරි අම්මාත් දුම්රියෙන් නුවර බලා පිටත් වූ අතර, දහවල් දෙක පමණ වනවිට නුවරට පැමිණියෙමු. මා දළදා මාළිගාවේ රාජකාරී කළ කාල වකවානුවේ සිටි ජනතාව වඩා වැඩි පිරිසක් මේ වන විට පෝළිම්වල රැඳී සිටින බව පෙනෙන්නට විය. කෙසේ හෝ දින දෙකක් පමණ පෝළිමේ රැඳෙමින් කිරි අම්මාගේ ආශාව සපුරාලීමට මා හට හැකිවිය. එම දින දෙක තුළ පෝළිමේ රැඳී සිටි අවස්ථාවේදී කිරි අම්මා සුළු රෝගාබාධයන්ට ගොදුරු වූ නමුත්, එම ආබාධ ගණනකට නොගත් ඇය තම දෑස්වලින් දළදා වහන්සේ දැකබලා ගැනීමේ ආශාව ඉෂ්ඨ කරගන්නට විය.

දන්ත ධාතූන් වහන්සේ දැකබලා ගනිමින් දළදා මාලිගාවෙන් මා සමග පිටතට පැමිණි කිරි අම්මා හඩමින් පවසන්නට වූයේ මයෙ රත්තරං පුතා බුදුබව අත්වෙන්න ඕනැ යන වචන කීපය පමණි. එය ඇසූ මගේ දෑස් ද කඳුලින් තෙත් කරවීමට සමත්විය.

ඕක මොකක්ද කිරි අම්මේ... කිරි අම්මගෙ ආසාව ඉෂ්ට වුනානෙ... ඒ ඇති මට... හැඩුම් ස්වරයෙන් එම වචන පෙළ මගේ මුවින් පිටවිය.

දළදා වහන්සේ වන්දනා මාන කිරීමෙන් පසු එදින නිවස වෙත පැමිණි කිරි අම්මා නිවැසියන් හට සංචාරයේ විස්තර එකින් එක විස්තර කරන්නට විය.

මයෙ මුණුබුරා නිසා දළදා හාමුදුරුවො ඇස් දෙකෙන් දැකගත්ත... දැං ඉතිං මයෙ පණ ඩිංග ගියත් කාරි නෑ... කිරි අම්මාගේ මුවින් පිටවූ අවසන් වචන කීපය එය විය.

කිරි අම්මාගේ රෝගී තත්වය නිසා මානසිකව වැටී සිටි තැනින් මඳක් හෝ සැනසුමක් ලැබීම අම්මගේත්, තාත්තගේත් අස්වැසිල්ලට හේතුවක් විය.

පසුදින උදෑසන නැගිට නුවර සංචාරයේ රසමුසු තැන් මෙනෙහි කරමින් ඇඳෙහි වැතිරී සිටි මා හට එක්වරම කිරි අම්මාගේ කාමරයෙන් කෑ ගැසීමක් ඇසිණි. මම වහා ඇඳෙන් පැන ඒ දෙසට දිව ගියෙමි. කිරි අම්මාගේ ඇඳ අසල අම්මාත්, තාත්තාත්, නංගීත් විලාප තියන්නට වූහ. මමද වහා ඒ වෙත ගියෙමි. වෙනදා මෙන් කිරි අම්මාගේ මුහුණ සිනාමුසු වුවත් ඇයගේ ශරීරයේ උණුහුම පහව ගොස්ය. එකවරම පෙරදින ඇයගේ මුවින් පිටු වූ වචන පෙළ මා හට මතක් විය. "මයෙ රත්තරං පුතා බුදුබව අත්වෙන්න ඕනෑ".

කිරි අම්මා මා වෙතින් බොහෝ දුර ගොස් අවසන්ය. අදටත් ඇයගේ දුරස්වීමට මා හේතුවක් වූවාද යන කරුණ මාගේ සිතට නිතර වදදෙන කරුණකි. "ඒ මනුස්සට තව ටික කාලයක් හරි ජීවත් වෙන්න තියෙන ආයු කාලය අඩුවෙන වැඩක් ඕක..." පියාගේ ඒ වචන පෙළ නිතර නිතර මා මතකයට නැගේ. කෙසේ වුවද, කිරි අම්මා නම් සුවසේ නිවන් ගිය බව මා හොඳහැටි දනිමි.




■ කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑච්එම්

11 ඉසේරෙ


*__පාඨමාලා අංක 89 ට සම්බන්ධ සිදුවීමකි.__*

## නිවැරදි ටොක්ක

ඇකඩමියේ පුහුණුව යනු ඕනෑම නිලධාරියකු හට ජීවිතයේ අමරණීය මතකයන් පිරුණු නැවත කිසිදා නොඑන කාලපරිච්ඡේදයකි. නිල ඇඳුමට රටට සේවයක් කිරීමට අභිමානවත් හමුදා නිලධාරියකු වීමේ බලාපොරොත්තුවෙන් වාසනාව හා දක්ෂතාව මතම තේරී පත් වී ඇකඩමිය වෙත පැමිණෙන තරුණයින්ට ශාරීරික පුහුණුව, යුද පුහුණුව පමණක් නොව විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි දේශණ හා විභාගවලට ද මුහුණ දීමට සිදුවේ.

එහිදී, පුහුණුව තුළ දේශන සෑම දිනකම පාහේ පැවැත්වෙයි. උදෑසන අවදි වී ශාරීරික පුහුණු හා සරඹ පුහුණුවෙන් වෙහෙසට පත් වන අප දේශන ශාලාව තුළදී නොදැනීම නින්ද යාම ඉතාම සුලබය. මේ සිදුවීම ද ඒ හා සම්බන්ධය. මතකය හැටියට ඒ දේශනය සිදුකරන නිලධාරීතුමා ඉතා දැඩි විනයක් කැඩෙට් නිලධාරීන්ගෙන් බලාපොරොත්තු වූ ඇත දුටුවත් සිතට බියක් ගෙන දුන් නිලධාරියෙකි. ඉතින් මම එදින දැඩි නිදිමත කෙසේ හෝ ඉවසා දරා දේශනයට සවන් දී සිටියෙමි. නමුත්, මඳ වේලාවකින් මාගේ අසලම සිටි සගයා තද නින්දකට පත් වී සිටි අතර, ඔහුගේ නින්ද නැති කිරීමට හිසට ටොක්කක් ඇනීම මට භාරවිය. නමුත්, ඔහු මාගේ මිතුරා නිසා තරමක් හෙමින් ඔහුට ටොක්ක ඇන්න ද එයට සෑහීමකට පත් නොවූ පෙර කී නිලධාරී නැවත නිදා සිටි මිතුරා ලවා මට නිවැරදිව ටොක්කක් අනින හැටි නිදර්ශයක් ලබා දීමට නියෝග කළේය. නොනිදා දැඩි ඉවසීමෙන් නිදිමත දරා සිටි මට. අවසානයේ සිදුවූයේ එතෙක් ජීවිතයේ මා ලැබූ වේදනාකාරීම ටොකු පහර නිදා සිටි මිතුරාගෙන්ම එල්ල වීමය.







*__2014 වර්ෂයේ කාන්තා කෙඩෙට් පාඨමාලාවක් සම්බන්ධ සිදුවීමකි.__*

## අපූරු කෑම

එවකට වැඩිම කෙඩෙට් නිලධාරිනියන් පිරිසක් සහභාගී වූ පාඨමාලාවක් ලෙස කාන්තා කෙඩෙට් නිලධාරි පාඨමාලා අංක 13 නම් දරා තිබුණි. පිරිස වැඩිවූයෙන් එහි වාසි මෙන්ම අවාසි සහගත අවස්ථා ද තිබිණ. කෙඩෙට් නිලධාරිනියන්ගේ ශරීර ස්කන්ද දර්ශකය පවත්වා ගැනීමට සහ පාලනය කිරීමට මුල් වකවානුව තුළ ශාරීරික අභ්‍යාස පුහුණු උපදේශකවරියන් මහත් පරිශ්‍රමයක් දැරූහ. දිනක් උදෑසන අප කණ්ඩායම ශාරීරික අභ්‍යාස පුහුණුවීම් සඳහා පිටත්ව යෑමට සූදානම්ව සිටි අවස්ථාවක පුහුණු උපදේශකවරියන් හදිසියේම භටනිවාසය වෙත කඩා පනින්නට වූහ. එහිදී, කෑ මොර දෙමින් පාඨමාලාභාර උපදේශකවරියන් භටනිවාස කොරිඩෝවෙහි අපව පෝලිම් කළ අතර, ඔවුහු තමාට අදාළ කාමරය ඉදිරියෙන් සිටගන්නා මෙන් අපහට විධානය කළහ. සිදුවන්නට යනදේ කුමක්දැයි නොදැන බිරාන්තව සිටි පාඨමාලා සාමාජිකාවෝ මීයට පිම්බාක්මෙන් විය. උපදේශකවරියන් කාමර තුළට යත්ම අදාළ කාමරයෙහි අයිතිකාරියන් දෙදෙනා ද රැගෙන ඇතුළට ගිය අතර, එහිදී අල්මාරි, ලාච්චු, ට්‍රන්කා පෙට්ටි, අලි කකුල් ආදී සියලු අහුමුලු ඇද බලමින් කුමක් සොයනවාදැයි යන්න කාමර කිහිපයක්ම ඔවුන් විසින් සෝදිසි කළ පසු අපහට වැටහිණ. "මේන්න බටර් කටේ... කටේ..." යනුවෙන් උපදේශිකාවක් කෑගසනු ඇසීය. තවත් කාමරයකින් කොමඩු ගෙඩියක් එළියට ගෙනැවිත් එය කෑලි කෑලි වෙන්වෙන්නට කොරිඩෝවෙහිම පොළොවේ ගසා අපහට කිසිවක් ඉතිරි නොවන ලෙසට අහවර කරන්නට විධාන දුන්හ. කිසිවක් හසුනොවූ කාමරවල සාමාජිකාවන් සියල්ල එකතුකොට කෑම බීම හසුවූ කාමරවල සාමාජිකාවන්ට උරුමව ඇති ඉරණම පෙන්වීම සඳහා පෙලගස්වා අපව කාමර වෙත එක්ක ගිය කල්හි එහිදී දුටු දර්ශනයන් අතර වූයේ ඇඳකට නැඟ බටර් කන අයෙක්, බිම තිබූ කොමඩු කන පිරිස, කිරිපිටි කන පිරිස් ආදී තමා ළඟ තිබූ ඒ ඒ ආහාර යහමින් එකවර භුක්ති විඳින පිරිස්ය. ශාරීරික අභ්‍යාස පුහුණුවට පෙර හොඳ හැටි බඩ කට පුරවා එයට සහභාගී වීමට හැකිවූ අපහට ශාරීරික යෝග්‍යතා අතරවාරයේ ඇඟට දැනෙන තරමින් අතුරුපසක් ලබාදීමට ද පාඨමාලාභාර නිලධාරිනිය ඇතුළු උපදේශකවරියෝ අමතක නොකළහ.

**1992 වසරේ සිදුවූ මෙම රසවත් සිදුවීම ස්වෙච්ඡා පාඨමාලා අංක 17 ට අයත්වූවකි**

# අපූරු දඬුවම



එවකට යුද හමුදා විද්‍යාපීඨයේ පුහුණුව ලැබූ ස්වෙච්ඡා නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් පැවතියේ යාබද ස්වෙච්ඡා පුහුණු පාසල් පරිශ්‍රයේ (VFTS). එහි කෙඩෙට් නිලධාරීන් සඳහා වෙන වෙනම කාමර පහසුකම් නොතිබුණු අතර, ඒ වෙනුවට ඔවුන් රැඳී සිටියේ භට නිවාසවලය. රාත්‍රී 10.15 වෙද්දී එම භටනිවාසවල විදුලි පහන් නිවාදැමීම අනිවාර්ය විය. උදෑසන සිට දුෂ්කර කාර්ය බහුල පුහුණුවල නිරත කෙඩෙට් නිලධාරීන්ට ප්‍රමාණවත් නින්දක් ලබාගැනීම සඳහා ඉඩ ප්‍රස්ථාව සැලසීම එහි අරමුණයි. එබැවින් සෑම කෙඩෙට් නිලධාරියකුම සවස පුහුණුව අවසානයේ නින්දට යනතෙක්ම එම සීමිත පැය කිහිපය තුළදී තම පුද්ගලික කටයුතු සියල්ල කළමනාකරණය කර ගැනීමට සමත්වෙති. ඒ අතර ඇතමුන් එලෙස විදුලි පහන් නිවාදමා සියලු දෙනා නින්දට ගිය පසුව ද ඉටිපන්දම් එළියෙන් තම කටයුතුවල නියැලෙන අයුරු දැකගත හැකිය.

ඇතමෙක් තේ සදති. ඇතමෙක් බූට් පොලිෂ් කරති. ඇතමෙක් ඇඳුම් මදිති. ඇතමෙක් අලිගැටපේර කති. එලෙස පුරුද්දක් ලෙස ප්‍රමාද වී එම කටයුතුවල නියැලෙන කෙඩෙට් නිලධාරියකු හෝ කිහිපදෙනකු ඕනෑම පාඨමාලාවක සිටිති. මෙහි කතානායකයා කෙඩෙට් නිලධාරී චාමරය. රාත්‍රී 10.15ට ලයිට් නිමාදැමූ සැනින් ඔහු භටනිවාසයේ දොරකඩට පැමිණ වසාතිබූ දොරපියන අස්සෙන් දෙපස බලන්නට වූයේ කුතුහලයෙන් යුතුවය. සුදු ටී ෂර්ට් එකකින් හා සුදු කොට කලිසමකින් සැරසී සිටි ඔහු පැළඳ සිටියේ රබර් සෙරෙප්පු දෙකකි. එවක එහි සෑම භටනිවාසයකම වැසිකිළි හා නාන පහසුකම් තිබුණේ භටනිවාසයට යාර කිහිපයක් පිටතිනි. ඒ අනුව සෑම කෙඩෙට් නිලධාරියකුටම එම අවශ්‍යතාව සඳහා පිටතට යා යුතු විය. නමුත්, එහිදී රබර් සෙරෙප්පු පැළඳ එළිපෙහෙලියේ ඇවිදීම ඔවුනට තහනම් විය. කෙසේ හෝ පෙරකී කෙඩෙට් චාමර අඳුරේම භටනිවාසයෙන් එළියට පැමිණ දෙපස විපරම් කොට කිසිවකුත් එහි නැති බව තහවුරු කරගැනීමෙන් අනතුරුව ක්ෂණිකව වැසිකිළිය කරා දිව ගියේ සිය අවශ්‍යතාවය ඉටුකර ගැනීමේ අදහසිනි. ඒ අනුව තවත් විනාඩි කිහිපයකින් අනතුරුව එහි සිට ද දෙපස විපරම් කොට යළි ඔහු භටනිවාසය වෙත දිව ආවේ සැහැල්ලු සිතිණි. නමුත්, ඔහුගේ එම අස්වැසිල්ල පැවතියේ මොහොතකි. එහිදී, ඔහු දුටුවේ භටනිවාසයේ දොරකඩ රෞද්‍ර බැල්මක් හෙලමින් බලා සිටින කඳවුරේ කාර්යභාර නිලධාරියා. එක එල්ලේම ඔහුගේ චෝදනාව වූයේ රබර් සෙරෙප්පු පැළඳ සිටීමත් එලෙස අවේලාවේ භටනිවාසයෙන් පිටතට ඒමත් පිළිබඳවයි.

වහා සීරුවෙන් ඉරියව්වට පැමිණි කෙඩෙට් නිලධාරී චාමර එහිදී කියූ නිදහසට කාරණා කිසිවක් එම නිලධාරීට වලංගු නොවීය. අවසානයේ එම නිලධාරියා ඔහුට බැන වදිමින් නියෝග කරන ලද්දේ ඔහු ඇඳ සිටි කොට කලිසම ගලවා තබා භට නිවාසයේ කෙලවර බිත්තිය තෙක් පිනුම්ගසා (Forward rall) විනාඩි දෙකක් ඇතුළත නැවත එහි පැමිණෙන ලෙසය. එලෙස ලද නියෝගය හමුවේ මොහොතක් හෝ ප්‍රමාදයකට චාමරට ඉඩක් නොවීය. නියෝග ලද පරිද්දෙන්ම හැඳසිටි කොට කලිසම භට නිවාසයට ඇතුල්වන තැන වූ කුඩා මේසය මත තැබූ ඔහු අඳුරේම ඉදිරියට පිනුම් ගසන්නට පටන් ගත්තේය. එහිදී, භටනිවාසයේ දෙපස වූ ඇඳන් පේළි දෙක මැද්දෙන් අඛණ්ඩව පිනුම් ගසමින් ඉදිරියට යන චාමරට ඇතැම් ඇඳවල් අසල ඉටි පන්දම් එළියෙන් තම පුද්ගලික වැඩ කටයුතුවල නිරත වන හිතවතුන්ද දැක ගත හැකිවිය. භට නිවාසයේ එහා කෙලවර බිත්තිය තෙක් අවම වශයෙන් පිනුම් 16ක් වත් ගැසිය යුතු විය. නැවත ආරම්භක තැනට එන්නටද එම වාර ගණනම පසුකළ කෙඩෙට් චාමර දොරකඩට පැමිණි වහාම සීරුවෙන් ඉරියව්වට පැමිණීමට උත්සාහ ගත්තේය. අඛණ්ඩව වේගයෙන් පිණුම් ගසන්නට වීම නිසා ඒ වනවිට ඔහු පත්ව සිටියේ කැරකිලි ස්වභාවයකිනි. කෙසේ හෝ වැනි වැනී කෙලින් සිටගත් ඔහු සීරුවෙන් ඉරියව්වේම සිට අවට බලන්නට වූයේ දඬුවම් නියම කල නිලධාරියා එහි ඇතැයි සිතමිනි. නමුත්, සිදුව තිබුණේ අනෙකකි. අදාළ නිලධාරියා ඉන් නික්මගොස් තිබුණේ ඊට බොහෝ වේලාවකට පෙරාතුවය. එනම් කෙඩෙට් නිලධාරී චාමර අඳුරේම පිනුම් 36ක් ගසා ඇත්තේ කිසිවකු ඒ පිළිබඳ අධීක්ෂණය කිරීමට නොසිටි තත්ත්වයකදීය. අවසානයේ කාටත් හොරා ඔහු භටනිවාසයේ දොර අසල මේසය මත දමාගිය කොට කලිසම ඇද ගන්නට වූයේ වැලි දූවිලි තැවරුණු තම පිටුපස ප්‍රදේශය අතින් පිසදා ගනිමිනි. පෙරදා රාත්‍රියේ තමාට මුහුණපාන්නට වූ එම සිදුවීම කිසිවකුට නොකියන්නට චාමර වගබලා ගත්තේ ඇති වූ ලැජ්ජාව නිසාමය. නමුත්, භටනිවාසයේ එදින රාත්‍රියේ ඉටිපන්දම් එළියෙන් තම කටයුතු සිදුකරමින් සිටි කිහිපදෙනකු "ඊයේ රෑ ලයිට් නිවපු වෙලාවේ මොකද්දෝ කලු ගුලියක් බිලට් එක මැද්දේ එහාට මෙහාට රෝල් වෙනවා වගේ යන්තම් මතකයි" කියන අයුරු නම් චාමරට ඇසිණ.


### හසලක විරුවාගේ වීරත්වයට...

# 34 වසරක් සපිරේ

*1991 ජූලි 14 - 2025 ජූලි 14*



1991 වසරේ සිදු වූ අලිමංකඩ ප්‍රහාරය මෙරට තිස් වසරක යුද ඉතිහාසය තුළ සන්ධිස්ථානයකි. ඊට ප්‍රධානතම හේතුව වූයේ ඉතිහාසයට "හසලක ගාමිණී" ලෙස වීරයෙකු බිහිවීමය. එදවස අලිමංකඩ කඳවුර වෙත කඩාවැදුණු බුල්ඩෝසර් රථයක් පුපුරවා හරිමින් තම මිතුරු හටපිරිසේ ජීවත ගලවාගැනීම වෙනුවෙන් තම දිවි පරදුවට තැබූ එම අභීත විරුවා වූ කලී අන් කිසිවකු නොව 6 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් කෝප්‍රල් ගාමිණී කුලරත්නයි. ඉතිහාසයේ ප්‍රථම වරට "පරම වීර විභූෂණය" හිමිකරගත් සෙබළා වන්නේද ඔහුයි. 2025 ජූලි මස 14 වන දිනට එම සිදුවීමට 34 වසක් සපිරීම නිමිත්තෙන් "රණවිරුවා" හි මෙම පිටුව වෙන් කෙරෙනුයේ එම රණකාමී විරුවාට උපහාර පිණිසමය.



# රණවිරුවා







## රහස...

අලුත විවාහ වූ යුවලේ බිරිඳ තම සැමියා වැඩ ඇරී එනතුරු බලාසිටියේ දැඩි නොඉසිල්ලෙනි. සවස සැමියා පැමිණි විගස බිරිඳ ඔහු වෙත ගියාය.

**බිරිඳ** - මට තියෙනවා ඔයාට රහසක් කියන්න

**සැමියා** - ඒ මොකක්ද රත්තරං?



**බිරිඳ** - ඔන්න දෙන්නා තුන්දෙනා වෙන්නයි යන්නේ...

**සැමියා** - දෙයියනේ අපිටත් එහෙනම් දරු පැටියෙක්

**බිරිඳ** - පිස්සුද අනේ. මං කිව්වේ හෙට ඉඳලා අපේ අම්මා මෙහෙ නතර වෙන්න එනවා කියන එකයි.

## වැඩකට නැති පොත...

මුල් වතාවට පුස්තකාලයකින් පොතක් ලබාගෙන ගිය තරුණියක් පසුදා නැවත පුස්තකාලය වෙත පැමිණ මෙසේ පැමිණිල්ලක් කළාය.



කෝ මේ ඉංග්‍රීසි පොත කිසි වැඩක් නෑනේ. මුළු පොතේම තියෙන්නෙ මහ චරිත ගොඩකුයි, නොම්මර වගේකුයි විතරයිනේ.

ආ... අපි හොය හොයා හිටියෙ අපේ දුරකථන නාමාවලිය අරන් ගියේ කවුද කියලා...




### අධීක්ෂණය

බ්‍රිගේඩියර්
ඩබ්ලිව්එස් ගමගේ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී
පීඑස්සී







### උපදේශකත්වය

ලුතිනන් කර්නල්
එච්වීකේඩබ්ලිව් අබේවික්‍රම
යූඑස්පී අයිජී

### ප්‍රධාන සංස්කාරක

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ

### සහය සංස්කාරක

කපිතාන්
එච්පීජේ භවන්ති

### පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒච්එම් - 11 ඉසේරෙ

### ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

**ඊමේල්**
dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**
011 2993076

**යුහ දිගුව**
51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

### ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය




# ඔබේ නිර්මාණ අපට එවන්න

සමස්ත යුද්ධ හමුදාවම නියෝජනය කරන එකම සඟරාව වන "රණවිරුවා" වසර ගණනාවක පටන් අඛණ්ඩවම ඔබ අතට පත්කෙරේ. යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන විශේෂිත සිදුවීම් මෙන්ම ක්‍රීඩා, සාහිත්‍යය, අධ්‍යාපනික, විදෙස් හා ඉතිහාස තොරතුරු වඩා විචිත්‍රවත් ලෙස හා හරවත්ව එළිදක්වන රණවිරුවා ඔබගේ දැනුම හා රසාස්වාදය පිණිස මාහැඟි පිටිවහලක් වී ඇති බැවි අප වෙත නිරතුරුව ලැබෙන ලිපි හා ඇමතුම් මඟින් සනාථ වේ.

එහෙත් විවිධ අංශ අපව වෙත ලිපි සහ නිර්මාණ යොමුකළද යුද්ධ හමුදාවේ ඇතැම් ආයතන වෙතින් තොරතුරු ලැබෙනුයේ ඉතා අල්ප වශයෙනි. එනිසාම යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන බොහෝ ක්‍රියාකාරකම් පිළිබඳව සෙසු අය දැනුවත් නොවන තත්ත්වයක් පවතී. එබැවින් ඔබගේ ඒකකයේ, රෙජිමේන්තුවේ, බලසේනාවේ, පුහුණු පාසලේ හෝ කුමන ස්ථානයක වුවද සිදුවන විශේෂ වැදගත්කමින් යුත් තොරතුරු ඇත්නම් අපවෙත යොමු කරන්න. අප ඒවා අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. එසේම, රණවිරුවා යුද්ධ හමුදාවට පමණක් සීමා නොවන්නකි. බාහිර පාඨකයන්ගේ ලිපි, නිර්මාණ, ඡායාරූප හා කාලීන තොරතුරු වෙනුවෙන්ද එහි නිරතුරු ඉඩකඩ වෙන්කොට ඇති බව සතුටින් දැනුම් දෙන්නෙමු. මාසිකව නොමිලේ ඔබ අතට පත්වෙන රණවිරුවා සඟරාව මඟින් පාඨක ඔබගේ නිර්මාණශීලී හැකියාවන් වැඩිදියුණු කර ගනිමින් දැනුම හා තොරතුරු බෙදාහදා ගැනීමට එකතුවන්න.

– සංස්කාරක




# ඓතිහාසික කොකාවිල් සටනේ 35 සැමරුම

1990 ජූලි 11 - 2025 ජූලි 11

නොකා බත් කටක් දිය උගුරක් නැතිව
තකා උපන් බිම මරණය වුව පැතුව
කොකාවිල් කුලුන සේ ඉහළට මතුව
මකාලනු නොහැක ඇති මතකය සතුව

ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ

1990 ජූලි මස 11 වන දින කොකාවිල් කඳවුරට එල්ලවූ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් එහි සිටි 61 දෙනකු අතරින් 58 දෙනෙක් ජීවිතක්ෂයට පත්වූ අතර, තිදෙනෙක් පමණක් දිවි ගලවා ගැනීමට සමත්වූහ. කෑම බීම තබා බීමට දිය උගුරක් හෝ නොමැතිව පුරා දින 26ක් සතුරාට යටත් නොවී අඛණ්ඩව සිදුකළ එම සටනට නායකත්වය දුන් 2/ලුතිනන් සාලිය අලදෙණිය විරුවා පසුකාලීනව පරම වීර විභූෂණයෙන් ද පිදුම් ලැබීය. මෙවර රණවිරුවා පසුකවරය වෙන් කෙරෙණුයේ 35 වසකට පෙර එම ඓතිහාසික සටනට පණදුන් උත්තම විරුකැළට උපහාර පිණිසය.

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.